ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2023 පෙබරවාරි 08 වන බදාදා
3 කාණ්ඩය 10 කලාපය
මිල රු. 80 යි




විශේෂ අතිරේකයක් නොමිලේ



## නිදහස් උත්සවයකට මුලින්ම ජාතික ගීය ගායනා කළ කණ්ඩායමේ සිටි පුංචිම කෙල්ලට දැන් අවුරුදු 86ක්

## කකුල් තුනේ කනප්පුවෙන් ප්‍රසිද්ධ රගර් ක්‍රීඩක ටෝනි මාටින්ගේ ඝාතකයින් සොයාගත් හැටි

## මගේ මහත්තයා ජනප්‍රිය ක්‍රිකට් ක්‍රීඩකයෙක් කියලා දැනගත්තේ ලාහෝර් ප්‍රහාරය දවසෙයි

චාමර කපුගෙදරගේ බිරිඳ කියයි

**සන්තුෂි විජේකෝන්**

නිර්මාතෘ වයිල්ඩ් කලෙක්ශන් කුළුබඩු නිෂ්පාදන

ඡායාරූප
ක්‍රිෂාන් කාරියවසම්
හැඩගැන්වීම
අරුණී සිල්වා
(අරුණී බ්‍රයිඩ්ල් සැලෝන් ඇන්ඩ් ඇකඩමි, මාලබේ)



# ධරණී මුද්‍රණාලයේ සාමාන්‍යාධිකාරී තුෂාර තණවීර 'මාස්ටර් ප්‍රින්ටර්' සම්මානයෙන් පිදුම් ලබයි

ධරණී, සතිඅග අරුණ, දිනපතා අරුණ, The Sunday Morning, The Daily Morning, තමිලන්, කිරණ සහ තරුව යන පුවත්පත් මුද්‍රණය කරන ලිබර්ටි පබ්ලිශර්ස්හි මුද්‍රණාල අංශයේ සාමාන්‍යාධිකාරී තුෂාර තණවීර මහතා පසුගියදා (ජනවාරි 28) ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට 'මාස්ටර් ප්‍රින්ටර්' සම්මානයෙන් පිදුම් ලබන ලදී. 'මාස්ටර් ප්‍රින්ටර්' නාමයෙන් පිදුම් ලැබූ පළමු ශ්‍රී ලාංකිකයා ද ඔහුයි.

ලංකාවේ ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයක් වන ඉන්ග්‍රින් ඇකඩමියේ 17 වන වාර්ෂික ත්‍යාග ප්‍රධානෝත්සවයේදී ඒ මහතා මෙම නාමයෙන් පිදුම් ලැබූ අතර වසර 25කට ආසන්න සේවා පළපුරුද්ද සහ අධ්‍යාපන සුදුසුකම් සැලකිල්ලට ගනිමින් ජාත්‍යන්තර කවුන්සිලයක් විසින් මෙලෙස ඔහුව ඇගයීමට ලක්කර ඇත.

මුද්‍රණ තාක්ෂණය සහ කළමනාකරණ පිළිබඳව උසස් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීමට පෙර 1998දී ඔහු ඉන්ග්‍රින් ආයතනයට සම්බන්ධ වී ඇත්තේ මූලික ප්‍රින්ට් පාඨමාලාවක් හැදෑරීම සඳහායි. හයිටෙක් ඔෆ්ප්‍රින්ට් මුද්‍රණකරුවෙක් ලෙස 2009දී පාඨමාලාව සමත් වූ අතර, ශිෂ්‍යයන් 23 දෙනෙකුගෙන් එම පාඨමාලාව සම්පූර්ණ කර සමත් වූ එකම ශිෂ්‍යයා වන්නේද ඔහුයි.

තුෂාර තණවීර මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව සම්බන්ධ ශාස්ත්‍රීය උපාධියක් සහ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ලබා ඇති අතර ලිබර්ටි පබ්ලිශර්ස් ආයතනයේ මුද්‍රණාල ප්‍රධානියා ලෙස මෙන්ම ඉන්ග්‍රින් අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරයකු ලෙසත්, ප්‍රින්ටේජ් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ලෙසත් සේවය කරයි.

ඡායාරූපය- **ප්‍රදීප් දාඹරගේ**

# දමිළ ක්‍රමයට හැඩගැන්වූ මනාලියක්







අද අපි ඉදිරිපත් කරන්නේ දෙමළ විලාසිතාවකට අනුව හැඩගැන්වූ මනාලියක්. ඇයව හැඩගන්වා තිබෙන්නේ කලල්ගොඩ සැලෝන් ඩිල්ෂා රූපලාවණ්‍ය ආයතනයේ රූපලාවණ්‍ය ශිල්පිනී අමිතා දයාංගනී විසින්.

"මේ මනාලිය දමිළ ආකාරයට හැඩගන්වන්න තිරණය කළේ ඇයගේ මුහුණේ හැඩය නිසාමයි. සාරිය තෝරාගත්තේ සමේ පැහැයට ගැළපෙන ආකාරයට. කොළ පාට සහ රතු පාට මනාලියට ඉතා හොඳින් ගැළපෙනවා. මේ ඉන්දියානු මනිපූරි සාරියක්. ජැකට් එකේ කර තරමක් විවෘත වන ආකාරයට කපලා තියෙන්නේ ඇගේ හැඩය හොඳින් මතුවෙලා පෙනෙන්න.

මේකප් දානකොට ගෝල්ඩ් කලර් මේකප් එකක් භාවිතා කළේ සාරියේ හා ආභරණවල පැහැයත් රන්වන් පැහැය නිසා. එහෙම කළේ මනාලියව හොඳින් කැපිලා පේන්න.

හෙයා ස්ටයිල් එකෙන් මනාලියට ලොකු පෙනුමක් ලැබිලා තියෙනවා. ඇගේ මුහුණ දිගටි නිසා හෙයා ස්ටයිල් එක උසට දැම්මේ නැහැ. පිච්ච මල්වලින් පොඩි ඩ්‍රස් එකක් දාලා තියෙනවා.

දෙමළ මනාලියකට සාමාන්‍යයෙන් ආභරණ ගොඩක් භාවිතා කරනවා. නමුත් මම ඒ ක්‍රමය වෙනස් කළා. තැල්ල, කරමාලය වුණත් ඉතා කුඩා ඒවා තෝරාගත්තේ මනමාලියගේ මුහුණ කුඩා නිසා. ආභරණ ගොඩක් භාවිතා කරනවානම් මුහුණ මතු නොවී ආභරණ වැඩිපුර මතුවී පෙනෙන්න ඉඩ තියෙනවා.

මල් බොකේ එකෙත් විශේෂත්වයක් තියෙනවා. ඒ තමයි අපි නිතර දකින බොකේ එක වෙනුවට මල් වැලක් භාවිතා කිරීම. පිච්චවලින් කරපු මල්වැල නිසා මනාලියට ලොකු ආකර්ෂණයක් ලැබිලා තියෙනවා."

**සම්බන්ධීකරණය**
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**



හැඩගැන්වීම
**අමිතා දයාංගනී**
(සැලෝන් ඩිල්ෂා)



ඡායාරූප
**ක්‍රිෂාන් කාරියවසම්**

**75 වන නිදහස් දින සැමරුම නිමිත්තෙනි**

# මුල්මවරට නිදහස් උත්සවයකට ජාතික ගීය ගායනා කළ කණ්ඩායමේ හිටපු පුංචිම කෙල්ල මමයි

## 86 හැවිරිදි පද්මා තිරිමාන්න මහත්මිය



**'ජාතික ගීය ගයන්න කෝටි එකහමාරයි.'**

ඉහතින් උපුටා දක්වන ලද්දේ මෙයින් දින කිහිපයකට පෙර පුවත්පතක පළව තිබූ පුවතකි. මෙවර නිදහස් උළෙලේ ජාතික ගීය ගයන්නේ ඇමරිකානු ගායක ජස්ටින් බීබර්දැයි පුවත කියැවූ ඇතැමුන් ප්‍රශ්න කර තිබුණේ ඔහු ගැයීමට වැඩිම මිලක් අය කරනා ජාත්‍යන්තර ගායකයෙක් නිසා විය යුතුය. ජාතිය ගීය ගැයීමට වැයවනවා යැයි පවසන කෝටි ගාණක ඇස්තමේන්තුව ගැන අප දන්නේ නැත. එහෙත් ලංකාවේ ජාතික ගීය ගැන කතා කරනවිට නොලියාම බැරි අපූර්ව කතා කිහිපයක්ම ලිවීමට ඇත.

1948 පෙබරවාරි 4 ශ්‍රී ලංකාවට නිදහස හිමිවනතුරු ලක්වැසියෝ ගායනා කරන ලද්දේ 'God save the Queen' නම් බ්‍රිතාන්‍යයේ ජාතික ගීයයි. සුද්දන්ගේ බලකිරීමට එසේ කළද අපේ මව්බස නොවන බසකින් රචිත ජාතික ගීයකට ගරු කිරීමට සිංහලයේ වැඩිදෙනෙකුට කැමත්තක් තිබුණේ නැත.

1948 දී දේශපාලන නිදහස ලබනවිට පිළිගත් ස්වදේශික ජාතික ගීයක් අපිට නොතිබිණි. ඒ නිසා පළමු නිදහස් උත්සවයට ගායනා කිරීමට ගීතයක් අවශ්‍ය බව පළමු අග්‍රාමාත්‍ය ඩී.එස්.සේනානායක මහතා තම ඇමති මණ්ඩලයට දැන්වීය. ජාතික ගීතයට සුදුසු ගීත රචනා එවන ලෙස ජනතාවගෙන් ඉල්ලීම් කෙරුණේ ඇමති මණ්ඩලයේ තීරණයකට අනුවය. තරඟය සඳහා ගීත රචනා රාශියක් ලැබුණු අතර ඒ අතරින් තෝරාගනු ලැබුවේ පී.බී.ඉලංගසිංහ නොතාරිස් රාළහාමි ලියූ, විශාරද ලයනල් එදිරිසිංහ සංගීතවත් කළ 'ශ්‍රී ලංකා මාතා... පාලා යස මහිමා ජය... ජය' ගීතයයි. 1948 පෙබරවාරි 4 දා ප්‍රථම නිදහස් උත්සවය නිමිත්තෙන් මේ ගීතය ශ්‍රී ලංකා ගුවන් විදුලියෙන් ප්‍රචාරය විය.

ප්‍රචාරය වී දින කිහිපයක් යන්නටත් මත්තෙන් ගීතය ජනතාවගේ දෝෂදර්ශනයට ලක්වන්නට විය. ගීතයේ වචන බරසාර වැඩියැයි ඇතැමුන් පවසන්නට විය. ගීයේ ගණ පිහිටීම් සම්බන්ධ ගැටලු තිබෙන බවටද උපකල්පන තිබිණි.

ආනන්ද සමරකෝන් එවකට ගාල්ල මහින්ද පාසලේ ගුරුවරයෙකි, ග්‍රැමෆෝන් ගායකයෙකි. මහින්ද සිසුන්ගේ ජාත්‍යාලය වැඩීම පිණිස ඔහු නිර්මාණය කළ 'නමෝ... නමෝ... නමෝ... මාතා' ග්‍රැමෆෝන් ගීතය ඒ වනවිටත් ලාංකිය ජනසමාජයේ දෙසවනට තරමක් හුරුව තිබිණි.

පී.බී.ඉලංගසිංහ මහතාගේ ජාතික ගීයට එල්ලවන විරෝධතා වැඩිවත්ම ආනන්ද සමරකෝන් මහතාගේ ජාතිකාභිමානී ගීතය ශ්‍රී ලංකාවේ ජාතිය ගීය විය යුතු බව ඇමති මණ්ඩලයේ තීරණය විය. ඒ වකවානුවේ මුදල් අමාත්‍යව සිටි ජේ.ආර්.ජයවර්ධන මහතා ජාතික ගීය ලෙස **'නමෝ නමෝ නමෝ මාතා'** තෝරාගත් බව කැබිනට් ලිපියක් ලියමින් කියාසිටියේ 1950 වසරේ අප්‍රේල් මාසයේදීය. ඒ අනුව 1952 මාර්තු 12 වැනිදා සිට ආනන්ද සමරකෝන් මහතාගේ ගීතය ලංකාවේ ජාතික ගීය බව නිල වශයෙන් දැනුම් දෙනු ලැබීය.

කරුණු එසේ වුවත් ආනන්ද සමරකෝන් මහතාගේ **'නමෝ නමෝ නමෝ මාතා'** ගීතය ප්‍රථම වරට ගායනා කෙරුණේ 1949 පෙබරවාරි 4 දින නිදහසට සමගාමීව ටොරින්ටන් චතුරස්‍රයේ පැවති උත්සවයකදීය.

**"මට ඒ කාලේ ගැන ලොකු මතකයක් නැතත් එදා කටයුතු වෙච්චි විදිය ගැන මතකයි. ටොරින්ටන් චතුරස්‍රයේ ස්වාධීන අනුස්මරණ ගොඩනැගිල්ල ආරම්භය වෙනුවෙන් තමයි එදා ජාතික ගීය මුල්ම වරට ගායනා කළේ."**




ආනන්ද සමරකෝන් මහතා

**එදා අපිට ගායනා කරන්න සංගීතය සැපයුවේ ආනන්ද සමරකෝන් මහත්මයා. එතුමා හරිම කරුණික බව මතකයි. ජාතික ගීය ගයන්න තිබුණේ උත්සවය ආරම්භයේදීමයි. ඉතින් රට ගැන ලොකු ගෞරවයක් වගේ දෙයක් ඇඟට දැනුණා**

ඒ එදා ප්‍රථම වරට ජාතික ගීය ගායනා කළ කණ්ඩායමේ සාමාජිකාවක්ව සිටි මේ වනවිට 86 හැවිරිදි වියේ පසුවන පද්මා තිරිමාන්න මහත්මියයි. 75 වන නිදහස් සැමරුම අල්ලපනල්ලේ ජාතික ගීය ගැනත් ලංකාවේ දෙවන නිදහස් සමරුව ගැනත් ඇය සමඟ ටිකක් කතා කරන්නට අපට ඉඩහර පෑදිනි.

**"නිදහසට කලින් ලංකාවේ තිබුණේ පල්ලි මුල් කරගත්තු මිෂනාරී පාසල් ක්‍රමයක්. 1948 නිදහසට කලින් ඉඳලාම ඒ ක්‍රමේ බිඳින්න ඕල්කට්තුමා, මහින්ද හාමුදුරුවෝ, හික්කඩුවේ ශ්‍රී සුමංගල හාමුදුරුවෝ වගේ වියත්තු මැදිහත් වුණා.**



INDEPENDENCE COMMEMORATION

February 4, 1949

NATIONAL SONGS

In Sinhalese and Tamil to be sung on the occasion of the Inauguration of the Independence Memorial Building at Torrington Square

නිදහස් දින සිහිවීමේ උත්සවය

පෙබරවාරි 4, 1949

ජාතික ගී

சுதந்திர ஞாபகார்த்தம்—பிப்ரவரி 4, 1949

**නිදහසත් එක්ක බෞද්ධ පාසල්වලට හොඳ තැනක් ලැබුණා. මම මුලින් ඉගෙනගත්තේ වෙදමුල්ල මහා විද්‍යාලයෙන්. පස්සේ ශිෂ්‍යත්ව විභාගේ පාස් කරලා කොළඹ මියුසියස් බෞද්ධ පාසලට ඇතුළත් වුණා. ජාතික ගීය ප්‍රථම වතාවට කියන්න මාව තෝරගත්තේ ඉස්කෝලෙට ගියපු මුල්ම කාලෙදිමයි. එතකොට මට අවුරුදු 11යි. මම තමයි එතැන හිටපු කුඩාම ළමයා. ගීතය ගායනා කරන්න කලින් කීපසැරයක්ම අපිට පුහුණු කරන්න ආනන්ද සමරකෝන් මහත්මයා වගේම අමරදේව මාස්ටරුත් ආවා.**

**පෙබරවාරි 4 උත්සවේ දවසේ අපි ඇන්දේ පාසලේ නිල ඇඳුම. උත්සවේ පටන්ගන්න කලින් ග්ලොස්ටර් ආදිපාදවරයා සහ එම මැතිනිය ජනතාවට අත වන වනා නිදහස් චතුරස්‍රයට ආවා. ඩී.එස්.සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක, ඔලිවර් ගුණතිලක වගේ දේශපාලන නායකයෝ උත්සවේට ඇවිල්ලා හිටියා. එදා එතැන විශාල ජනකායක් හිටියා. එදා අපිට ගායනා කරන්න සංගීතය සැපයුවේ ආනන්ද සමරකෝන් මහත්මයා. එතුමා හරිම කරුණික බව මතකයි. ජාතික ගීය ගයන්න තිබුණේ උත්සවය ආරම්භයේදීමයි. ඉතින් රට ගැන ලොකු ගෞරවයක් වගේ දෙයක් ඇඟට දැනුණා. එදා ඉඳලා අද දක්වාම ජාතික ගීය ඇසෙන වාරයක් පාසා අත් දෙක පහලට දලා සීරුවෙන් හිටගන්න එක ඉබේටම වගේ සිද්ධවෙන දෙයක්."**

එදා ඒ ඓතිහාසික සිදුවීමේ ඡායාරූප නිදහස් චතුරස්‍ර කෞතුකාගාරයෙන් අදටත් දැකගත හැකිය.

ජාතික ගීය ලෙස තෝරාගත් 'නමෝ නමෝ නමෝ මාතා' ගීතයේ මාත්‍රා සහ ගණ සම්බන්ධ ගැටලු තිබෙන බව මුලින්ම කරළියට ගෙන ආවේ සංගීතඥ වින්ස්ටන් සෝමපාල සහ ලයනල් එදිරිසිංහ යන මහත්වරුන්ය.

මාත්‍රා සහ ගණ ගැටලුව නිසා ආරම්භක පදය 'නමෝ... නමෝ... නමෝ... මාතා' වෙනුවට 'ශ්‍රී ලංකා මාතා' යනුවෙන් සංශෝධනය කිරීමට රජය පසුකලෙක කටයුතු කළේය.

සංශෝධනය ගැන ඇසූ ආනන්ද සමරකෝන් මහතා නිදි පෙති පානයෙන් දිවිතොර කරගත්තේ තමන්ට නොදන්වා තම නිර්මාණය සංශෝධනය කිරීම ගැන ඇති වූ බලවත් චිත්ත පීඩනය නිසාය. රටේ ජාතික ගීය නිර්මාණය වෙනුවෙන් ගෞරවයක් නොලැබීමේ සිත් වේදනාවෙන් මියගිය මිනිසකු වාර්තාවන එකම රට ලංකාව බව අදටත් ඇතැමුන් සරදමට මෙන් කියනු ඇසෙයි.

■ **සෙව්වන්දි හෙට්ටිආරච්චි**



අත්තනායක
එම්. හේරත්



# වෙවාරණ විච්චූරණ කරන දූලට

# කතා හදන්න ඉක්මන් වෙන්න එපා

රත්තරන් දුවේ

අද කතාව පටන්ගන්න කලින් මේ ගැනත් විශේෂයෙන් සඳහන් කරන්න ඕන කියලා මම හිතුවා. 'ධරණී' ට මා ලියන්නේ දියණිවරුන් පිළිබඳ ලිපි පෙළක්. මොකද 'ධරණී' මගෙන් ඉල්ලීමක් කළේ විශේෂයෙන් දූලා ගැන ලියන්න කියලා. මේ දිනවල මම මගේ ජීවිත කතාව 'නමුණුකුළෙන් හන්තානට' කියලා ලියලා ඉවරයි. අන්න ඒ පොත පිටවුණාම, මා මෙහි නොකියන මගේ ශිෂ්‍ය පුත්‍රරත්නයන් ගැන ඔබට දැනගන්න පුළුවන්. මං එහෙම ලිව්වේ හේතුවක් ඇතුවයි. මේ ළඟදි කොළඹ සරසවියේ පුතෙක් තම පෙම්වතිය මරා දැම්මම මුහුණුපොතේ කවුදෝ දාලා තිබුණා ඕකට වග කියන්න ඕන අත්තනායක එම් හේරත් වගේ අය. මොකද උන්දැලා පිරිමින්ගේ ගුණ ගැන නොකියා 'දූලා'ම අගය කරන නිසාය මෙහෙම වෙන්නේ කියලා. ඒ විවේචනය මගේ යටි සිතට තදින්ම කාවැදුණා. නමුත් 'ධරණී' කාන්තා පුවත්පතක් නිසා මට මේ තීරුව තුළ කතාකිරීමේ හැකියාව ලැබෙන්නේ දුවලා ගැන විතරයි. ඒ නිසා පුතාලා මාත් එක්ක ඒ ගැන අමනාප වෙන්න එපා කියලත් මතක් කරන්න ඕන.

දැන් අපි කතාවට එමු. පොල්ගහමුල නමින් බාහිර උපාධි ආයතනයක් තිබුණා. 1980 ඉඳලා උපාධිධාරීහු පහළොස් දහසක් පමණ එයින් බිහිවුණා. මම තමයි ඒ ආයතනයේ සිංහල උගන්වපු ගුරුවරයා. ඉතින් මං පංතියේ උගන්වද්දි විෂය නිර්දේශයට පටහැනි බාහිර පොත්පත් ගැනත් කියලා දෙනවා. දවසක් මං කියලා දුන්නා ජපන් ජාතික ටෙට්සුකෝ කුරෝයානගි ලියපු 'ටොට්ටෝ චං' කියන ළමා කතාපොත. ඒ පොතේ හිටියේ අකීකරු, දඩබ්බර, දඟකාර දුවෙක්. ඒ දුව කොච්චර පංතිභාර ගුරුතුමාට කරදරයක් වුණාද කියනවානම් මේ දුවව පංතියෙන් එළවලා දැම්මා. දැන් අම්මට ඉස්කෝලයක් නැහැ දුවව දාන්න. ඔන්න ඔහොම දුව දාන්න ඉස්කෝලයක් හොයනකොට 'හරි පුදුම ඉස්කෝලේ' කියලා ඉස්කෝලයක් ගැන අම්මට ආරංචියක් ලැබෙනවා. ඉතින් අම්මා හරි පුදුම ඉස්කෝලෙට දුවත් අරගෙන යනවා. ඒකෙ විදුහල්පතිතුමා කොබයාසි ගුරුතුමා. එතුමා අම්මව පැත්තක තියලා මේ දුවගේ බුද්ධිය මනින්න සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා. සර් දුවගෙන් අහනවා උදේට කෑවේ මොනවද, ඊයෙ හවස මොනවද කෑවේ, අම්මගෙ තොරතුරු, තාත්තගෙ තොරතුරු. එක ප්‍රශ්නයක් ඇහුවම දුව එකදිගටම කතා කරනවා. ගුරුතුමා ඇයට කතා කරන්න ඉඩ දුන්නා. ඊටපස්සේ ගුරුතුමා අම්මට කතා කරලා කිව්වා දුවගේ මතක ශක්තිය හොඳයි, මං දුවව භාරගන්නවා කියලා. දුවගේ පෙනුම, දඟකාර හුරතල් ගතිය ගුරුතුමා ගණනකට ගත්තෙ නැහැ. වෙන ඉස්කෝලවලින් එළෙව්වනේ මෙලෝ දෙයක් මතක නැහැ කියලා. "අම්මේ මං මතක මැන්නෙ ඒ ක්‍රමයට නෙවෙයි. මං ඇහුවා උදේ කෑව දේ, ඊයෙ කෑව දේ, අම්මගෙ හැටි, තාත්තගෙ හැටි. ඉතින් ඒ මතක හොඳටම ඇති. හෙටම දුවව ගේන්න." ඉතින් එදා දුවට එළිවෙනකල් ඉවසිල්ලක් නැහැ පුදුම ඉස්කෝලෙට යන්න. ගුරුතුමා එයාව අගය කළානෙ. මෙච්චරකල් කවුරුවත් මේ දුවව අගය කරලා නැහැ. ඒ තමයි ඇයව පිට කෙනෙක් අගය කරපු දවස.

අද නම් ළමයි ඉස්කෝලෙ යන්නෙ කැමැත්තෙන් නෙවෙයිනෙ. ඉස්කෝලෙන් අස්වුණාම ඉස්කෝලෙට ආදරේ කළාට ඉස්කෝලෙ යන කාලේ හිතන්නෙම නිවාඩු ගැන. ඉතින් ඔය පුදුම ඉස්කෝලේ කතාවෙන් දූලට මං අද කියන්නෙ ඔච්චරයි. හැබැයි මගේ උපාධි ළමයින්ට මං මේ කතාව සම්පූර්ණ කියලා කාට කාටත් කිව්වා කිසිම කෙනෙක්ගේ බාහිර පෙනුමෙන් ඒ අය මනින්න එපා, පිට පෙනුමයි ඇතුළත හැසිරීමයි දෙකම සමාන නැහැ කියලා. ඊටපස්සේ එඩ්වඩ් ජයකොඩි නතාෂා පෙරේරා සමඟ ගැයූ 'සුළඟක් වී මං යනවා දුර අහසේ ඇවිදින්නට' ගීතයත් මං කියලා දුන්නා මගේ දරුවන්ට.

දුවකගේ දඟ වැඩිවෙන්නේ අප්පච්චි දැක්කමනේ. මේ ගීතයේ දුව කරන හැම දබ්බර දේකටම අප්පච්චිට යකා වැහෙන්නේ නැහැ. දුව ගස්වැල් උදුරා පොළොවට දානවිට අප්පච්චි කිව්වේ එයා මහ මුහුදක් වෙලා දූ එනකල් බලන් ඉන්නවා කියලා. දුව අහසේ ඇවිදිනකොට අප්පච්චි කිව්වේ අහසක් සේ පුළුන් වළා අතුරලා දුවව රකිනවා කියලා. දුව බොරුවට අඬනකොට අප්පච්චි කියනවා මම දූටත් හඬා හයියෙන් අඬනවා කියලා. ඉතින් ගද්‍යයෙන්, පද්‍යයෙන් මේක මම කිව්වේ එක කාරණයක් මුල්කරගෙන.

මගේ පංතියේ ඉන්නවා ටිකක් අමුතු දුවෙක්. එයා එක දවසක දිග ගවුමක් අඳිනවා. තව දවසක ටිකක් කොටට අඳිනවා. කරත්ත රෝද වගේ ලොකු කරාබු දානවා. ඉතින් ඇගේ මේ දඟකාර හැසිරීමට දුවලා විතරක් නෙවෙයි පුතාලත් කැමති නැහැ. මේ ඔක්කොම එකතුවෙලා ඇයව පැත්තකට කරලයි තිබුණේ.

ළමයි කොහොම බැලුවත් අර දුවගේ මෝස්තර එයා දවස ගානේ වෙනස් කරා. ළමයින්ගේ නුරුස්සනා බැල්ම එයා ගණන් ගත්තේ නැහැ.

ඔහොම ඉන්නකොට එක දවසක් වර්ෂාවක ලකුණු පහල වුණා. මම පංතිය වෙනදාට වඩා වේලාසන ඇරියා. ළමයි නුවර පැත්තට යන බස් එනකල් බස් නැවතුම ළඟ බලන් ඉන්නවා. උඩ පැත්තට වැහැලා පාරත් කාණුත් වතුරෙන් පිරෙනවා. මෙන්න මේ වෙලාවේ බලු පැටියෙක් කාණුවට වැටුණා. ඒ කාණුව ටිකක් විශාල කාණුවක්. ඒ බල්ලා බේරගන්නනම් කවුරු හරි ඒ කාණුවට බහින්නම ඕන. පිරිමි ළමයි අහක බලාගත්තා. ගෑනු ළමයි බස් එක එනකල් බලාගෙන හිටියා. දැන් කාණුව ටික ටික වතුරෙන් පිරෙනවා. අර මගේ මෝස්තරකාර දුවත් අර දූලා පුතාලා ගොඩේ හිටියා. ඇය කුඩේ යාළුවෙකුට දීලා අර විශාල කාණුවට පැන්නා. පැන්න ගමන් බලු පැටියව එක අතකින් උස්සගෙන උඩ ඉන්න අයට අත දික්කරා. කොල්ලො ටික පොර කකා අර දුවව ගොඩට ගත්තා. ඊට පසුදා මම පංතියට ගියාම අර දුවගේ වීර ක්‍රියාව මට වාර්තා කළේ දුවලා නෙවෙයි, පුත්තු. එදා මං මේ කතාව සිද්ධවෙච්ච විදියටම අනෙක් ළමයින්ට පැහැදිලි කරා. මට හරිම සතුටුයි මුළු පංතියම නැගිටලා අර දුවට අත්පොළොසන් දුන්නා. අනේ අර දුව මේසයට ඔලුව තියාගෙන ඇඬුවා එයාගේ සහෝදර සහෝදරියන්ගේ අගය කිරීමට. ඒ බලු පැටියා ඒ දුවලා උපාධිය අරගෙන ගියාට පස්සේත් අපේ පංතිය අසළම හිටියා. ළමයි අර මගේ මෝස්තරකාර පැංචිට වගේම බලු පැටවාටත් ගරු කරා. එදා ඉඳලා ඒ දුව දිහා හැමෝම ගෞරවයෙන් බලන්න පුරුදු වුණා. අද මේ දුව ගුරුවරියක වෙලා තවත් දරු කැලකට නුවණ දෙනවා.

ඒ නිසා මට කියන්න ඕනෑ වුණේ බාහිර අලංකාර, විලාසිතා කරන දූලා වගේම පුතාලත් ඉන්නවා. ඒ අයට සක්කරවට්ටම, රස්තියාදුකාරයා කියන ලේබලේ නොගහා ඒ අලංකාරය විඳින්න. මොකද ඔබට පේන බාහිර අරුමෝසම්වලට වඩා නොපෙනෙන ඒ ගොල්ලොන්ගේ අභ්‍යන්තරය හරියට බෙල්ලෙකු ඇතුළෙ තියෙන මුතු වගේ අලංකාර වෙන්න පුළුවන්.

අත්තනායක එම්. හේරත්

ඒ දුවලා උපාධිය අරගෙන ගියාට පස්සේත් අර බලු පැටියා අපේ පංතිය අසළම හිටියා. ළමයි අර මගේ මෝස්තරකාර පැංචිට වගේම බලු පැටවාටත් ගරු කරා. එදා ඉඳලා ඒ දුව දිහා හැමෝම ගෞරවයෙන් බලන්න පුරුදු වුණා. අද මේ දුව ගුරුවරියක වෙලා තවත් දරු කැලකට නුවණ දෙනවා


Fresh & White
Beauty Cream
New!
The Only Cream that gives
COMPLETE FAIRNESS
• Visibly Fairer Skin
• Dark Spot Reduction
• Oil-Free Look
Extracted from
Pure Avacado, Natural Honey
Multi-Vitamins, Whitening Agents
A PRODUCT OF
LIFE COSMETICS
මෙය හඳුන්වාදීමක් පමණි
info@freshandwhite.com
www.freshandwhite.com

# ඔව්, අපි බත් කන හරක්!

"බත් ගොඩක් කෑවොත් ඉක්මනට ලොකු වෙනවා. ඒ නිසා හොඳ පුතා වගේ බත් සේරම කන්න."

බත් ගොඩාරියක් කෑවහම හොඳයි කියන එක පුංචි කාලෙදිම දුප්පත් රටවල ජීවත්වෙන අපේ ඔලුවලට වැටෙන්නේ ඔන්න ඔහොමයි. ඒ කතාව මුලින්ම කිව්වේ අම්මා නිසා අහිතක් නැතුව අපිත් බත් ගොඩක් කෑවට බත් කන ගානට ලොකු වුණේ අපේ බඩවල් විතරයි. හැබැයි පුංචි කාලෙ ඔහොම කතා ඇහුවට ඕනවට වඩා බත් කෑවහම විපැත්තියක් මිසක සෙතක් වෙන බවක් ලොකු වුණාමනම් අපි අහලා නැහැ. ඒ නිසා අද අපි බත් ගැන කතා කරන්න හිතුවා. බත් වෙනුවට කන්න පුළුවන් කෑම ගැනත් කතා කරමු.

බත් ගැන කියද්දි බෞද්ධ කතාවක් මතක් වුණා. කොසොල් රජතුමා ගැන අහලා තියෙනවා නේද? එතුමා බුද්ධ කාලේ ජීවත්වුණු දනට පිනට ලැදි බොහොම ධාර්මික රජෙක්. හැබැයි මේ රජතුමා බත් කන්න බොහොම කෑදරයි. එක වේලකට බතට සෑහෙන ව්‍යාංජනත් එක්ක සහල් නැළි දහසයක බත් කන්න මේ රජා පුරුදුවෙලා හිටියා.

ඔන්න දවසක් දවල් බත් කාලා වැටිලා ඉන්න වෙලාවක මාලිගාව ළඟ ආරාමයකට බුදුන් වැඩිය බව රජතුමාට අහන්න ලැබුණා. බුදුන් දකින්න තිබුණු ආශාව නිසා කොසොල් රජතුමා බත් මතින්ම බුදුන් ඉදිරිපිටට ගිහින් අමාරුවට එහෙ මෙහෙ ඇඹරෙමින් හිටියා.

"මහරජ, බත්මත තිබියදීම ආවද?"

"එසේය ස්වාමිනී. කෑම ගත් වෙලෙහි පටන් මට මහා දුකක් නොවැ."

ප්‍රශ්නය තේරුම්ගත්තු බුදුහාමුදුරුවෝ කොසොල් රජතුමාට මෙහෙම දේශනා කළා.

"මිද්ධී යදා හොති මහග්ඝසො ච

නිද්දායිතා සම්පරිවත්තසායි,

මහාවරාහොව නිවාපපුට්ඨො

පුනප්පුනං ගබ්භමුපෙති මන්දෙති.

යමෙක් බඩ පමණ ඉක්මවා බත් බුදින්නේද, ඉන්පසු පෙරැළි පෙරැළී වැදහොන්නේද ඒ අඥාණ තෙම නැවත නැවතත් මව්කුසට පැමිණෙන්නේය. හැම කල්හි සිහි ඇති බොජුනෙහි පමණ දත් මිනිසා බතින් හටගන්නා වේදනා නොවිඳියි. වැළඳූ බොජුන්ද ආයුෂ රැක දෙමින් වහා දිරන්නේය."

බුද්ධ දේශනාවෙන් කරුණු තේරුම්ගත්තු රජතුමා සහල් නැළි දහසය එක නැළියකට අඩු කරලා සැහැල්ලුවෙන් ජීවත් වුණාලු.

උදේට රජෙක් වගේ කන්න ඕනේ, දවල්ට සාමාන්‍ය මිනිහෙක් වගේ, එතකොට රෑට හිඟන්නෙක් වගේ කන්න ඕන කියලා කතාවකුත් අපේ මිනිස්සු කියනවා අහලා ඇති. රජෙක් වගේ කන්න කිව්වහම ගොඩක් උදවිය හිතන්නේ වෙහෙරක් වගේ බත් පිඟානක් බෙදාගෙන කන එක රජකෑමක් කියලයි. හැබැයි ඉස්සර අපේ රටේ ජීවත්වෙච්චි රජවරු බත් අඩුවෙන් කාලා ශක්තිය වඩවන ගුණ කෑමලු වැඩිපුර කෑවේ. දෙවන රාජසිංහ රජ්ජුරුවෝ දවසටම කෑවේ එක බත් හැන්දයි කියලයි රොබට් නොක්ස් 'එදා හෙළදිව' පොතේ ලියලා තියෙනවා. එහෙම බැලුවහම රජෙක් වගේ කනවා කියන්නෙ බත් අඩුවෙන් කාලා එළවලු, මාළු, පලා වැඩිපුර කන එකටයි.

සහල් කියන්නේ තණකොළ (Poaceae) පවුලට අයත් ශාකයක්. කවුරුහරි මෝඩ වැඩක් කළාම එක්කෝ අපි විහිලුවට වගේ අහනවා "තණකොළද කන්නේ?" කියලා. ඒකෙන් අපි නොකියා කියන්න උත්සාහ කරනවා ඒ මෝඩ වැඩේ කරපු මනුස්සයා හරකෙක් කියලා. හැබැයි ඉතින් ඇත්තටම අපි හැමෝම කන්නේ තණකොළ වර්ගයක් තමයි. ඒක නොදැන ආයේ කාටවත් එහෙම කියන්න යන්නත් එපා.

ජපානේ වසේදා විශ්වවිද්‍යාලය කාලෙකට ඉහතදී බත් ගැන පරීක්ෂණයක් කළා. යුරෝපීය රටවල උදවියට වඩා ආසියානු රටවල අය බත් කනවා වැඩියිලු. මනුස්සයෙක් දවසකට කන්න ඕනේ බත් 50gයි. හැබැයි ආසියානු රටවල මිනිස්සු දවසකට බත් 500gකට වඩා කනවා කියන එකයි ඔවුන් කිව්වේ.



**රජෙක් වගේ කනවා කියන්නේ කොතක් වගේ බත් ගිලින එකටනම් නෙවෙයි. අපේ රටේ රජකම් කරපු දෙවන රාජසිංහ රජ්ජුරුවොත් දවසටම කෑවේ එක බත් හැන්දයි කියලා රොබට් නොක්ස් 'එදා හෙළදිව' පොතේ ලියලා තියෙනවා**



ලෝකේ දුප්පත් රටවල මිනිස්සු කන්නේ බත්. මේ යන විදියත් එක්ක බත් නොකා ප්‍රෝටීන කන්න කියලා අපිට කියන්න බැහැ. හැබැයි පෝෂණීය විදියට බත් කන්නේ කොහොමද කියලයි අපි කියන්නේ.

අපි කාබෝහයිඩ්‍රේට ආහාරයක් ගත්තහම ඒක කොයිතරම් ඉක්මනට සීනි බවට පත්වෙනවද, ආහාර නිසා ග්ලූකෝස් මට්ටම කොච්චර ඉහළ යනවද කියලා මනින්න ග්ලයිසිමික් (GI) කියලා දර්ශකයක් තියෙනවා. කෑමක GI අගය 70ට වැඩි නම් දියවැඩියාව, හෘද රෝග වගේම ඇඟේ හැඩ නැතිවෙන්න තියෙන ඉඩත් වැඩියි. අගය 55-69 අතර නම් මධ්‍යම තත්ත්වයක්. අගය 55ට අඩුයි නම් ඒ ආහාර ඇඟට හොඳයි.

GI අගය වැඩි කෑම කනකොට ඒ කෑමවල තියෙන සීනි ඉක්මනින්ම ජීර්ණය වෙලා අපේ ඇඟේ මේදය විදියට තැම්පත් වෙනවා. ඉක්මනින්ම ජීර්ණය වෙන නිසා නැවත නැවතත් බඩගිනි හැදෙනවා. GI අගය අඩු ආහාරවල වෙන්නේ මේකේ අනිත් පැත්ත.

සහල්වලටත් මේ GI අගය බලපානවා. අපි කන සුදු සහල් බහුතරේක ග්ලයිසිමික් අගය 70ට වැඩියි. ඒ නිසා සුදු බත් දිගටම කන කෙනෙක්ට දියවැඩියාව, හෘදයාබාධ සහ ස්ථූලතාවය ඇතිවෙන්න තියෙන අවධානම වැඩියි. දැන් සුදු හාල් ජාති බහුතරයක් පොලිෂ් කරලනේ එන්නේ. සහල් නිවුඩ්ඩේ තිබුණ විටමින්, තන්තු, ඛනිජ ලවණ සේරම ඉවත්වෙලා නිසා කාබෝහයිඩ්‍රේට් ඇර වෙනත් දෙයක් සුදු හාල්වල නැහැ.

රතු සහල්වල නිවුඩ්ඩ ඉවත් කරන්නේ නැති නිසා තන්තු, විටමින්, ඛනිජ ලවණ තියෙනවා. ඒ වගේම රතු සහල්වල GI අගය තියෙන්නේ 55-69ත් අතර. හැබැයි පොඩි ප්‍රශ්නයක් තියෙනවා. රතු හාල්වල පොත්තේ 'ෆයිටික්' කියලා සංඝටකයක් තියෙනවා. යකඩ, කැල්සියම්, සින්ක් වගේ දේවල් ඇඟට උරාගන්න එක අඩු කරන්න මෙන්න මේකට පුළුවන්.

ඉතින් රතු හාලුයි, සුදු හාලුයි මාරුවෙන් මාරුවට කන්න. ඇඟපත වෙහෙසලා බර වැඩ කරන කෙනෙක් නෙමෙයි නම් පුළුවන් තරම් කන බත් ප්‍රමාණය අඩු කරන්න. කෑම පිඟානෙන් 1/4ක් බත් දාගෙන පලා කොළ ටිකක්, එළවලු ටිකක් වැඩිපුර කන්න. දැන් හාල් ගන්නත් ලොකු ගාණක් යන නිසා එළවලු, පලා කන එක ලාබයි මයේ හිතේ.

සහල් ඇටය ගොඩක් කොටයි කියන්නේ ඒ සහල පෝෂණයක් නෑ කියන එක. සහල් ඇටය දිග වෙන තරමට පෝෂණය වැඩියි. හැබැයි ඒ සහල් වර්ග මිලෙනුත් වැඩියි. පුළුවන් නම් තම්බපු සහල් වර්ග කන්න. තම්බපු සහල් අඩු මුදලට ගන්න පුළුවන්. සුදු සහල්වලට වඩා තම්බපු හාල් හොඳයි කියලයි පෝෂණවේදියෝ කියන්නේ.

උදේට දවල්ට දෙකටම බත් කෑවනම් රෑට බත් වෙනුවට වෙන දෙයක් කන්න. දවල්ට වුණත් බත් වෙනුවට මුංඇට, කව්පි, කඩල, කොස්, කිතුල් පිටි, කුරක්කන් පිටි, ආටා පිටි, එළවලු, පලතුරු, සෝයා, බාර්ලි, රැලං, කුස් කුස් වගේ දේවල් කන්න. ඒවගේ ග්ලයිසිමික් අගය අඩුයි වගේම ඇඟට අවශ්‍ය ශක්ති ප්‍රමාණය ලබාගන්නත් පුළුවන්.


මඩතවාළු, ඇල් වී, කුරුළු තුඩ, සුවඳැල්, මා වී, රත්දැල්, පච්චපෙරුමාල් වගේ දේශීය සහල්වලත් ග්ලයිසිමික් අගය මධ්‍යස්ථයි. හැබැයි ඉතින් ඔය මොන හාලෙන් බත් කෑවත් සොළොස් හැලියක් නොකා එක හැන්දක් කන්න කියන එකයි විශේෂයෙන්ම කියන්න ඕනේ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි


දැන්වීමයි

# මැහුම් එපා කියූ මැහුම් ශිල්පිනිය හා ශල්‍යකර්මයකට නිර්දේශවූ දකුණු ලකේ ගුරුවරිය මහා බ්‍රිතාන්‍යයේ විශ්මිත ප්‍රතිකාර වලින් සුවය ලබයි.

## අධ්‍යාපනයෙන්, ක්‍රීඩාවෙන් අභියෝග ජයගෙන ජය ටැඹ කරා පියවර තබන්නට මඟ කියාදෙන ගුරු දෙව්වරුන්ගේ රෝග බිය දුරුකරණ ඔස්ටියෝපති ප්‍රතිකාර.




Pain from sciatica radiates from the buttock down the leg and can travel as for as the feet and toes




**මේ වන විට ජනමාධ්‍යයන් ඔස්සේ ඔබ ඔස්ටියෝපති ප්‍රතිකාර ගැන මනා අවබෝධයක් ඇති කර ගෙන ඇතැයි අපි විශ්වාස කරමු. ලාංකික ඔබට නවමු අත්දැකීමක් වූ එකම වෛද්‍ය මධ්‍යස්ථානය වන ඔස්ටියෝපති රෝහල මඟින් සිදු කරන මෙම ප්‍රතිකාර අස්ථි රෝගාබාධ, කොඳුඇට පෙළ ආශ්‍රිත හා ස්නායු රෝගවලින් ශල්‍යකර්මවලට නිර්දේශ වූ රෝගීන්ගේද ශාරීරික, මානසික, සමාජීය, ආධ්‍යාත්මික, ආර්ථික යන පංචවිධ ආකාරයකට සුව සහනය ලබාදෙනුයේ ශල්‍යකර්මයන්ට වැයවන අධික මුදල්, කාලයද ඔවුනට ඉතිරි කර දෙමිනි. මෙමඟින් ලැබෙන සුව සහනය මානසික තෘප්තිය කෙලෙස දැයි එවැනි සුවයක් ලැබූ රෝගීන්ගෙන්ම අසා දැන ගැනීම වැදගත් කොට සලකමු.**


### ❖ ආශා සමරවික්‍රම - විද්‍යාගුරු



"අපේ ස්නායු පද්ධතිය ගත් විට මොළය සහ සුසුම්නාව කියන කොටස් දෙකකින් හැදිලා තියෙනවා. මොළයට ආරක්ෂාව හිස්කබළ තුළින් ලැබෙනවා. මොළයට සම්බන්ධ අනෙක් කොටස සුසුම්නාවයි. සුසුම්නාව පිහිටල තියෙන්නෙ කශේරුව තුළ. බාහිරින් එන කම්පන තුළින් සුසුම්නාවට ලොකු ආරක්ෂාවක් කශේරුව මඟින් ලබාදෙනවා. සාමාන්‍යයෙන් මිනිසෙකුගේ කශේරුව වක්‍රව පිහිටන්නේ නොයෙකුත් වැරදි ඉරියව්වල සිටීම සහ හදිසි අනතුරු මඟිනි. කශේරුකාවල ඇදවීම්, වක්‍රවීම් සුසුම්නාවට කරන්නේ ලොකු බලපෑමක්. ඉතින් සුසුම්නාවට කුඩා හෝ අනතුරක් සිදුවුවහොත් අපේ මුළු ශරීරයම කඩා වැටීමට ලක්වෙනවා.

මීට අවුරුදු හයකට උඩදී මම ගෙදර වැඩ කරගෙන යන අතරදී ලිස්සා වැටුණා. එහිදී මගේ කශේරුවේ ඉහළ කෙළවරේ හිසට ආසන්න අස්ථිවල පිහිටීමේ වෙනසක් වුණා. ඒ නිසා මට බෙල්ල හැරවීමේ අපහසුතාවක්, අතේ කැක්කුම. පාදවලට වේදනාව දැනුණා. ඉතින් ගෙදරදොර එදිනෙදා කටයුතු සහ රැකියාවේ කටයුතු කරගෙන යාමේ අපහසුතාවක් වුණා. ඊට පස්සේ තමයි ප්‍රතිකාරවලට යොමු වුණේ. ඇත්තටම මම මුලින්ම යොමුවුණේ බටහිර වෛද්‍ය ප්‍රතිකාරවලට. කාලයක් තිස්සේ වේදනානාශක ස්නායුවලට අදාළ ඖෂධ අවුරුදු දෙකක් වගේ කාලයක් භාවිත කළා. MRI ස්කෑන් කළාට පස්සේ මම දැනගත්තා මගේ අසනීප තත්ත්වය. පසුව මට විශේෂඥ වෛද්‍යවරයෙක් නිර්දේශ කළා ශල්‍යකර්මයකට භාජනය වෙලා මේ ගැටලුව විසඳාගන්න පුළුවන් කියලා. මම තීරණය කළා ශල්‍ය කර්මයකට නොයන්න. මම ඊට පරිබාහිර වෙනත් ක්‍රමයක් ඔස්සේ මගේ අසනීපය දුරු කර ගන්න අවශ්‍යයයි කියලා මම හිතුවා. ඒ අතර මගේ කාර්යාලයේ කෙනෙක් මාර්ගයෙන් කොළඹ වගේම දකුණු පළාතේ තියෙන මහාචාර්ය සාගර කරුණාතිලක මහතාගේ වෛද්‍ය මධ්‍යස්ථානය පිළිබඳව දැනගන්න ලැබුණා. පසුව මම එතුමා වෙත යොමු වුණා. මම එතුමා ළඟට ඇවිත් එතුමාගේ උපදෙස් මත ඒ ප්‍රතිකාරවලට යොමු වුණා. මට දැන් සියයට සියයක්ම සුවයි. දැන් මම එදිනෙදා කටයුතු සාමාන්‍ය පරිදි කරගෙන යනවා."

### ❖ අජන්තිකා බණ්ඩාරනායක



**(ඇඟලුම් කර්මාන්තයේ යෙදෙන ව්‍යවසායිකාවක්)**

"මම මගේ පවුලේ අය සමග සතුටින් ව්‍යාපාර කටයුතු කරගෙන ගිය අතර මට අසනීප තත්ත්වයක් මතුවුණා. මුලින්ම මගේ ඔළුව රිදෙන්න ගත්තා. කන්වලින් අමුතු හඬක් වගේම අත්වල කැක්කුම් ආවා. අවුරුදු තුනකට වැඩිය බටහිර ප්‍රතිකාර සඳහා කිහිප දෙනෙක් ළඟටම ගියා. ශල්‍යකර්මයක් කරන්න කිව්වා. MRI පරීක්ෂණයක් සිදුකිරීමෙන් අනතුරුව ශල්‍යකර්මයක් නොකරම බැහැ කිව්වා. හිතවතකු මාර්ගයෙන් මහාචාර්යතුමා ගැන දැනගත්තා. ඇය කිව්වා නවතම ප්‍රතිකාර ක්‍රමයක් තියෙනවා කියලා. මම පසුව ඒ පිළිබඳව සොයා බලා ඊට යොමු වුණා. අවුරුද්දක පමණ කාලයකට කලින් මම මාලඹේ වෛද්‍ය මධ්‍යස්ථානයට යොමු වුණා. දැන් මට හොඳටම හොඳයි. දැන් මම ඉතාම සතුටින් එදිනෙදා වැඩ කටයුතු කරනවා. ව්‍යාපාරික කටයුතු කරන්නත් විශාල පහසුවක් වුණා. අතු පතු ගාන එකවත් කරගන්න බැරිව හිටිය මට දැන් මනසටත් සහනයක්.

### ❖ සුවය ලැබූ සිසුවියක්

දැන් මගේ වයස අවුරුදු 18යි. මට වයස අවුරුදු 16දී පැතිකුදය රෝගය පැමිණියා. කොඳුඇටපෙළේ ඇදවීමක්. වැරදි ඉරියව් භාවිතය ගොඩක් වෙලාවට බලපාලා තියෙන්නේ අපි ගොඩක්ම ටියුෂන් පන්තිවල ගිහින් අධ්‍යාපනය මත්තෙම ඉන්න හින්දා පැය හත අටක් බංකුවල වාඩිවෙලා ඉන්න වෙනවා. පොඩි කාලේ ඉඳන් අපි ලොකු බරක් උස්සන් යනවා. සමහර දවස්වලට අපට වඩා බෑග් එක ලොකුයි. තාත්තා එනව ඉස්කෝලේට බෑග් එක අරන් යන්න. ඒවගේ හේතු හින්දා තමයි පැතිකුදය කියන රෝගී තත්ත්වය ඇතිවෙලා තියෙන්නෙ. ගොඩක්ම දැන් සුවය ලබල තියෙනවා. ඉස්සර මම ගෙදර යනකොට මේ උරහිස් ඔක්කොම රිදෙනවා.

අතපයවලත් ලොකු කැක්කුමක් එනවා. ගොඩක් අමාරුයි. ඒක කියන්න තේරෙන්නෑ. ඉතින් මෙම ස්ථානයෙන් තමයි ප්‍රතිකාර ලබාගන්නේ. සාමාන්‍ය පෙල විභාගය කරන අතර තමයි මම මේ ප්‍රතිකාර ගත්තේ. තාත්තාගේ යාළුවෙක්ගේ දුවෙකුටත් මෙම රෝගය තිබුණා. ඒගොල්ලො තමයි මට මේ ස්ථානය ගැන කිව්වේ. ඉතින් සාගර ඩොක්ටර් ළඟට තමයි ගියේ. දැන් එයාටත් ගොඩක් හොඳයි. ඒ විශ්වාසයෙන් අපිත් මෙතනට ආවා. කලින් මට ගොඩක් අතපය කැක්කුම් වේදනා තිබුණා. දැන් කිසිම දෙයක් නැහැ. තව ප්‍රතිකාර කරන්න තියෙනවා. බොහෝදුරට දැන් සුවයක් තියෙනවා. ඇත්තටම දැන් ලොකු විශ්වාසයක් තියෙනවා. ළමයෙක් මේ මානසිකව මේ හේතුව නිසා පහළ වැටෙන්න පුළුවන්. එවැනි රෝගීන්ට මෙවැනි ස්ථානයක් ප්‍රතිකාර සඳහා ලැබුණහම අපට ලොකු ශක්තියක්. අපේ අනාගතය හදාගන්න පුළුවන් කියන අධිෂ්ඨානය අපට ඇති වෙනවා. ඒක මා තුළ තියෙනවා. ඒ නිසයි මම මෙතනට ප්‍රතිකාර සඳහා යොමුවන්නේ. මගේ බලාපොරොත්තුව නැටුම්වලින් ඉදිරියට යන්න. ඉතින් මෙම රෝගය සුව කළ හැකි බව ලොකු විශ්වසායක් තියෙනවා.

### ❖ ආචාර්ය නිශාන්ත දර්ශන



**(සභාපති, සියලු ජාතීන්ගේ සමගි සංවිධානය)**

මේක ඇත්තටම විශාල කෘතගුණ සැලකීමක්.

මම මේ සංවිධානයේ සභාපතිවරයා විදිහට අපි අහල තියෙනවා මෙතුමන් රණවිරුවන්ට ඒ වගේම පූජ්‍ය පක්ෂයට නොමිලේ ප්‍රතිකාර කරනවා. මහඟු සේවයක් ලබාදෙනවා කියලා. ඒක යථාර්ථවාදී කරන්නා වූ සංදිස්ථානයක් තමයි මගේ සංවිධානය තුළ එතුමන් සම්බන්ධවෙලා මෙම සංවිධානයේ ආධ්‍යාත්මික උපදේශකතුමන් ලෙස සම්බන්ධ වෙලා එතැනින් එතුමන් මගේ සංවිධානයට ලබාදීපු මහඟු සහනය තමයි අපි මාධ්‍යවලින් දැක්ක ඒ ප්‍රකාශය යථාර්ථවාදී වූ ප්‍රධානම අවස්ථාවක්. එතුමන්ගේ දායකත්වයෙන් මගේ සංවිධානය තුළ රණවිරුවන්ට, ඒ වගේම සර්ව ආගමික පූජ්‍ය පක්ෂයට එතුමන්ගේ සේවය නොමිලේ ලබා දුන්න. එතුමාගේ එම සේවය මගේ සංවිධානය තුළ යථාර්ථයක් වුණා.

**සංස්කරණය රවිශාන් කුමාර**

### Prof Sir Steve Russell (Dr.)



I Have known Prof, Karunathilaka now many years both as Student and colleague. I commend this gentleman to anyone who has need of any medical help. He is second to none as a dedicated and professional practitioner, who is passionate in what he does. Many people world- wide, have been helped by his unique way of improving people's structure and lifestyle. He could so easily keep this Knowledge to himself, but selflessly he wishes to teach others so that all can benefit from his range of abilities.
A great man with great ability.


## ප්‍රතිකාර ලබාගත හැකි රෝග

**Some of the diseases which are being treated.**

- කොඳු ඇට පෙළ සම්බන්ධ සියලු රෝග / Back Pain
- හිසේ රෝග Migraine
- හන්දි වේදනා / Neck Pain / Arthritis/ Shoulder Pain
- අස්ථි රෝග / Bone Disorders
- හිරිවැටීම් / Numbness
- සඳ මිදුලු හා කශේරුකා වෙන්ස්වීම් / Vertebrae & disc Misalignments
- අස්ථි තදවීම් / Bone Tightness
- ස්නායු තෙරපීම් / Spinal Nervous Decompression
- මානසික ආතතිය / Stress
- Parkinson රෝගය / Parkinson's Disease
- පැතිකුදය / Scoliosis
- අංශභාගය / Paralysis
- ස්නායු රෝග / Nervous Disorders
- විඩාබර බව / තෙහෙට්ටුව / Fatigue
- නින්ද නොයාම / Sleeplessness
- විශාදය / Depression
- රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝග All Circulatory Disorders
- මාංශපේශී තදවීම් Tight Muscles
- මධ්‍ය ස්නායු පද්ධතිය ආශ්‍රිත රෝග All Central Nervous System Related Problems

**ඔබ ප්‍රතිකාර සදහා මාලබේ පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානයට පැමිණෙන්නේ නම් බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා දිනයන්හි උදේ 8:00 සිට සවස 2:00 දක්වාත්, මාතර කඹුරුගමුව ශාඛාවට පැමිණෙන්නේ නම් සදුදා උදේ 8:00 සිට සවස 2:00 දක්වාත් පැමිණිය යුතුවේ. වැඩි විස්තර සදහා www.osteodr.com වන අපේ වෙබ් අඩවියට පිවිසෙන්න.**

## ඔස්ටියෝ ක්ලිනික් වෛද්‍ය මධ්‍යස්ථානය, මාලඹේ.

531/ 1, අතුරුගිරිය පාර, මාලඹේ. ක්ෂණික ඇමතුම් 076 73 33 971 / 077 52 60 401
දු: ඇමතුම් 0112 054 444 / 0112 054 433 / 0112 054 499

**ශාඛා : කඹුරුගමුව, මාතර**

වැඩි විස්තර සඳහා **www.osteodr.com** වන අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

අද්භූත ක්‍රමයකින් ලෙඩ රෝග සුවකරන පුද්ගලයකු කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොළට තරමක් නොදුරු පිටසරබද ගමක වෙසෙන බව මට දැනගන්නට ලැබී දැනට මාස කිහිපයකි. කුවේණියගේ පරපුරට අයත් බව පැවසෙන ඔහුගේ එම අද්භූත ප්‍රතිකාර ක්‍රමයද කුවේණියගේ කාලයේ සිටම පැවැත එන්නක් බවද දැනගත හැකි විය. එහෙත් වංශකතා සාහිත්‍යයෙහි එන කුවේණි හෙවත් කු+වන්නා යනු අයහපත් වර්ණයක් හෙවත් කාලවර්ණ ශරීරයක් ඇත්තියකි. ඇය එම වංශ කතාවලට පිවිස ඇත්තේ එවක පැවැති අතීත පුරාණෝක්ති අනුවය. එබැවින් කුවේණිය යනු හුදෙක් සත්‍ය චරිතයකට වඩා සමකාලීන සමාජය නිරූපණය කෙරෙන මානව විද්‍යාත්මක සංකේතයක් බව මගේ පෞද්ගලික වැටහීමයි.

මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් නාමයක් හිමිකරගෙන සිටි මාධ්‍යවේදී උදය විජේසිංහ මගේ සුහද මිතුරෙකි. අද වනවිට වෘත්තියෙන් සේම ගෘහ ජීවිතයෙන්ද වෙන්වී හිඳින උදය, රෝගී බව වියපත් බව ආදී විවිධ හේතු නිසා අබල දුබල බවට පත් අසරණ සුනඛයන් සියයකට වැඩි ප්‍රමාණයක් රැකබලාගනිමින් කල් ගෙවයි. මහව ප්‍රදේශයේ හේන් කුඹුරු සහිත පරිසරයක ඔහු ජීවත්වන්නේ එම සුනඛ කැලද සමඟිනි.



# මාධ්‍යවේදියෙක් හින්දා කුවේණිගෙ මුණුබුරාට උන්හිටි තැන් අමතකවෙලා

## කුවේණිගෙ පුස්කොළ පොතට පෙට්‍රල් සුවඳ ගියේ කොහොමද?

පසුගිය දිනයෙක උදය සමඟ දුරකතනයෙන් කතා කරමින් සිටින වේලාවක මම ඔහු ජීවත්වන ප්‍රදේශයට තරමක් නොදුරින් පිහිටි අඹන්පොළ වෙසෙන කුවේණියගේ අද්භූත වෙදකම් කරන මෙම අපූරු වෙදදුරා පිළිබඳවද නිකමට මෙන් කීවෙමි.

"ෂහ් ඒක නම් ගිහින් බලන්නම ඕනේ වැඩක්. අද රාවණා, කුවේණි විතරක් නෙවෙයි මහසෝනාගේ නැන්දම්මාව හිටන් මාකට් කරන 'ඩයල්'නේ හැමතැනම ඉන්නේ." උදය කීවේ මහත් උද්යෝගයකිනි.

ඒ අනුව ඊට දින කිහිපයකට පසු කිසියම් රෝගයකට ප්‍රතිකාර ගැනීමේ මුවාවෙන් එම කුවේණි සතු අද්භූත වෙදකම් කරන වෙද මහතා හමුවීමට ගිය ඔහු එදිනම ඒ රසවත් විස්තරය මා හමුවේ තැබීය. වාර්තාවක් ලෙසින් සැකසුවහොත් එය මෙලෙසිනි.

අඹන්පොළට කිලෝමීටර් කිහිපයක් එපිටින් පිහිටි කෘෂිකාර්මික ගම්මානයක වැන්දඹු කාන්තාවක් සමඟ එකට ජීවත්වන මේ පුද්ගලයා මැදිවියේ තැනැත්තෙකි. ඔහුගේ සැබෑ නම, ගම ආදී වගතුග ඒ ගම්වාසීහු නොදනිති. එහෙත් ඔහු සතු මෙම අද්භූත ප්‍රතිකාර ක්‍රමය පිළිබඳව කුමන ක්‍රමයකින් හෝ දැනකියාගත් පිරිස් කිලෝමීටර් සිය ගණන් දුර ගෙවා ඔහු හමුවීමට එති. සුදු සරමක් හැඳ ඉණ වටා රතු පටියක් බැඳ සිටින ඔහුගේ හිස මත සුදු පැහැති තලප්පාවකි.

පසුගිය දිනයෙක උදය මෙම පුද්ගලයා හමුවට යනවිට ඔහු තමන් හා ජීවත්වන වැන්දඹුවගේ නිවස ඉදිරිපිට මී ගසක් යට තැබූ කුඩා පුටුවක වාඩි වී සිටියේය. ඒ ඉදිරියේ තවත් පුටුවක් හා ටීපෝවක් වූ අතර ඔහුගෙන් ප්‍රතිකාර ගැනීමට පැමිණි රෝගීහු ඉන් මදක් ඔබ්බෙහි වූ බංකු දෙකක වාඩිවී සිටියහ.

තම ප්‍රතිකාර ඇරඹීමට පෙර රෝගීන්ගේ රෝග විනිශ්චය කිරීමට ඔහු යොදාගන්නා ක්‍රමයද ඉතා කදිමය. ඔහු වාඩිවී සිටින කුඩා අසුන ඉදිරියේ ඇති ටීපෝවේ දිය පිරවූ ලොකු මැටි කොරහක් තිබේ. හක්ගෙඩියක් එම වතුරේ ගිල්වා ඇති අතර, තමන් හමුවට පැමිණෙන රෝගියාට ඒ ටීපෝව ඉදිරියේ ඇති කුඩා බංකුවේ වාඩිවීමට අණකොට එකම වදනක්වත් නොවැටහෙන මොකක්දෝ හෑල්ලක් කියමින් තමන් අතේ ඇති සීනුව ඒ රෝගියාගේ කනට කිට්ටුකොට හැඬවීම ඔහුගේ රෝග විනිශ්චය ක්‍රමයයි. මෙසේ එකදිගට විනාඩි කිහිපයක් එම මන්ත්‍ර ජපකොට සීනුව හඬවන ඔහු ඒ කොරහේ ඇති හක්ගෙඩිය රෝගියා අතට පත්කරනුයේ එය හැකිතාක් ගැඹුරින් ආඝ්‍රාණය කරන ලෙස පවසමිනි.

එසේ එම හක්ගෙඩිය ආඝ්‍රාණය කරන අතරේ කිනම් හෝ රෝගයක් ඇත්තකු හට ඒ හක්ගෙඩියෙන් යම් විශේෂිත සුවඳක් දැනිය යුතුමය. එවිට ඒ සුවඳ කුමක්දැයි රෝගියාගෙන් අසන කුවේණි වෙද මහතා ඉන්පසු රෝගියාගේ නාඩි ආදිය පරීක්ෂාකොට එම රෝගය කුමක්ද යන්න පිළිබඳව රෝගියාට එසැණින් කියාදෙයි. පසුව තමන් සතු කුඩු මුල් කිහිපයෙන් එකක් ඒ රෝගියාට දී එය තැඹිලි, දෙඩම්, වතුර, මී පැණි, මුංඇට තැම්බූ ජලයෙන් මුසුකොට එකදිගට දින හතක් පානය කරන ලෙස දන්වා සිටිනුයේ එම බෙහෙතින් ඕනෑම රෝගයක් ඒකාන්ත වශයෙන්ම නිට්ටාවට සුවවන බව පවසමිනි. එම ප්‍රතිකාරය සඳහා ඔහු රුපියල් දෙදහසේ සිට පන්දහස දක්වා වන මුදලක් අය කරයි.

මහනුවර, මීරිගම, හොරණ සහ අම්බලන්ගොඩ යන ප්‍රදේශවලින් පැමිණි රෝගීන් සිව්දෙනෙකුට බෙහෙත් නියම කිරීමෙන් පසු උදය විජේසිංහගේ වාරයද එළැඹිණි.

"මේක කුවේණි අම්මගේ පුස්කොළ පොතකින් ගත්තු බොහොම බලගතු වෙදකමක්. ඒ පුස්කොළ පොත අයිති අපේ පරම්පරාවේ අයට විතරයි." ආදී වශයෙන් තම වෙදකම පිළිබඳ යම් විස්තරයක් කළ කුවේණි වෙද මහතා උදයගේ කන අද්දරට කොට ඒ සීනුව හඬවමින් කුවේණි මන්ත්‍රයක් බව පැවසෙන ඒ අමුතුම හෑල්ල මුමුණන්නට විය. පසුව එම දිය කොරහේ තිබූ හක්ගෙඩිය ගෙන උදයගේ අතට දුන් වෙද මහතා එය නාසයට කිට්ටුකොට ඉන් නික්මෙන ගඳ සුවඳ තමන්හට පවසන මෙන් ඉල්ලා සිටියේය.

"මට නම් ආවේ එහෙම්පිටින්ම පෙට්‍රල් සුවඳක්." හක්ගෙඩිය ආඝ්‍රාණය කර එම කුවේණි වෙද මහතා හමුවේ අමු ගජබින්නයක් අතහැරි උදය වෙද මහතාගේ මුහුණේ ඉරියව් කෙරෙහි සුපරීක්ෂාකාරී විය.

"පෙට්‍රල් සුවඳක් කිව්වා නේද? කෝ එහෙනම් දෙන්න බලන්න අත නාඩි කොහොමද කියලත් බලන්න." මද කල්පනාවක නිමග්න වූ කුවේණි වෙද මහතා කීය.


"ඔය ඔක්කොම ගඳ සුවඳවල් ගැන කුවේණි අම්මගේ පුස්කොළ පොතේ තියෙනවද වෙද මහත්තයා?" අනතුරුව උදය අහිංසක ලෙසින් ඇසීය.

"තියෙනවා නේන්නම්." වෙද මහතා කියාසිටියේ තරමක අභිමානයකින් යුතුවය.

"ඒත් කුවේණි ඉන්න කාලේ පෙට්‍රල් තියෙන්න විදියක් නම් නෑ නේද?" අනතුරුව උදය අසත්ම කුවේණි වෙද මහතා විදුලිසැරයක් වැදුනු කලෙක මෙන් තිගැස්සෙනු උදයට පෙනිණ.

"මට පෙන්නේ තමන්ට තියෙන්නේ මානසික රෝගයක්. ඒකට මෙහේ හරියන්නේ නෑ අංගොඩට යන්න වෙනවා." උදයගේ එම සාධාරණ පැනයෙන් දැඩිව කිපුණු වෙද මහතා කීය.

"මානසික රෝගවලට අංගොඩ යන්න කියනවා වගේ අනික් කායික රෝග කියන අයටත් ඉස්පිරිතාලවලට යන්න කියනවා නම් නේද හොඳ වෙද මහත්තයා?" කී උදය "අසරණ මිනිස්සුන්ට මේ වගේ බොරු වල්පල් නොකියා" යන්නද ඇසෙන නෑසෙන ගාණට පවසා එතැනින් නික්මුණි.



මාධ්‍යවේදී
**තිලක් සේනාසිංහ**

දැන්වීමයි

# ජන ජීවිත නගාසිටුවන පරිසර හිතකාමී පොල්කටු අඟුරු





පවතින අභියෝගාත්මක ආර්ථික පසුබිම සහ විදේශ විනිමය හිඟය මධ්‍යයේ පීඩාවට පත් මෙරට ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරමින් ලංකාවට ඩොලර් රැගෙන එන කදිම මාවතක් ලෙස පොල්කටු අඟුරු ව්‍යාපාරය හැඳින්විය හැකිය. පොල්කටු අඟුරු වල පවතින ඉහළ ආර්ථිකමය වටිනාකම නිසාම එය කළු රත්‍රන් (Black Gold) ලෙසින් ද හඳුන්වයි.

සාම්ප්‍රදායික පොල්කටු අඟුරු නිෂ්පාදන ක්‍රියාවලිය හරහා පරිසරයට අහිතකර වායු රැසක් මුදා හැරුණු අතර ඒ හරහා වායු දූෂණය ඉහළ යන ලදී. එය එම කර්මාන්තයේ නියැළුණු පිරිස් වලට දැවැන්ත අභියෝගයක් විය.

නැදලගමුව සණස සමිතියේ සභාපති හේමපාල රණවීර මහතා මේ පිළිබඳව මෙසේ සඳහන් කරන ලදී. "අපේ ගමේ පොල්කටු අඟුරු කර්මාන්තයේ නියැළුණු පිරිස් ඉන්නවා. ඉස්සර ඔවුන් සාම්ප්‍රදායික ක්‍රමයට වළවල් තුළ පොල් කටු පුලුස්සා අඟුරු නිෂ්පාදනය කළා. නමුත් එයින් විශාල ලෙස දුම් පිටවුණා. ගස් කොළන් සහ ගම්වාසීන්ට පවා එය වඩාත් පීඩාකාරී වුණා. නමුත් දිවයින පුරා විසිරී සිටින දේශීය සැපයුම්කරුවන් සමඟ සිය ප්‍රබල හරිතඅඟුරු නිෂ්පාදන තාක්ෂණය බෙදාහරින හේලීස් සමාගමට අනුබද්ධිත Haycarb PLC, "හරිත අංගාර" ඒකක ස්ථාපිත කරමින් පොල්කටු අඟුරු කර්මාන්තකරුවන්ට තිරසාර පිළියමක් ලබාදුන්නා. දැන් ඔවුන් කිසිම ගැටලුවකින් තොරව පරිසර හිතකාමී ලෙස සාර්ථකව පොල්කටු අඟුරු කර්මාන්තය කරගෙන යනවා."

පොල් සංවර්ධන අධිකාරිය (CDA) සහ දිවයින පුරා කුඩා හා මධ්‍ය පරිමාණ සැපයුම්කරුවන්ගේ පුළුල් ජාලයක් සමඟ එක්ව කටයුතු කරමින් හරිත අංගාර වැඩසටහන අඛණ්ඩව කරගෙන යන අතර 2025 අවසානය වන විට පොල්කටු අඟුරු ඒකක 500 ක් දක්වා පුළුල් කිරීමට සැලසුම් කර ඇත. 2014 දී ප්‍රථම වරට ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය, Haycarb හි හරිත අඟුරු නිෂ්පාදන ශිල්පීය ක්‍රම ඇතුළත් කර දැනට පවතින අඟුරු නිෂ්පාදනය කිරීමේ ඒකක සඳහා වන තාක්ෂණික සහාය පුළුල් කරන ලදී. නව පරිසර හිතකාමී ඒකක වැඩිදියුණු කිරීමට සහ ස්ථාපිත කිරීමට සැපයුම්කරුවන්ට තවදුරටත් සහාය වීම සඳහා දිගුකාලීන, පොලී රහිත ණය ලබා දීමට ද කටයුතු කර ඇත.

Haycarb හි හරිත අංගාර ව්‍යාපෘතිය සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණයෙන් ඔබ්බට ව්‍යාප්ත වීමත් සමඟ සමාගමට දැන් පොළොන්නරුව, අනුරාධපුරය, යාපනය, මුලතිව්, සියඹලාණ්ඩුව, අම්පාර සහ බලංගොඩ යන ප්‍රදේශවල සැපයුම්කරුවන්ගෙන් ද හොඳම තත්ත්වයේ අඟුරු ලැබීමට පටන් ගෙන තිබේ.

"ඇත්තටම මෙම පොල්කටු අඟුරු කර්මාන්තය ඉහළ ආදායමක් උපයන්න පුළුවන් කර්මාන්තයක්. විදෙස් වෙළඳපොළ තුළ පොල්කටු අඟුරු වලට ඉහළ වටිනාකමක් තිබෙනවා. ඒ වගේම අපගේ ගෘහාශ්‍රිතව අපතේ යන පොල්කටු එකතු කිරීම හරහා සාමාන්‍ය ජනතාවට අමතර ආදායමක් ද ලැබෙනවා. හරිත අංගාර වැඩසටහන ආරම්භ කිරීමට ප්‍රථම අපි ජන ශූන්‍ය ප්‍රදේශ වලට ගොස් පොල්කටු අඟුරු වළවල් සෑදීමට අවශ්‍ය ඉඩම් කුලියට ගෙන තමයි මෙම ව්‍යාපාරය කරගෙන ගියේ. ඒ කාලේ ඇත්තෙන්ම මෙම ව්‍යාපාරයෙන් නිසි ලාභයක් ලැබීමට හැකි වුණේ නෑ. මෙම හරිත අංගාර වැඩසටහන නිසා අපිට පරිසර ගැටලු වලින් තොරව ප්‍රමිතිගත පොල් කටු අඟුරු නිෂ්පාදනයට හැකි වුණා. ඒ වගේම Haycarb ආයතනයෙන් අපගේ නිෂ්පාදනයන වලට ඉහළ මිලක් ලැබෙනවා. අපි දැන් මෙම ව්‍යාපාරයෙන් ඉහළ ආදායමක් ලබමින් රටට ද ඩොලර් ගෙන එනවා." යනුවෙන් පොල්කටු අඟුරු කර්මාන්තකරුවෙකු වන නලින් දර්ශන මහතා කෘතඥ පූර්වකව සඳහන් කළේය.

Haycarb හි සම්පූර්ණ අඟුරු සැපයුමෙන් සැලකිය යුතු කොටසක් දැනටමත් පරිසර හිතකාමී නිෂ්පාදනයක් බවට පරිවර්තනය කර ඇත. 2025 වන විට ශ්‍රී ලංකාවේ සමස්ත සැපයුම් දාමය සම්පූර්ණයෙන්ම ප්‍රතිස්ථාපනය කර 100% ක් ම පරිසර හිතකාමී අඟුරු නිෂ්පාදනය වෙනුවෙන් මෙම වැඩසටහන පුළුල් කිරීමට දිගුකාලීන සැලසුම් ක්‍රියාත්මක වේ.

ඉහළ යන ගෝලීය උෂ්ණත්වය, ග්ලැසියර් ඛාදනය සහ ඕසෝන් ස්ථරය විනාශ වීම වැනි භයානක පරිසර අර්බුද සඳහා තිරසාර විසඳුමක් ලබා දීම කාලීන අවශ්‍යතාවයක් වන අතර එය යුතුකමකට එහා ගිය වගකීමක් යැයි සලකන Haycarb ආයතනය, පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රම හඳුන්වාදෙමින් ජනතාවගේ ආර්ථිකය ද ශක්තිමත් කරයි.









# පුරා සාරා



## මොකක්ද නංගී නම?

# යමෙක් නොමැරෙයිද...ඒ තමයි අයියා, මම

**ගෑනු පිරිමින්ට රැවටෙන එකද වැඩිපුරම වෙන්නෙ නැත්නම් පිරිමි ගෑනුන්ට රැවටෙන එකද?**

ඔය දෙකම අඩු වැඩි වශයෙන් සිද්ධ වෙනවා. හැබැයි ගොඩක් වෙලාවට එළියට එන්නෙ ගෑනු පිරිමින්ට රැවටෙන අවස්ථා විතරයි.

**මොකක්ද ඒකට හේතුව?**

ප්‍රශ්නවල රස්නෙ දියකරලා අරින්න පිරිමි තෝරගන්නෙ ඇල්කොහොල් වුණාට ගෑනු ගොඩක් වෙලාවට ඒ වැඩේට පාවිච්චි කරන්නෙ කඳුළු. මම කියන්නෙ බහුතරයක්. ඉතින් එහෙම වුණාම ලෝකෙට පේන්නෙ ගෑනුන්ගෙ කඳුළු විතරයි. ඇල්කොහොල් එක්ක දියවෙලා යන පිරිමින්ගේ දුක එළියට එනවා අඩුයි.

ඔය කිව්වට හැම ගෑනියෙක්ම හොටු පෙරාගෙන අඬන්නෙ නෑ. ගෑනුත් අඬන විදි කීපයක් තියෙනවා.

**මොනවද?**

සමහරු වක්කඩ කැඩුවා වගේ තැනක් නොතැනක් නැතුව අඬනවා. සමහරු ලෝකෙට පේන්න හිනාවෙලා කාටවත් නොපෙනෙන්න අඬනවා. තවත් සමහරු ඔය දෙවිදියටම නැතුව ෆේස්බුක් එකේ අඬනවා.

මම නම් කියන්නෙ ටිකක් මොළේ කල්පනා කරලා වැඩ කරනවානම් ඔය එක විදියකටවත් අඬා වැටෙන්න ඕන නෑ. මොකද කඳයි බඩයි රැවුලයි තිබුණු පලියට හැම මිනිහෙක්ම මහත්තයෙක් වෙන්නෙ නෑ කියන එක තේරුම්ගන්න ගෑනියෙක් වුණාම පොඩි සෙන්ස් එකක් තියෙන්න ඕන.

ගෑනියෙකුට විතරක් නෙවෙයි, පිරිමියෙකුටත් ඒ සෙන්ස් එක තියෙන්න ඕන සටකපට ගෑනුන්ට අහුනොවී ඉන්න.

එහෙම කියද්දි මට මතක්වෙනවා ඔය සෙන්ස් එක අඩුවක් නැතුව පිහිටලා තිබුණු මාර කපල් එකක්.

**ඒ කවුද?**

මහෞෂධ පඬිතුමයි අමරා දේවියි.

**මහෞෂධ පඬිතුමා වැඩ කළේ වේදේහ රජ්ජුරුවෝ ගාවනේ. වේදේහ කියන්නේ මහ කපටි රජෙක් නේද?**

කපටි නම් තමයි. ඒ වගේම වේදේහ කියන්නේ හරි මෝඩ දේශපාලනඥයෙක්. මිනිහා මොළේ පාවිච්චි කරලා කරපු එකම වැඩේ තමයි ඔය මහෞෂධව තමන්ගේ අග්‍ර අනුශාසක කරගනිපු එක.

සේනක, පුක්කුස, කාවින්ද, දේවින්ද කියන බමුණෝ ටික විරුද්ධ වුණාලු මහෞෂධට ඒ තනතුර දෙනවට. මොකද මහෞෂධ කියන්නේ ගොවියෙක්ගේ පුතෙක් නිසා. ඒ කාලෙ ගොවි කුලේ කියන්නේ අඩු කුලයක් විදියට සලකපු එකක්. හැබැයි බමුණෝ එක්ක ඉඳලා ආණ්ඩුව වැටෙනවට වඩා අඩු කුලේ එකෙක්ගෙන් හරි ගොඩයන එක හොඳයි කියලා වේදේහ උන් කියන ඒවා සතේකට ගණන් නොගෙන මහෞෂධව වැඩට ගත්තලු.

**ඉතින් මොකක්ද අර කපල් එකක් ගැන කතාවක් කිව්වෙ?**

කතාව මේකයි. මහෞෂධ ඔහොම වැඩ කරගෙන ඉන්නකොට මිනිහට හිතුණලු දැන් කසාද බඳින්න ඕන කියලා. වේදේහ රජතුමාට කිව්වම උන්දෑ ලෑස්ති වෙලා තියෙන්නේ අඬබෙරයක් ගහලා මහෞෂධට ගැළපෙන මනමාලියෙක් හොයන්න. හැබැයි මහෞෂධ ඒ වැඩේට කැමති වෙලා නෑ.

**ඇයි ඒ?**

මිනිහා කිව්වලු 'මම අසවලාගේ අසවලාය' කියලා දැනගෙන මාව බඳින්න කැමති වෙන ගෑනියෙක් මට ඕන නෑ කියලා.

ඒ කියන්නෙ තනතුරු තාන්න මාන්නවලට කැමති වෙන ගෑනු ඒ කාලෙත් ඉඳලා?

අනිවාර්යයෙන් ඉන්න ඇති. ඒ නිසා මහෞෂධට ඕන වුණාලු හිඟන්නෙක් වගේ ඇඳගෙන ගිහින් ඌට කැමති වෙන ජාතියේ ගෑනියෙක් හොයාගන්න.

ඉතින් එහෙම හිතලා දැන් මේ මහෞෂධ පණ්ඩිතයා හිඟන්නෙක් වගේ ඇඳගෙන ගියාලු යව මැදුම් කියන ගමට.

**ඊටපස්සෙ?**

ඊටපස්සෙ ඉතින් ඔන්න ඈතින් එනවා ජේනවලු හැඩ ඇඟක් තියෙන ලස්සන ගෑනු ළමයෙක්. ඇඟ හැඩ වුණාට මොළේ වැඩද කියලා දන්නෙ නැති නිසා මහෞෂධට ඕන වුණාලු ඒකත් පරීක්ෂා කරලා බලන්න.

**කොහොමද ඒ?**

අමරා ඇවිත් තියෙන්නේ කැඳ හට්ටියක් ඔලුව උඩ තියාගෙන කොහේහරි යනගමන්.

> **පොත්තෙ පාට තිබුණු පමණින්, ලොකු රස්සාවක් කළ පමණින් ජීවිතේ බෙදාගන්න හොඳම ගෑනි තමයි මේ කියලා කරගහගන්න පිරිමි හදිස්සි වෙන්න ඕන නෑ**

දැන් ඉතින් මුලින්ම බලාගන්න ඕන මෙයා කසාද බැඳපු කෙනෙක්ද නැති කෙනෙක්ද කියන එකනේ. ඒ ප්‍රශ්නෙ කෙළින්ම අහන්නේ නැතුව මහෞෂධ ඒකට හස්ත සංඥාවක් පාවිච්චි කළාලු. ඒ හස්ත සංඥාවෙන් අහන්නෙ 'නංගි ඔයා Taken ද නැත්නම් Single ද' කියන එක. ඒ කාලෙ විදියට නම් සස්වාමිකද? අස්වාමිකද කියන එක.

ඉතින් ඒ හස්ත සංඥාවට අමරා සංඥාවකින්ම උත්තර දුන්නලු. ඒ කියන්නෙ අස්වාමිකයි කියලා.

**ඊටපස්සෙ?**

දැන් ඉතින් ලොකුම ප්‍රශ්නෙට උත්තර ලැබුණු නිසා පස්සේ මහෞෂධට ඕන වුණා මේ කෙල්ලගෙ නම දැනගන්න.

**ඒකත් හස්ත සංඥාවෙන්ද?**

නෑ නෑ. මහෞෂධ ඊටපස්සෙ මෙයාගෙන් ඇහුවා නම මොකක්ද කියලා. හැබැයි මේ කෙල්ල නෙවෙයි එකපාර උත්තර දුන්නේ. කෙල්ල හිතුව මූ මගෙන් බැඳලද නැද්ද කියන එක ඇහුවෙත් අමුතු විදියකට. ඉතින් මං මොකටද පැනලා දෙන්නෙ කියලා.

**ඒ කියන්නෙ නම කිව්වෙ නැද්ද?**

එකපාර නම කිව්වෙ නෑ. "යමෙක් නොමැරෙයිද... ඒ මම" කියලා කියනවා

එතකොට මහෞෂධ අහනවා "ඒ කියන්නේ ඔයාගෙ නම අමරා ද?"

"ඔව්."

ඊටපස්සෙ අහනවා "කාටද ඔය කැඳ?"

මෙයා කියනවා "ඉෂ්ට දේවතාවට" කියලා.

"ඒ කියන්නෙ තාත්තටද?"

"ඔව්."

"තාත්තා මොනවද කරන්නේ?"

"අපේ තාත්තා එක දෙක කරනවා."

"ඒ කියන්නෙ සී සානවද?"

"ඔව්."

"කොහෙද?"

"ගියාම ආපහු එන්නෙ නැත්තෙ" කියලා උත්තර දෙනවා.

ගියාම ආපහු නැගිටලා එන්නෙ නැත්තෙ සොහොනෙන් නිසා මහෞෂධ අහනවා "සොහොනක් ළඟද කුඹුර තියෙන්නෙ" කියලා. "ඔව්" කියනවා.

ඊටපස්සෙ අහනවා "තාත්තා අද ගෙදර එනවද?"

එතකොට අමරා කියනවා "ආවොත් එන්නෙ නෑ. නාවොත් එනවා" කියලා.

එතකොට මහෞෂධ දැනගන්නා එහෙනම් කුඹුර තියෙන්නෙ ගඟකට එහා පැත්තෙ. ගඟ ගැලුවොත් තාත්තා මෙගොඩට එන්නෙ නෑ. නැත්නම් එනවා කියලා.

**මාර Intellectual conversation එකක්නේ.**

ඔව්. මම කියන්නේ දෙන්නෙක් කසාද බඳින්න කලින් නෙවෙයි යාළු වෙන්න කලිනුත් මේ වගේ සංවාදයක් ඇතිවෙන්නම ඕන. මොකද පුද්ගලයා කවුරු වුණත් වඩා වැදගත් වෙන්නේ ඒ මනුස්සයා එක්ක ජීවත් වෙන්න පුළුවන්ද බැරිද කියලා දැනගන්න එක. ඒ නිසා මේ වගේ සංවාද ජාතක කතා පොතට විතරක් සීමා වෙන්න ඕන නෑ කියන එකයි මගේනම් මතය.

කොල්ලෙක් වුණත් මුලින්ම හොයලා බලන්න ඕන කෙල්ල Virgin ද, මීට කලින් කොල්ලෝ කීයක් හිටියද කියන එක නෙවෙයි. පොත්තෙ පාට තිබුණු පමණින්, ලොකු රස්සාවක් කළ පමණින් ජීවිතේ බෙදාගන්න හොඳම ගෑනි තමයි මේ කියලා කරගහගන්න පිරිමි හදිස්සි වෙන්න ඕන නෑ.

ඒ වගේම තමයි ගෑනු හදිස්සි වෙන්න ඕනත් නෑ. කඳයි බඩයි රැවුලයි තිබුණු පලියට, එහෙම නැත්නම් නිලය බලය මිල මුදල් තිබුණු පලියට මිනිහෙක් එක්ක ජීවත්වෙන්න බෑ. ඒ මිනිහගෙ ආකල්ප මොන වගේද, අදහස් මොන වගේද, ඒවා තමන්ගේ අදහස් එක්ක පෑහෙනවද කියලා බලන්න ඕන.

කෙනෙකුට හිතෙන්න පුළුවන් මහෞෂධගෙයි අමරා දේවියගෙයි අතරෙ වුණා කියන මේ සබුද්ධිමය සංවාදය අද කාලෙට ගැලපෙන්නෙ නෑ කියලා.

හැබැයි මම කියන්නේ දෙන්නෙක් එක වහලක් යටට වෙන්න කලින් ළමයි කීයක් හදනවද, උන්ට දන නම් මොනවද වගේ සීනිබෝල කතා නැතුව මේ වගේ Intellectual conversation එකකට යන්නම ඕන. අනිත් ඔක්කොම තිබුණත්, තමන්ව තේරුම්ගන්න පුළුවන් සෙන්ස් එකක් තියනවද කියල බලාගන්න පුළුවන් සංවාදයක් වෙන්න ඕන ඒක.

පස්සෙ කාලෙකදි අනේ මං රැවටුනා, පැරදුනා කියලා රට්ටු හිනස්සලා උසාවි පොලිසි ගානේ ගිහින් වෙන්වෙනවට වඩා, පිහි ඇනුම් කනවට වඩා කොච්චර කටුක වුණත්, බොළඳ නැති වුණත් මුලදිම එහෙම සංවාදයකට යන එක කාගෙ කාගෙත් ඇඟට ගුණයි.

පුරා

# අලි වැඩ හරි ජෝලි හැබැයි නෝනා වලි





**තොරතුරු**
**පශු වෛද්‍ය**
**තරිඳු විජේකෝන්**
**(ශ්‍රී දළදා මාලිගාව, Millennium Elephant Foundation සහ Vetcare සත්ව රෝහල)**

පශු වෛද්‍ය තරිඳු විජේකෝන්ට අලි පිළිබඳ අසීමිත උනන්දුවක් ඇතිවුණේ ඔහු විශ්වවිද්‍යාලයේ තෙවන වසරේ සිටියදීය. ඔහු කියනා පරිදි එය එක්තරා ආකාරයක උමතුවකි. නිශ්චිත හේතුවක් නැතත් අහම්බෙන් හැදුනු මේ අලි පිස්සුව නිසා ඔහුට අවැසි වූයේ මියයාමට පෙර එක අලියෙකුට හෝ තනිව ප්‍රතිකාර කිරීමටයි. එමෙන්ම පෙරහරක නිර්වින්දන වෛද්‍යවරයා ලෙස තනිව ක්‍රියා කිරීමටද ඔහු බලාපොරොත්තුව සිටියේය. මේ හීන බැලිල්ල නිසාම ඔහු එකල නිවසට පැමිණියේද කලාතුරකිනි. එහි අතුරු වාසිද තිබිණ. ඒ ඉඳහිට පැමිණෙන ගමනේදී පිටස්තර ඥාතියෙකු පැමිණි විට මෙන් ආගන්තුක සත්කාර හිමිවීමයි. පශු වෛද්‍ය තරිඳුගේ බිරිය වන එකල පෙම්වතිය වූ කුසලාට නම් මෙය එතරම් රිස්සුවේ නැත. වෙලාවක් කලාවක් නැතිව අලි ඇතුන් හමුවීමට යන තරිඳු මුණගැසීමට ඇයටනම් සති දෙක තුනකට පෙරවත් වේලාව වෙන් කරවා ගැනීමට සිදුවිය.

සියලු බාධක මධ්‍යයේ තරිඳු - කුසලා විවාහ මංගල්‍යය වෙනුවෙන් නැකැත් පරීක්ෂා කෙරිණ. අගෝස්තු මාසයේ දිනක් සහ ඔක්තෝබර් 18 වැනිද සුදුසු බව නැකැත්කරු දැන්වීය. පශු වෛද්‍ය තරිඳුගේ ස්ථාවරය වූයේ සිය උපන්දිනයද යෙදී ඇති ඔක්තෝබරයේ විවාහය පැවැත්විය යුතු බවයි. නමුත් උපන්දිනය යෙදී තිබීමේ විශේෂත්වයට වඩා නොකියූ හේතුවක් ඔහුට තිබිණි. එනම් අගෝස්තු මාසයේ යෙදෙන දළදා මාලිගාව, ගැටබරුව සහ සමන් දේවාල පෙරහර රාජකාරී නිවීසැනසිල්ලේ සිදුකිරීමට ඒ මාසය නිදහස්ව තබාගැනීමේ අවශ්‍යතාවයයි. ඔක්තෝබරයේ විවාහයට දින නියම කෙරුණද අලි පලහිලව් මිස පශු වෛද්‍ය තරිඳුට වෙනත් කිසිවකට ඉඩක් නොවීය. විවාහයේ සම්පූර්ණ බර මනාලිය සහ ඇගේ සොයුරියගේ කර මත පැටවිණ. මනාලයාගේ ඇඳුම් නිර්මාණය පවා සිදුවූයේ ඔවුන් අතිනි.

විවාහයට පෙර සිදුකරන ඡායාරූප ගැනීම හෙවත් ප්‍රී ෂූට් එක මුහුදු වෙරළක සිදුකිරීම මනාලියගේ සිහිනය විය. වැඩේ වරදින්නට යන බව වැටහී ගිය මනාලයා පැවසුවේ ඕනෑනම් අලියෙකු සමඟ පින්තූර ගමු කියාය. අවසානයේ මනාලියගේ අකමැත්ත හමුවේම ගිරිඋල්ලේ කාංචනා ඇතින්න සමඟ යුවළගේ ඡායාරූප ගැනීම සිදුකෙරිණ. එයද මහා වැසි මැදය.

විවාහයටද කෙමෙන් කෙමෙන් දින ළංවිය. ඊට සති දෙකක් පමණ තිබියදී සියලු වැඩ පසෙකලා මිතුරු සහායද ගෙන නිවස අස්පස් කිරීමට වෛද්‍ය තරිඳු තීරණය කළේය. මිදුලේ තණකොළ කප්පාදුව, නිවසේ තීන්ත ආලේපය ආදී භාරදූර රාජකාරී රැසකි. වැඩ පටන්ගත්තා පමණි. අලි මදිවාට හරක්ය. උදෑසන 9.45 පමණ වෙද්දී දුරකතන ඇමතුමකි. ඉන් කියැවුණේ කෑගල්ලේ එක්තරා දරුණු අලියෙකු දම්වැල් කඩාගෙන ඇත්ගොව්වාගෙන් මිදී ඇති බවයි. ඇමතුම ලැබෙන අවස්ථාව වනවිටද දඩබ්බරයා ජලනල පද්ධතියකට, වහලකට සහ නල ළිඳකට තදබල ලෙස හානි පමුණුවා තිබිණ. අවස්ථාවේ හැටියට අලි අල්ලන්න යනවා කියා ප්‍රසිද්ධ කිරීම නුවණට හුරු නැත. රැවුලත් ඕනෑය. කැඳත් ඕනෑය. එනිසා කිසිවකුටත් නොකියා පශු වෛද්‍ය තරිඳු සහායකයා සමඟ පිටත් වූයේ පැයක් ඇතුළත අලියා ඇල්ලීමේ අපේක්ෂාවෙනි. මොන පැයද? රාජකාරිය අවසන් වනවිට රාත්‍රී 7ද පසු විය. අවසානයේ හදිසියට වෛද්‍ය තරිඳු සිය කාමරය පිරිසිදු කළේ නොසෝදා තිබූ මේස් කුට්ටම් දුසිමක් පමණද ගින්නට පූජා කරමිනි.

වසරකට වරක් අලි ඇතුන්ට පිටගැස්මට බෙහෙත් විදිය යුතු බව සිහියට ආවේද විවාහයට ඔන්න මෙන්න තිබියදීය. එයද වෛද්‍ය තරිඳුගේ සහායක විසල්ගේ සිහි කැඳවීමෙනි. ඊට පෙර අවස්ථා කිහිපයකදීම උදුර ගලප්පත්ති විසින් එය සිහිපත් කරවනු ලැබූවද පශු වෛද්‍ය තරිඳුට ඒ සඳහා ඉඩක් නොවීය. අවසානයේ විවාහයට පෙර දිනයේ එයද අවසන් කිරීමට ඔහු තීරණය කළේය. විවාහයට පෙරදා මනාලියගේ නිවසට යාම චාරිත්‍රයයි. බුදුනුත් වැඳගෙන කෙමනත් බලාගන්නවා මෙන් කටයුතු දෙකම එකවර කරගත යුතුය. මනාලියගේ නිවසට යෑමෙන් පසු රාත්‍රී 8ට පමණ පිටත්ව අලි ඇතුන්ට පිටගැස්ම එන්නත විදීමට පශු වෛද්‍ය තරිඳු පිටත්ව ගියේය. ඒ තනිකඩ දිවියේ අවසන් අලි රාජකාරිය ලෙසිනි.

**රෂ්නිකා ලියනගේ**



F.A.Ads

ඔබට මුදල් හදිස්සියක්ද?
නැත්නම් ඔබේ වටිනා රන් භාණ්ඩ සින්න වෙන්න යනවාද?

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා
පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර
1% ක අඩුම පොලියට ලබා ගන්න
ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න
විශේෂ සහන රැසක් සමගින්
නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාලවේ

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | මීගමුව | 0766 227 056 |
| කොටහේන | 0702 539 382 | ගම්පහ | 0779 230 549 |
| වැල්ලවත්ත | 0710 870 686 | කළුතර | 0776 167 149 |
| ග්‍රෑන්ඩ්පාස් | 0742 379 739 | හලාවත | 0779 256 191 |
| මොරටුව | 0766 227 059 | මාතර | 0705 979 237 |
| පානදුර | 0767 952 286 | ගම්පොල | 0710 870 735 |
| වෙන්නප්පුව | 0710 869 378 | නාවලපිටිය | 0710 870 706 |
| ගාල්ල | 0705 979 274 | හැටන් | 0778 790 372 |
| කුරුණෑගල | 0766 227 061 | කෑගල්ල | 0703 583 363 |
| දිගන | 0778 156 738 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බේරුවල | 0740 920 356 | පුත්තලම | 0771 201 861 |
| මතුගම | 0771 201 860 | මහියංගනය | 0771 201 862 |
| මොණරාගල | 0771 201 852 | වත්තේගම | 0742 551 103 |
| බදුල්ල | 0771 201 863 | හපුතලේ | 0760 677 018 |
| කල්පිටිය | 0761 605 803 | මාතලේ | 0702 539 389 |
| කටුගස්තොට | 0779 476 206 | තලවකැලේ | 0710 871 009 |
| නාඋල | 0763 226 230 | රාගල | 0710 870 703 |
| කන්තලේ | 0742 572 585 | පූඩලූඔය | 0740 929 541 |
| පොතුවිල් | 0771 201 855 | මස්කෙලිය | 0760 909 822 |
| වැලිමඩ | 0778 764 751 | පුස්සැල්ලාව | 0742 531 360 |
| බගවන්තලාව | 0742 588 267 | අච්චුවේලි | 0743 865 368 |
| ආගරපතන | 0742 499 563 | මට්ටක්කුලිය | 0742 127 665 |
| ඇලකන්ද | 0771 201 857 | | |
| හාවඑළිය | 0773 394 209 | | |

# කකුල් තුනේ කනප්පුවකින් ප්‍රසිද්ධ රගර් ක්‍රීඩක ටෝනි මාටින්ගේ



**ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න යනු විද්‍යාත්මකව සහ කලාත්මකව පැමිණිල්ල මෙහෙයවීමට නම් දරා ඇති විශිෂ්ටයෙකි. කොබෙයිගනේ රූප සුන්දරී ඝාතනය, ටෝනි මාටින් ඝාතනය, මහාධිකරණ විනිසුරු සරත් අඹේපිටිය ඝාතනය සහ හෝකන්දර සය පුද්ගල ඝාතනය ආදී ආන්දෝලනාත්මක නඩු රැසක පැමිණිල්ල මෙහෙයවීමට ඔහු දායක වී ඇත. සිය අත්දැකීම් නිර්මාණශීලීව යොදා ගනිමින් නීතියද පැහැදිලි කරමින් ඔහු විසින් රචිත 'යළි මැවෙන අපරාධයක්' කෘතියේ සංස්කරණය කළ දෙවන මුද්‍රණයද පසුගියදා ජනගත කෙරිණ. ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න නීතිපති දෙපාර්තමේන්තුවෙන් පසුගිය වසරේදී සමුගත්තේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්වරයකු ලෙස කටයුතු කරමින් සිටියදීය. මේ, ඔහුගේ අත්දැකීම් අලලා ලියැවෙන ලිපි මාලාවේ දෙවැන්නයි.**



යමක්කමක් ඇති පවුලක ඉපදුණ කඩවසම් තරුණයකු වූ ටෝනි මාටින් සුප්‍රසිද්ධ හැව්ලොක් ක්‍රීඩා සමාජයේ රගර් ක්‍රීඩකයෙකි. ඔහුට මුදල්හදල්වලින්ද කිසිඳු හිඟයක් නොවීය. වයස අවුරුදු 34ක් වූ ඔහු සිය මව සමඟ කොළඹ හැව්ලොක් ක්‍රීඩා සමාජය අසල නිවසක වාසය කළේය. නිවසේ ප්‍රධාන කොටසේ මව වාසය කළ අතර ටෝනි වාසය කළේ එහිම වූ ඇනෙක්සියේය. 1986 මැයි මස 16 වනදා ටෝනි මාටින්ගේ දිවියට තීරණාත්මක විය. අලුයම 2.450 පමණ ටෝනි මාටින්ගේ මවට ඇසුණේ **"මමී මමී"** යනුවෙන් කලබලකාරී කෑගැසීමකි. අනතුරක සේයාව ඉව වැටුණු බැවින් මව වහාම පොලිසියට ඇමතුමක් දුන්නාය. ඔවුන්ගේ නිවසට පොලිස් නිලධාරීන් කණ්ඩායමක් පැමිණීමට විනාඩි 15ක් පමණ කාලයක් ගතවිය. ඔවුන්ගේ නිරීක්ෂණයට දුරදීම හසුවූයේ හයිලෙවල් මාර්ගයට මුහුණලා ඇති යකඩ ගේට්ටුව තරමක් විවරව ඇති බවයි. යකඩ ගේට්ටුව වසා ඇතිවිට ප්‍රධාන මාර්ගයේ සිට බලන අයෙකුට ඉඩමේ අභ්‍යන්තරය නොපෙනේ. විවෘත කර තිබූ ගේට්ටුවෙන් ඇතුල් වූ පොලිස් නිලධාරීන් දුටුවේ ටෝනි මාටින්ගේ මෝටර් රථය ඇනෙක්සියේ ඉදිරිපස කොටසේ නවතා ඇති අයුරුයි. ඇනෙක්සියේ දොර අසල තිබූ ජනේලයේ සිට ප්‍රධාන ගේට්ටුව දක්වා වූ පාරේ රුධිරය සහිත පාවහන් සලකුණුය. ඇනෙක්සියේ දොර වසා තිබිණ. එහෙත් යාබද ජනේලයේ පියන විවෘත කර තිබූ අතර, එහි ලී රාමුවට සම්බන්ධ යකඩ රාමුව ඉවත් කර බිම දමා ඇති අයුරුද පොලිස් නිලධාරීහු නිරීක්ෂණය කළහ. කිසිවකු එම ස්ථානයෙන් ඇතුළු වී හෝ පිටවී ඇති බව පෙනී යයි.

ටෝනි මාටින්ගේ මව වාසය කරන්නේ යාබද ප්‍රධාන නිවසේය. පොලිස් නිලධාරීහු ඇනෙක්සියේ දොරෙන් ඇතුළු නොවී මවගේ නිවස වෙත ගොස් ඇයට කතා කළහ. ප්‍රධාන නිවස සහ ඇනෙක්සිය අතරද දොරක් ඇත්තේය. එය ආවරණය වන සේ ප්‍රධාන නිවසේ අල්මාරියක් තබා ඇත. මවගේ නිවසට ගිය පොලිස් නිලධාරීන් ටෝනි මාටින් වාසය කළ ඇනෙක්සියට ප්‍රවිෂ්ට වූයේ අල්මාරිය ඉවත් කර එතැන තිබූ දොර විවෘත කිරීමෙනි. අල්මාරියේ බර නිසාම මහලු මවට එය ඉවත් කළ නොහැකිය. එමෙන්ම ඈ ඒ සඳහා උත්සාහයක් හෝ දරා නැත. අල්මාරියේ බරට වඩා අනතුරෙහි බර හදවතට දැනුණ නිසා පොලිසියෙන් පැමිණෙන තෙක්ම ඈ සියල්ල දරා ගනිමින් උපේක්ෂාසහගතව සිටියාද විය හැකිය. පොලිස් නිලධාරීන් මවගේ ගෙදර දොර ඇර ඇනෙක්සියට එබී බැලුවා පමණි. ආරෝහ පරිණාහ දේහයකට හිමිකම් කියන රගර් ක්‍රීඩක ටෝනි මාටින් සිය ඇඳ අසල බිම නිරුවතින් වැටී සිටියේය. ඔහුගේ සිරුරෙන් ගලාගිය රුධිරය ඒ අවට දැකිය හැකි විය. අපරාධකරුවන් ඒ වනවිටද එම ස්ථානයෙන් පලා ගොසිනි.

**"මේ භූමිය මැනැවින් නරඹා, රස විඳ ඔබ ආපසු යන්න. ඔබ ගෙනා කිසිවක් මෙහි තබා නොයන්න. එමෙන්ම, මෙහි ඇති කිසිවක්ද රැගෙන නොයන්න. ඔබ ගෙනා පියසටහන් පමණක් මෙහි තබා යන්න."** ප්‍රසිද්ධ වනාන්තරයක පිවිසුම් ස්ථානයේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීමකි. අපරාධ ස්ථානයක් සම්බන්ධයෙන්ද එය අදාළය. අපරාධයක් සිදුවූ තැනකට පසුව පැමිණෙන අයෙකුගේ පියසටහන් පවා වැදගත් සාක්ෂි විනාස කරන්නක් විය හැකිය. අපරාධ ස්ථානයක් යනු සාක්ෂි උල්පතකි. ටෝනි මාටින් ඝාතනය පරීක්ෂා කිරීමට පැමිණි පොලිස් නිලධාරීහු බොහෝ ප්‍රවේසම්සහගත වූහ. යම්හෙයකින් ඔවුන් අපරාධකරුවන් ඇනෙක්සියට පිවිසි තැනින්ම ඇතුළු වූවානම් වටිනා සාක්ෂි යටපත් වීමට ඉඩ තිබිණ. ඇනෙක්සියට ඇතුළුවීමට භාවිතයට නොගන්නා දොරකින් ඇතුළු වීම ඔවුන් විසින් ගනු ලැබූ ප්‍රඥාවන්ත තීරණයකි. ඇල්බට් අයින්ස්ටයින්ගේ සුප්‍රසිද්ධ ප්‍රකාශයක් තිබේ. **"ලෝකය භයානකය. ඒ, විසම පුද්ගලයින් නිසා නොව විසම පුද්ගලයින් සම්බන්ධයෙන් අනෙකුත් අය විසින් කිසිවක් නොකරනු ලබන නිසාවෙනි."** එනිසා ලෝකය අනතුරුදායක තත්ත්වයෙන් මුදාගැනීම පිණිස පොලිස් නිලධාරියා තමා සතු රාජකාරිය නොපිරිහෙළා ඉටුකර අපරාධකරුවන්ට එරෙහි සාක්ෂි එකතු කරගත යුතු බව ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න පෙන්වා දෙයි. අපරාධ ස්ථානයක් පරීක්ෂා කිරීමේදී පොලිසිය එය සිහිතබා ගන්නේය.

රගර් ක්‍රීඩක ටෝනි මාටින් ඝාතන නඩුව පසුගිය දශක කිහිපය පුරාම මෙරට දැඩි අවධානයට ලක්වූවකි. ශ්‍රී ලංකාවේ සාක්ෂි නීතිය සම්බන්ධයෙන්ද එය ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

අපරාධය සිදු වූ ද පුතුගේ කෑගැසීම ඇසූ මව නිවසේ විදුලි පහන් දැල්වීමට ක්‍රියා කළාය. ඒ අතර කලබලයක් සහ කිසිවකු පැන යන බව ඇයට ඇසුණද ඈ කිසිවක් දුටුවේ නැත. එනිසා පොලිසියට ඉතිරිව තිබුණේ අපරාධ ස්ථානයේ සාක්ෂි පරෙස්සමට එක්රැස් කරගැනීමයි.

මවගේ නිවස දෙසින් ඇනෙක්සියට පිවිසි පොලිස් නිලධාරීන්ට පැහැදිලි වූයේ මියයාමට පෙර ටෝනි මාටින් දැඩි සටනක යෙදී ඇති බවයි. ඇනෙක්සියේ තිබූ රුධිරය සහිත ඇඟිලි සලකුණුද ඔවුහු නිරීක්ෂණය කළහ. එහෙත් ඒ පිළිබඳ තමන් විශේෂඥයින් නොවන බැවින් ඔවුන්ට ඉවසීමට සිදුවිය. උදෑසන 9 පමණ වනවිට අධිකරණ වෛද්‍ය නිලධාරී, රජයේ රස පරීක්ෂක, ඇඟිලි සටහන් පරීක්ෂක නිලධාරීන් ආදීහු එම ස්ථානයට පැමිණියහ. පසුව මෘත දේහය රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත රැගෙන යාමට පියවර ගැනිණ. අනතුරුව පරීක්ෂා කිරීමේදී, කාමරයේ අතුරා තිබූ කාපට් එක යට තිබී මිටියක යකඩ හිස සහිත කැඩී ගිය ලී කොටසක් සොයා ගැනිණ. එහි ඉතිරිය එම ස්ථානයේ නොවීය. තවත් පොලු කැබලි තුනක්ද තිබිණ. අධිකරණ වෛද්‍ය පරීක්ෂණයේදී ගෙලෙහි කැපුම් තුවාල මෙන්ම පොලිසිය භාරයට ගත් මිටි කැබැල්ලෙන් පහර දුන් බවට සැක කළ හැකි සලකුණුද හිසේ නිරීක්ෂණය කළ හැකි විය. ඒවාද ඇතුළුව සිරුර පුරා තුවාල 88 කි.

ඇසූ දුටු සාක්ෂි කිසිවක් නොමැතිව අපරාධකරු අනාවරණය කරගැනීමේ අභියෝගය පොලිසිය හමුවේ විය. ටෝනි මාටින්ට අත්උදව් දෙන්නට ගෙදරට ආ ගිය ජයසේන නමැත්තාගේ ප්‍රකාශයක් ඒ සඳහා මග පෑදුවේ ඒ අතරයි. සිදුවීමට පෙරදා රාත්‍රියේ ජයසේන ටෝනි මාටින්ගේ ඇනෙක්සියෙහි වූ නාන කාමරයෙහි ඇඳුම් සෝදමින් සිටියේය. ඒ අවස්ථාවේදී දොර දෙසින් ඇසුණේ "ටෝනි ටෝනි" යනුවෙන් අමතන හඬකි.

**"අන්න චීනා ඇවිත් ඉන්නවා. එක්කන් එන්න."**

ටෝනි නාන කාමරයේ රෙදි සේදූ ජයසේනට දැනුම් දුන්නේය. ඒ අනුව ඇනෙක්සියේ දොර විවර කළ ජයසේනට පෙනී ගියේ චීනා සමඟ තවත් අයෙකු සිටින බවයි. හෙතෙම ඒ බව සිය ස්වාමියාට දැනුම් දුන්නේය.

**"හරි. ඒ දෙන්නටම එන්න දෙන්න. ඒත් චීනව විතරක් කාමරේට ගේන්න."**

මේ දෙදෙනාම ටෝනි මාටින්ට පසුව හැව්ලොක් ක්‍රීඩා සමාජයේ රගර් කණ්ඩායමට සම්බන්ධ වූවෝ වෙති. චීනා ටෝනි මාටින්ගේ කාමරයට ගොස් විනාඩි දහයක් පමණ කතාබහ කරන අතර කීගර් සාලයේ අසුන්ගෙන සිටියේය. පසුව දෙදෙනාම පිටව යන අතර ජයසේන ඒ දෙදෙනා පිටුපසින් ගමන් කළේය. එහිදී ඔහුට දැකගත හැකි වූයේ අගුලු දමා තිබූ ගේට්ටුව විවර කර ඇති බවයි. එම ගේට්ටුව පිටතින් විවෘත කිරීමට නොහැකිය.



# ...තකයින් ...සායාගත් හැටි

**චීනා හෙවත් චුයි පොං ෂික් දෙවැනි විත්තිකරු ලෙස අත්අඩංගුවට ගත් අවස්ථාවේ ඔහුගේ අතේ සීරීම් සලකුණු විය. මරණකරු හා පොර බැදීමේදී එවැනි තුවාල විය හැකි බවද තහවුරු කෙරිණ. දෙවැනි විත්තිකරු විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් පැවසුවේ සිය අතේ සීරීම් බල්ලා පැනීමෙන් සිදු වූ බවයි. එහෙත් ඒ බව තහවුරු කිරීමට විත්තිය අපොහොසත් විය**

පැමිණි දෙදෙනා අතම හෙල්මට් තිබුණද, මෝටර් සයිකලයක් දැකීමට නොතිබිණ. දෙදෙනා ඈතට යනතුරු බලා සිටි ජයසේන නැවත ඇනෙක්සියට පැමිණ ටෝනි මාටින් ඇමතීය.

"සර් ඒ දෙන්නා ගේට්ටුවෙන් පැනලා වගේ ඇවිත් තියෙන්නෙ. හෙල්මට් තිබුණට බයික් එකකුත් නෑ."

"මං අද හවසත් ක්ලබ් එකට ගිහින් චීනට බැනලා ආවේ. මිනිහ මගෙන් සල්ලි වගයක් ගත්තා. ඒ ටික තවම දුන්නෙ නෑ."

චීනා මුදල් ලබාගෙන තිබුණේ සිය මෝටර් රථය ටෝනි මාටින්ට උකස් තැබීමෙනි. එහි පොත ටෝනි මාටින් සන්තකයේ තිබිණ. ඒ පිළිබඳව ඇතිවූ ආරවුල මත මේ ඝාතනය සිදුකිරීමට පෙළඹවීමේ හේතුවක් විය හැකිය. ඒ අනුව අදාළ පුද්ගලයින් කෙරෙහි පරීක්ෂකයින්ගේ අවධානය යොමු විය. ඔවුන්ගේ පැමිණීම අපරාධය කිරීමට පෙර සූදානමක් ලෙස සලකා පරිවේෂණීය සාක්ෂියක් ලෙස අදාළ කර ගැනිණ.

එහෙත් ඔවුන් වැරදිකරුවන් කිරීමට එය ප්‍රමාණවත් නොවේ. දෙදෙනා ගැන සොයා බැලුවද කිසිඳු හෝඩුවාවක් දැනගන්නට ලැබුණේ නැත. චුයි පොං ෂික් හෙවත් චීනා කෑගල්ලේ ඥාති නිවසකට ගොස් ඇතැයි ආරංචි විය. රිකාඩෝ බ්‍රැඩ්ලි කීගර් දින කිහිපයකට පසු සොයාගැනීමට හැකි විය. කීගර්ගේ නිවසේ කුස්සියෙහි කනප්පුවක් තිබිණ. එය කකුල් හතරේ එකක් වුවද කීගර් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ එහි තිබුණේ කකුල් තුනක් පමණි.

ඒ අනුව, මුට්ටු පිළිබඳ රජයේ විශේෂඥවරයාගේ උපදෙස් ලබාගැනිණ. ඔහු පෙන්වා දුන්නේ අපරාධ ස්ථානයෙන් සොයාගත් පොලු කැබලි තුන එකතු කළ විට තනි පොල්ලක් සෑදෙන බවයි. එය කීගර්ගේ නිවසේ වූ කනප්පුවේ ඉතිරි කකුල බව තහවුරු කෙරිණ. එයද පරිවේෂණීය සාක්ෂියකි. කීගර් පළමු විත්තිකරු කෙරිණි. පළමු විත්තිකරු අත්අඩංගුවට ගෙන පරීක්ෂා කිරීමේදී අපරාධ ස්ථානයෙන් සොයාගැනුණු ඇඟිලි සටහන් ඔහුට සසැඳිණ. ඉන් තහවුරු වූයේ අපරාධය කිරීම සඳහා ඔහුට අවස්ථාවක් තිබූ බවයි. පැමිණිල්ල විසින් කැඳවනු ලැබූ ඇඟිලි සටහන් පරීක්ෂකවරයාගේ සාක්ෂිය අසත්‍ය බව පැවසීමට විත්තිය විසින් ව්‍යාධිවේදය සම්බන්ධ විශේෂඥයකුගේ මතය යොදගැනීමට උත්සාහ දරනු ලැබීය. එහෙත් ඔහු ව්‍යාධිවේදය සම්බන්ධ විශේෂඥයකු මිස රුධිරය සම්බන්ධ විශේෂඥයකු නොවන බව පෙන්වාදීමෙන් ඔහු විශේෂඥ ගණයෙහිලා සැලකිය හැකි සාක්ෂිකරුවකු නොවන බව අධිකරණයට ඒත්තු ගැන්වීමට පැමිණිල්ල සමත් විය.

චීනා හෙවත් චුයි පොං ෂික් දෙවැනි විත්තිකරු ලෙස අත්අඩංගුවට ගත් අවස්ථාවේ ඔහුගේ අතේ සීරීම් සලකුණු විය. මරණකරු හා පොර බැදීමේදී එවැනි තුවාල විය හැකි බවද තහවුරු කෙරිණ. දෙවැනි විත්තිකරු විත්ති කූඩුවේ සිට ප්‍රකාශයක් කරමින් පැවසුවේ සිය අතේ සීරීම් බල්ලා පැනීමෙන් සිදු වූ බවයි. එහෙත් ඒ බව තහවුරු කිරීමට විත්තිය අපොහොසත් විය. නඩුවට පෙර කළ වැඩිදුර පරීක්ෂණවලදී ඔවුන්ගෙන් තවත් තොරතුරු හෙළිවිය.

"වැල්ලවත්ත ධර්මාරාම ඇළේ මල්ලක් තියෙනවා. අපට ඒක විසි කරපු ඉසව්ව පෙන්නන්න පුළුවන්."

ඒ අනුව අදාළ මල්ල සොයාගැනිණ. එහි තිබූ දේ අතර අපරාධ ස්ථානයෙන් සොයාගත් මිටියේ කැඩී ගිය කොටස යැයි සැක කළ හැකි ලී කැබැල්ලක්ද විය. ඇළෙන් සොයාගත් මිටි කැබැල්ලද අපරාධය වූ තැන වූ මිටියද එකම මිටිය බව තහවුරු විය.

කෙසේ වෙතත් පොලිසියට ලබාදෙන පාපොච්චාරණයක් අධිකරණය ඉදිරියේ සාක්ෂියක් ලෙස පිළි නොගැනේ. එහෙත් ඒ ඔස්සේ යම් කිසිවක් සොයාගන්නේනම්, ඒ සොයාගැනීමට අදාළ සමීපතම වාක්‍ය සාක්ෂි ආඥා පනතේ 27 වන වගන්තිය යටතේ සාක්ෂියක් ලෙස ඉදිරිපත් කළ හැකිය.

දෙවන විත්තිකරුගේ ප්‍රකාශයක් මත කිරුළපන සරණංකර පාරේ ඇළේ තිබී ප්ලාස්ටික් බෑගයක්ද සොයාගැනිණ. එහි වූයේ පිරිමි අඳින ජැකට්ටුවකි. එහි සාක්කුවක තිබී ඉස්කුරුප්පු ඇණ හයක්ද හමුවිය. ඒ ඇණ හය ටෝනි මාටින්ගේ නිවසින් ගලවා ඉවත් කළ ජනේලයට අයත් බවද තහවුරු කෙරිණ.

භාණ්ඩ මත තහවුරු කෙරෙන නඩුවකදී නඩු භාණ්ඩ පැවතීම අත්‍යවශ්‍ය වේ. එහෙත් මෙම නඩුවට අදාළ භාණ්ඩ ගබඩා කර තිබූ කාමරයේ හදිසි ගින්නක් ඇති වී එහි වූ නඩු භාණ්ඩ විනාශ විය. කෙසේ වෙතත් ඒ වනවිට අදාළ භාණ්ඩ රජයේ රස පරීක්ෂක වෙත යවා වාර්තා ලබා අවසන්ව තිබිණ. එහෙත් ඒවා අධිකරණයට යොමු කර තිබුණේ නැත. එසේ වුවද දැඩි පරිශ්‍රමයක් දරා භාණ්ඩවල අනන්‍යතාව ඔප්පු කිරීමට පැමිණිල්ලේ නීතිඥවරු සමත් වූහ.

මේ සියල්ලට අමතරව තවත් සාක්ෂිකරුවකු ප්‍රකාශ කළේ සිදුවීමට අදාළ දිනයේ විත්තිකරුවන් දෙදෙනා සහ තමා පාන්දර වන තෙක් කොළඹ නගරයේ ඇවිදිමින් සිටි බවයි.

"අපි එදා රුපියල් තිස්පන්දහක විතර බිව්වා. ඊටපස්සෙ අපි ගෙවල්වලට යන්න පිටත් වුණා. මුලින්ම මාව නිවසට ඇරලුවා. ඊටපස්සෙ වාහනේ හිටියේ චීනයි කීගරුයි විතරයි."

මේ සියලු දේ සිදුව ඇත්තේ අපරාධ ස්ථානයට ආසන්නවය.

සොයාගත් මල්ලක තිබී ටෝනි මාටින්ගේ යැයි සැක සහිත තොප්පියක්ද හමුවිය. එය සනාථ කරගත හැක්කේ ජයසේනගෙනි. එහෙත් කටට උත්තරය දෙන ආකාරයේ ප්‍රශ්න අසමින් එය තහවුරු කළ නොහැකිය. එනිසා පරෙස්සමට ප්‍රශ්න කළ යුතුය.

"මහත්තයා උදේට මොකද කරන්නෙ?"

"දුවන්න යනවා."

"කොහෙටද යන්නෙ?"

"ගෝල්ෆේස්."

"පිනිබබාද දුවන්නෙ?"

"නෑ. තොප්පියක් දාගෙන යනවා."

"ඒ තොප්පිය පහළ උසාවියෙදි හඳුනාගත්තා."

"ඔව්."

පැමිණිල්ලට ඇසීමට තිබුණේ එපමණකි. අනතුරුව විත්තියේ නීතිඥවරයාගේ ප්‍රශ්න කිරීම්ය.

"ජයසේන, තමන් වැඩ කරන්නෙ කොළඹ මහරෝහලේ?"

"ඔව්."

"මහරෝහල ගාව පෙට්ටි කඩ තියෙනවා."

"ඔව්."

"ඒ පෙට්ටි කඩවල තොප්පි විකුණන්න තියෙනවා?"

"ඔව්."

"මේකත් ඒ වගේ තොප්පියක්ද?"

"ඔව්."

එතැනින් ප්‍රශ්න කිරීම නැවතුණේනම් තොප්පිය ටෝනි මාටින්ගේම තොප්පිය බව තහවුරු නොවීමට ඉඩ තිබිණ. එහෙත් විත්තිය තවදුරටත් පැමිණිල්ලේ සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කළ නිසා පැමිණිල්ලට වාසිදායක ප්‍රකාශයක් නිකුත් කෙරිණ.

"එහෙනං තමාට බැහැනෙ මේක ටෝනි මාටින්ගෙ තොප්පිය කියන්න?"

"ඇයි සර් කියන්න බැරි? ඕක දවසක්දෘ ඉරුණා. එතකොට මටයි දුන්නෙ ඒක මහලා ගේන්න කියලා. පොලිසිය හොයාගෙන තිබුණ තොප්පියෙ ඒ මැහුම් තිබුණා."

පැමිණිල්ලට විත්තියේ සහාය හිමිවූයේ ඒ අමතර ප්‍රශ්නයෙනි.

දෙවැනි විත්තිකරු සිදුවීමෙන් පසු නැවතුණේ කෑගල්ලේ ඥාති කාන්තාවකගේ නිවසකය. ඒ අතරතුර ඝාතන සිදුවීම සම්බන්ධ ප්‍රවෘත්තිය පුවත්පත්වල පළවෙයි. දෙවැනි විත්තිකරු ඒ පුවත කියවා පුවත්පත පසෙකින් තබයි.

"ඔයා මේ රගර් ක්‍රීඩකයාව දන්නැද්ද?" එම ප්‍රවෘත්තිය දකින ඥාති කාන්තාව චීනාගෙන් අසයි. චීනා පැහැදිලි පිළිතුරක් නොදෙයි. එමෙන්ම එකම කණ්ඩායමේ ක්‍රීඩා කරන සගයාගේ අවමංගල්‍ය උත්සවයට හෝ සහභාගී නොවී චීනා කෑගල්ලේ රැඳී සිටී. එයද සැකකටයුතුය.

නඩුවේ වෛද්‍ය සාක්ෂිවලදී හෙළිවූයේ ඝාතනය කිරීමට දෙදෙනෙකුවත් සහභාගී වී ඇති බවයි. අපරාධ ස්ථානයේ මිටියක් තිබූ බව කීම දැඩි සේ අභියෝගයට ලක්විය. අපරාධ භාණ්ඩයක් ලෙස උසාවිය භාරයට ගත් භාණ්ඩ ගිනිගෙන තිබීම එයට හේතුවයි. එහෙත් අධිකරණ වෛද්‍ය නිලධාරියා මෘතදේහය පරීක්ෂා කරන අවස්ථාවේ සිරුරේ පපුව මත මිටියේ කොටස තබා ඡායාරූපයක් ලබාගෙන තිබිණ. එයද පැමිණිල්ලට වාසිදායක විය.

සියලු හේතු එකිනෙක අමුණමින් සංකීර්ණ ක්‍රියාදාමයක් ඔස්සේ විත්තිකරුවන් වරදකරුවන් බව තහවුරු කරගැනීමට හැකියාව ලැබිණ. අභියාචනාධිකරණය හමුවේ ඔවුන් ගොනුකළ අභියාචනයද නිෂ්ප්‍රභා කෙරිණ. පසුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනුකළ අභියාචනයද ප්‍රතික්ෂේප විය.

ණයට දීමෙන් මුදලත් මිතුරාත් අහිමි විය හැකිය. එපමණක් නොව ජීවිතයට පවා හානිවීමට ඉඩ තිබේ. එය කෙසේ වුවද, කෙතරම් සැලසුම් කළද අපරාධකරුවකුට සදාකාලිකව සැඟව සිටීමටද නොහැකිය. දශක ගණනාවක් තිස්සේ මෙරට නීති ක්ෂේත්‍රයේ වැදගත් භූමිකාවක් ඉටු කරන ටෝනි මාටින් නඩුව ඊට හොඳම උදාහරණයකි.

■ රෂ්නිකා ලියනගේ

මහාචාර්ය අත්තනායක එම් හේරත් කියයි

# ඇස් ගෙඩි දෙකට හෙණ ගහලද මව්වරුනේ??

පන්සිය පනස් ජාතක පොතේ තියෙන හැත්තෑ හත්වැනි ජාතකය තමයි මහා සුපින ජාතකය. මේ ජාතක කතාවෙන් කියැවෙන්නේ කොසොල් රජතුමා දැකපු හීන දසයක් ගැන. මේ හීන දසයෙන් රජතුමා දැකපු දෙවැනි හීනෙ තමයි ඉතාම කුඩා ගස්වැල්වල මහා විශාල පල හටගන්න එක. මුලින්ම කොසොල් රජතුමා දැකලා තියෙන්නේ පුංචිම පුංචි කොස් ගහක මහා විශාල කොස් ගෙඩියක් හැදිලා ගෙඩියේ බරට ගහ කඩාගෙන බිම වැටෙන හැටිලු. ඊළඟට දැකලා තියෙන්නෙ අර විදියටම අඩියක් විතර උස පුංචි වට්ටක්කා වැලක මහා විශාල වට්ටක්කා ගෙඩියක් හැදිලා වට්ටක්කා ගෙඩියේ බරට වැල කඩාගෙන බිමට වැටෙන විදියලු. කොයිතරම් කල්පනා කළත් අගමුල ලිහාගන්න බැරිවුණු රජතුමා ශාන්ති බ්‍රහ්මයාට එන්න කියලා මේ ගැන අහලා තියෙනවා. ඒ ඇහුවා කියලත් පලක් නොවුණු තැන රජතුමා බුදුන්වහන්සේව බැහැදකින්න ගිහින් "අනේ ස්වාමීනි මා කෙරේ අනුකම්පාවෙන් මේ භයංකාර සිහිනය ගැන යමක් පවසන්න" කියලා කිව්වලු. ඒ වෙලාවේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ ඉඳපු බුදුන්වහන්සේ උන්වහන්සේගේ දෑත් අපේ රට දිහාවට දිගු කරලා මෙන්න මෙහෙම දේශනා කළා කියනවා. "මහරජ, මේ ඔබටවත්, ඔබේ රාජ්‍යත්වයටවත්, බවභෝගවලටවත් සිදුවන හානියක පෙරනිමිති හඟවන සිහිනයක් නොව, එය මතු අනාගතයේදී අසල්වැසි ලංකාද්වීපයේ සිදුවන විපතක් ගැන හැඟවෙන සිහිනයක්" කියලා. කොසොල් රජතුමා තවදුරටත් විස්තර අහද්දි උන්වහන්සේ දේශනා කළේ මතු අනාගතයේදී අසල්වැසි ලංකාද්වීපයේ ඉතා පුංචි දරුවන් අඩු වයසින් අවාහවිවාහ කටයුතු කරගෙන දරුවන් සාදන බවක්. ඒ විතරක් නෙවෙයි දරු කළල විනාශ කිරීමත්, දෙමාපියන් විසින්ම තමාගේ දුවා දරුවන්ව කාසිපනම්වලට විකුණන බවකුත් බුදුන්වහන්සේ කොසොල් රජතුමාට පවසලා තිබුණා.

ජාතක කතා පොත හොඳින් කියවලා තියෙන ඕනම කෙනෙකුට මේ මහා සුපින ජාතකයෙන් කියැවෙන කොසොල් රජතුමාගේ හීන දසය ගැන ආයේ අමුතුවෙන් කියන්න දෙයක් නෑ. ඒත් අද අපි කතා කරන්න යන මාතෘකාවත් ඊටම සමාන එකක් නිසා ඒ ගැනත් ටිකක් මතක් කරලම කතාව පටන්ගන්න හිතුවා.

පහුගිය දවස්වල අවුරුදු 14-18 වගේ වයස්වල පහුවෙන බාලවයස්කාර දියණිවරු වැසිකිළිවල, නානායම්වල තනිවම දරුවන් බිහි කරගත්තු හැටි, ගබ්සා කරගත්තු හැටි ගැන කතා බොහොමයක් අපිට අහන්න දකින්න ලැබුණා. තිස්සමහාරාම ප්‍රදේශයේ අවුරුදු 15ක පාසල් ශිෂ්‍යාවක් තමන්ගේ නිවසේදිම රහසිගතව දරුවෙකු බිහිකිරීම මීට ආසන්නතම සිදුවීමක්. ඒ වගේම අද වෙනකොට දවසින් දවස ළමා මව්වරුන්ගේ වැඩිවීමකුත් වාර්තා වෙනවා. ඒ වගේම දෙමාපියන් විසින්ම තමන්ගේ දියණියව මුදලට අලෙවි කිරීමත්, පියා විසින් තමන්ගේම දියණියට අතවර කිරීම වැනි අවාසනාවන්ත සිදුවීම් ගැන ඕනවටත් වඩා අහන්න දකින්න තියෙනවා. ඒ විදියට තමන්ගේම අවුරුදු 15ක දියණියව මව විසින්ම මුදලට අලෙවි කරපු පුවතක් ගැන ඊයේ පෙරේදා මාධ්‍ය මගින් වාර්තා කළා මතක ඇති.

මේ සියල්ලම දිහා හොඳින් බැලුවම පේන්න තියෙන්නේ අද දියණියන්ට හරිහමන් ජීවිත අවබෝධයක්, ලිංගික අධ්‍යාපනයක් ලබාගන්න විදියක් නෑ කියන එක. අද දියණිවරුන්ගේ මේ තත්ත්වයට හේතුව දෙමාපියන්ගේ වරදද? නැතිනම් සමාජයේ වරදද?


ඒ ගැන මේ කතාබහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අත්තනායක එම්. හේරත් මහතා සමඟින්.

මේ මහනුවර පළාතෙ මම දන්න කියන පවුලක දුවෙකුට සිද්ධවුණු දෙයක් කියලම මම අද කතාව පටන්ගන්නම්.

ඒ දුවගේ තාත්තා ව්‍යාපාරිකයෙක්. අම්මා වෛද්‍යවරියක්. ඒ නිසා තාත්තා ව්‍යාපාර එක්ක ඔට්ටු වුණා. අම්මත් වෛද්‍යවරියක් නිසා අර දුව ගැන ගොඩක් හොයන්න බලන්න වෙලාවක් තිබුණෙ නෑ. කොහොමහරි මේ දරුවා ගෙදරට හොරෙන් ප්‍රේම සම්බන්ධයක් පටන් අරන් තිබිලා. කාලෙත් එක්ක ඔය සම්බන්ධය හිතුවටත් වඩා දුරදිග ගිහිල්ලා මේ දුවට දරුවෙක් ලැබෙන්න ඇවිල්ලා තිබුණා. ඔන්න ඊටපස්සේ තමයි අර අම්මයි තාත්තයි කරපු වැඩ සේරම නවත්තලා දාලා එලොව මෙලොව නැති දුවගේ බඩේ ඉන්න දරුවගේ තාත්තා කවුද කියලා හොයන්න පටන්ගත්තේ. ඒත් මේ ගෑනු දරුවා නෙවෙයි ඒ ගැන කටින් කෙළ බිඳක් හෙළලා තිබුණේ.

ගහලා, බැනලා බය කරලා ඔය මොන විදියකින් ඇහුවත් මේ දුව කිසිම දෙයක් කියලා නෑ. ඒ දරුවට ගහලා බැනලා හෙම්බත් වෙලා බැරිම තැන අර මහත්තයයි, නෝනයි මා ළඟට ඇවිල්ලා කිව්වා **"අනේ බුදු සර්, කොහොමහරි මේ දරුවගේ හිත හදලා මේ ගැන විස්තරයක් අහලා කියන්න සර්ට පින් සිද්ධවෙයි"** කියලා. පස්සේ මම මේ දුවට ඉතාමත් කාරුණිකව අවවාද කරලා, යම් යම් දේවල් තේරුම් බේරුම් කරලා දීලා මේ ගැන කරුණු කාරණා ටිකක් අහගත්තා. ඔන්න එතකොටයි මේ දුව කිව්වේ ලැබෙන්න ඉන්න දරුවගෙ තාත්තත් ඒ දැරිවිගේ ටියුෂන් පන්තියේම ඉගෙනගත්ත සමවයසේ පිරිමි ළමයෙක් කියලා. එතැනින් එහාට ඒ ප්‍රශ්නෙට මම මැදිහත් වුණේ නෑ.

නමුත් ඒ දෙමව්පියෝ දෙන්නට ඕනකම තිබිලා තියෙන්නේ අර දුවට හොඳ උසස් අධ්‍යාපනයක් දෙන්න. ඒකට බාධාවක් වෙන නිසා ඔය ගම්පහ පළාතේ ගබ්සා කරන තැනකට එක්කගෙන ගිහිල්ලා කුසේ හිටපු දරු පැටියාව ගබ්සා කරලා තිබුණා. ඒ කරලා අර දුවව උසස් පෙළ විභාගෙට වාඩි කරවලා තිබුණා. ආපහු ටික කාලෙකට පස්සේ ඔය කියපු දෙමව්පියෝ දෙන්නා නැවත සැරයක් අඬාගෙන මාව හොයන් ආවා. ඒ ආවට පස්සේ තමයි ගබ්සාවක් කරපු විත්තියක් මට කිව්වේ. ඒත් එක්කම කියපු දෙයක් තමයි ගබ්සා කරන තැනට ගියාට පස්සේ ඒ දුවගේ වයසෙම තවත් දරුවෝ තිහ හතළිහකට වඩා එතැන හිටියයි කියන එක. ඉතින් බලන්න ඕක අපි දන්න එක කතාවක් වුණාට දවසකට තරුණ දුවලා කීදෙනෙක් ඔය විදියට ගබ්සාවල් කරගෙන තමන්ගෙම කුස මිනීවළක් කරගන්නවද? දැන් හිතන්න අර දුවට එහෙම වුණොත්, දෙමාපියන්ට තව දරුවෙක් ගබ්සා කරවලා සංසාරේ ගෙවාගන්න බැරි පවකට කරගහන්න වුණොත් එයාලගෙ වරදින්ද නැත්නම් සමාජයේ වරදින්ද? ඇත්තටම ඒක එහෙම වුණේ දෙමව්පියන්ගේ වරදින් මිසක් සමාජයේ වරදින් නෙවෙයි. මොකද ගොඩක් දෙමව්පියෝ හිතන් ඉන්නවා තමන්ගේ දරුවන්ව නම් දරාපු ඉස්කෝලෙකට තල්ලු කරලා දාලා, සල්ලි ටිකක් බැංකු පොතේ දැම්මම ඒ අයගේ රාජකාරිය අහවරයි කියලා. ඇත්තටම දෙමව්පියන්ට ඊට වඩා මහා භාරදූර වැඩ කොටසක් තියෙනවා දරුවෝ වෙනුවෙන් කරන්න. තමන්ගේ දරුවෝ ගෙදරින් එළියට බැස්සම යන්නෙ එන්නෙ



**ඒ කොල්ලො දෙන්නව දැකපු ගමන් මේ ගෑනු දරුවා ආපහු සැරයක් හොඳටම බයවෙලා කඩාගෙන බිඳගෙන දුවන්න හැදුවා. ඒත් මගේ රියැදුරු මහත්තයත් තරුණයෙක් නිසා ඒ දුවට දුවන්න නොදී බයවෙන්න එපා කියලා මොකද වුණේ කියලා විස්තර අහලා බැලුවා. එතකොට තමයි දැනගන්න ලැබුණේ අර ආපු කොල්ලෝ දෙන්නගෙන් එක්කෙනෙක් මේ ගෑනු දරුවගෙ පෙම්වතා කියලා**

කොහෙද, වැඩිපුර කතාබහ කරන්නේ කාත් එක්කද කියලා හොයලා බලන්න අද ඉන්න දෙමාපියන්ට උවමනාවක් නෑ.

දැන් බලන්න අර පහුගිය දවසක තිස්සමහාරාම පැත්තේ අවුරුදු පහළොවක දුවෙකුට ගෙදරම නානකාමරේ ඇතුළේ දරුවෙක් ලැබුණා. ඒත් ඒ අම්මා මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කිසිම විලිලැජ්ජාවක් නැතුව කිව්වා **"මම මේ මොකුත්ම දැනගෙන හිටියෙ නෑ"** කියලා. ඇත්තටම ඒක අම්මා කෙනෙකුට කියන්න සුදුසු කතාවක්ද? එතකොට ඒ දුව මාස දහයක් වෙනකල් දරුගැබ ගෙදරින් වසන් කරගෙන හිටියෙ කොහොමද? අඩුතරමින් දරුගැබ ඉදිරියට නෙරාගෙන එද්දිවත් ඒ අම්මට අර දුවගෙ වෙනසක් පෙනුණෙ නැද්ද? ඊළඟට අවුරුදු 15ක් කියන්නෙ මහා ලොකුවට හැමදෙයක්ම තනියම කරගන්න පුළුවන් වයසක් නෙවෙයි. ඒ කියන්නේ මාස නවයක් දහයක් තමන්ගේ දුවට ඔසප්වීම සිද්ධ වුණේ නෑ කියලාවත් ඒ අම්මට හාන්කවිසියක්වත් ගානක් තිබිලා නැද්ද?

ඊළඟට ටියුෂන් යනවා කියලා ගෙදරින් ගියාට පස්සේ ඇත්තටම ඒ දරුවා ටියුෂන් පන්තියට ගියාද නැද්ද කියලා ඒ අදාළ ගුරුවරුන්ගෙන් අහලා බලන්න තරම් දැන් ඉන්න දෙමව්පියන්ට විවාර බුද්ධියක් නෑ. මොකද අද කාලේ මේ සැමන් ටින් කරලා වගේ කරගෙන යන ටියුෂන් කෙරුවාවත් කොල්ලොන්ට කෙල්ලන්ට පනින රිලවුන්ට ඉනිමං තියලා වගේ. මොකද ගුරුවරයාට පේන්නෙත් ඔලුගෙඩි ටික විතරයි. ආයෙ මහපාරකදි මුණට මුලිච්චි වුණත් ගුරුවරයා දරුවව අඳුනන්නෙ නෑ. මොකද සේරම වැඩ සිද්ධවෙන්නේ ප්‍රොජෙක්ටර් යන්තරෙන් නිසා. හරි නම් දරුවෙක් ටියුෂන් පන්තියට යනකොට එනකොට ඒ ළමයා පන්තියට ඇවිත් ගියා කියලා දැනගන්න කොතැනක හරි නමක් ලකුණු වෙන්න ඕනෑ.

අන්න ඒකටත් මම මගේ ඇස් දෙකෙන් දැකපු සිදුවීමක්ම කියන්නම්.

මීට මාස හත අටකට විතර උඩදි මම ගියා පිළියන්දල පැත්තේ පුද්ගලික ආයතනයක දේශනයකට. ඒ ගිහින් එනකොට වැඩිය සෙනඟ ගැවසෙන්නෙ නැති පාරක් අයිනේ මල් පඳුරු දෙකකට මුවාවෙලා පොත් මිටියකුත් තුරුලු කරන් අවුරුදු දහසයක විතර දුවෙක් අඬනවා මම දැක්කා. වටපිට බැලුවට පාර දෙපැත්තෙත් කිසිම කෙනෙක් පේන්න හිටියේ නෑ. පස්සේ මම ඕක මගේ රියැදුරු මහත්තයට කිව්වම එයා ආපස්සට වාහනේ හරවගෙන ඒ දුව හිටපු තැනට මාවත් එක්කගෙන ගියා. ඒ ගිහිල්ලත් වචන දෙක තුනකට වඩා කතා කරන්න ලැබුණෙ නෑ මම දැක්කා ඈත ඉඳන් පිරිමි ළමයි දෙන්නෙක් ඒ දිහාවට එනවා. ඒ කොල්ලෝ දෙන්නව දැකපු ගමන් මේ ගෑනු දරුවා ආපහු සැරයක් හොඳටම බයවෙලා කඩාගෙන බිඳගෙන දුවන්න හැදුවා. ඒත් මගේ රියැදුරු මහත්තයත් තරුණයෙක් නිසා ඒ දුවට දුවන්න නොදී බයවෙන්න එපා කියලා මොකද වුණේ කියලා විස්තර අහලා බැලුවා. එතකොට තමයි දැනගන්න ලැබුණේ අර ආපු කොල්ලෝ දෙන්නගෙන් එක්කෙනෙක් මේ ගෑනු දරුවගෙ පෙම්වතා කියලා. ඒ කොල්ලා මේ දුවව බොරු කියලා රවට්ටගෙන තානායමකට අරන් ගිහින් මදිවට ඒ තානායමටම අර ඒකත් එක්ක හිටපු යාළුවවත් ගෙන්නගෙන. පස්සේ මේ කෙල්ල කොහොමහරි කෑගහලා දඟලලා එතැනින් එළියට පැනලා තියෙනවා. ඒ ඇවිත් පාර අයිනේ ඉන්නකොට තමයි මම දැකලා තියෙන්නේ. පස්සේ මම ඒ දුවගෙන්ම අම්මගේ දුරකතන අංකය ඉල්ලගෙන කතා කරලා අම්මා එතැනට ආවට පස්සේ දුවවත් භාරදීලා තමයි ආපහු ගියේ. නමුත් මම ඒ වෙලාවේ ඒ අම්මට මොකුත්ම කියන්න ගියේ නෑ. පස්සේ ගෙදරට ඇවිත් ඒ අම්මට කෝල් එකක් අරගෙන අර දුවට තරවටු නොකරන විදියට කරුණු කාරණා පහදලා දුන්නා.

දැන් බලන්න තමන්ගේ දුව ටියුෂන් පංතියට යනවා කියලා ගෙදරින් ගියාට පස්සේ ඇත්තටම ඒ දරුවා පංතියට ගියාද කියලා හොයලා බලන්න තරම් අර අම්මට උනන්දුවක් උවමනාවක් තිබුණා නම් ඔහොම දෙයක් සිද්ධ වෙනවද? පෙර පිනකට වගේ ඒ දුවව මගේ ඇහැටත් ගැටුනේ නැත්නම් ආපසු සැරයක් අර කොල්ලො දෙන්නට අහුවෙලා මහ විනාසයක් වෙන්නත් ඉඩ තිබුණා.

මෙතැන පළවැනි වැරැද්ද දෙමව්පියන්ගේ. මොකද අර කලින් කතාවේ තාත්තයි අම්මයි මුල්තැන දීලා තිබුණෙත් සල්ලිවලට. ඒ නිසා ඒ අයට තමන්ට හිටපු එකම දුවට ආදරේ කරන්න හොයලා බලන්න වෙලාවක් තිබුණේ නෑ. දැන් කියපු මේ කතාවේ වගේම අර කලින් කියලා තිබුණු තිස්සමහාරාමේ දුවගේ අම්මට වෙලා තිබුණෙත් තමන්ගේ දුවට සමීප වෙලා ඒ දරුවන්ව තේරුම්ගන්න තීක්ෂණ බුද්ධියක් නොතිබුණු එක.

මොකද තමන්ගේ දරුවන්ගේ වගකීම තමන්ට ගන්න පුළුවන්නම් සමාජේ අරමයි මෙහෙමයි කියලා කාටවත් දෙස් පවරන්න අවශ්‍ය නෑ. හැබැයි එහෙමයි කියලා සමාජේ වරදක් ඇත්තෙම නෑ කියලත් මම කියන්නේ නෑ. ඒ වුණාට මේ කතාවේ කලින් පැහැදිලි කරලා තියෙනවා වගේ චිදු දුවලට අම්මා අප්පගෙන් වැඩිහිටියන්ගෙන් වගේම සාහිත්‍ය කලාව තුළිනුත් ජීවිත අවබෝධයක් ලැබුණා. ඒ අය චිදු එහෙම ලබපු අත්දැකීම් අද දුවලා හොයන්නේ සමාජ මාධ්‍යවලින්. එතකොට ඉතින් හරි වැරැද්ද තෝරබේරගන්න පුළුවන් කෙනා හරි තැනින් අල්ලගත්තට එහෙම විචාර බුද්ධියක් නැති කෙනා තවත් ටිකක් ප්‍රපාතෙට ඇදගෙන වැටෙනවා.

ඒ විතරක් නෙවෙයි කිසිම ලේඛකයෙක්වත්, ගොඩක් දුරට මාධ්‍යවලින්වත් මේ ලිංගික අධ්‍යාපනය කියන දේ ගැන කතා කරන්නේ නෑ. මොකද ඊටපස්සේ මුණදෙන්න වෙන ප්‍රශ්න ගැන ඔවුන් දන්න නිසා.

මට මතකයි මේ මෑතකදීත් 'ධරණී' පුවත්පතේ ස්වයං වින්දනය ගැන කියලා පලවුණු ලිපියකට බොහොමයක් වැඩිහිටි උදවිය පහර පිට පහර එල්ල කළා. ඒකෙන් පැහැදිලි වෙනවා අදටත් අපි ජීවත්වෙන්නේ ලිංගිකත්වය රහසක් විදියට සලකන සමාජයක. ඇත්තටම ඒක එහෙම විය යුතු නෑ. මගේ මතය නම් පාසල් විෂය නිර්දේශයේ තියෙන අතිරේක විෂයක් ඉවත් කරලා හරි මේ ලිංගික අධ්‍යාපනය කියන එකත් විෂය නිර්දේශයට ඇතුළත් කරන්න ඕන කියන එක. මොකද අද තියෙන සමාජ මාධ්‍යවලින් දරුවෝ කරන්නේ ලිංගික අධ්‍යාපනය ලබන එක නෙවෙයි. ඒක තව රහ කර කර බලලා ඒවා අත්හදා බලන්න යන එක. ඒ ගැන දැනුමක් නැතුව අත්හදා බලන්න යන එකෙන් වෙන්නේ අර කලින් කතාවල දුවලට වගේ ගෙදරම දරුවෝ ලැබෙනකල් මොකුත්ම නොදැන ඉන්න සිද්ධ වෙන එක.

ඊළඟට මේ හැමදෙයකටම මූලිකම හේතුවක් තමයි දෙමව්පියෝ සහ දරුවෝ අතර සමීප ඇසුරක් නැති එක. අන්න ඒ නිසා කතාව අවසානෙට මගේ තර්කය වෙන්නේ අම්මා කෙනෙකුට තරම් දුවෙකුට සමීප වෙලා ජීවිතය ගැන පාඩම් උගන්වන්න සමාජෙට බැහැ. අර අපි කලින් කතා කරපු කතා දෙක තුනේම අම්මලාට වැරදිලා තිබුණෙත් එතැනම තමයි. ඒ අම්මලා කවුරුත් තමන්ගේ දුවලගෙ ජීවිතවලට ආදරෙන් සමීපවෙලා කටයුතු කරලා තිබුණෙ නෑ. එහෙම තිබුණා නම් ඒ දරුවොන්ට ඒ විදියේ නස්පැත්තිවලට මුණදෙන්න සිද්ධ නොවෙන්නත් තිබුණා. ඒ නිසා ඔබේ දරුවන්ට හරි වැරැද්ද තේරුම් බේරුම් කරලා දීලා නිවැරදි මාර්ගයේ යවන එක දෙමව්පියෝ විදියට ඔබේ වගකීම මිසක සමාජයේ වගකීම නෙවෙයි. අනික අද අපි දුවලා ගැන කතා කළාට පුතාලටත් මේ කරුණු කාරණා ටික මේ විදියටම පොදුයි කියලයි මට කියන්න තියෙන්නේ.

■ **ලිහිණී මධුෂිකා**


# ගෞරවාන්විත ප්‍රබෝධමත් ස්ථිර "රැකියාවක්"

එක්වන්න අප සමඟ.... උපරිම මාසික වැටුප රු. 73,000/-

**රාජකීය ගෘහස්ථ හෙද සේවාවට ඔබත් එක්වන්න**

වර්ෂ 2007 ආරම්භ වූ හෙද සේවිකාවන් 900ක් රැකියාවේ යෙදෙන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හෙද සේවා ආයතනයක් වන සීමාසහිත රෝයල් නර්සින් හෝම් පුද්ගලික සමාගමේ ගෘහස්ථ හෙද (Home Nursing) සමාගමේ නව රැකියා ඇබෑර්තු 100 ට එක්වීමට ඔබටත් වරම්.... ඔබ වයස අවුරුදු 18 - 50 අතර උස අඩි 4 අඟල් 10 ට වැඩි සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලැබූ විවාහක/අවිවාහක ගැහැණු /පිරිමි කායික හා මානසික නිරෝගී කාර්යක්ෂම රාජකාරී කළ හැකි කාරුණිකව හදවතින්ම හෙද සේවයට කැමති ඕනෑම කෙනෙකුට රැකියාව....

**සේවා කාලය හා වැටුප් ගෙවීම**

නුපුහුණු සේවකයන් සඳහා සේවා කාලය 06.00 - 21.00 රෝගියාගේ නිවසේ නැවතී සේවය කිරීම වෙනුවෙන් දිනකට රු.1,800/= බැගින් පැමිණීමේ දීමනාව රු.10,000/= සමඟ උපරිම වැටුප මසකට රු.64,000/= වේ.

පළපුරුදු හෙද/හෙදි සහායිකාවන් සඳහා සේවා කාලය 06.00 - 21.00 රෝගියාගේ නිවසේ නැවතී සේවය කිරීම වෙනුවෙන් දිනකට රු.2,100/= බැගින් පැමිණීමේ දීමනාව රු.10,000/= සමඟ උපරිම මසකට රු.73,000/= වේ. මාස 12 ක පරිවාස කාලයෙන් පසු වසරකින් ස්ථිර රැකියාව ඉහළ මූලික වැටුපක් EPF, ETF හා අනෙකුත් දීමනා ලබාදෙනු ලැබේ. නුපුහුණු හෙද සහායිකාවන්ට දින 14 ක නොමිලයේ පුහුණුව

**පිරිමි හෙද සේවකයන් සහ ළදරු රැකවරණ හෙදියන් සඳහා කඩිනම් බඳවාගැනීම්**

ආහාර පාන සහිත නේවාසිකාගාර, නිල ඇඳුම් ප්‍රවාහන පහසුකම් නොමිලේ ලබාදෙයි

රැකියාව පිළිබඳ වැඩි විස්තර දැන ගැනීම සඳහා වෙබ් අඩවියට ඇතුළුවන්න හෝ ඔබගේ ස්මාර්ට් දුරකථනයෙන් ස්කෑන් කරන්න www.royalnursinghome.com/jobs



රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමත ගෘහස්ථ හෙද සත්කාර සේවය PHSRC/OMI/235

ඔබ දැනටමත් අඩු වැටුපට සේවය කරන හෝ විදේශ රැකියාවකට යාමට බලාපොරොත්තුවෙන් සිටින ඔබට ඉහළ වැටුපක් සමඟ ලොව දැනට පවතින උසස්ම රැකියාවන්ගෙන් එකක් වන හෙද සේවාව සඳහා එක්වී හෙදියක ලෙස ගෞරවාන්විත වෘත්තියකට නියැලීමට මෙම මහඟු අවස්ථාව බුද්ධිමත් ඔබ ප්‍රයෝජනයට ගනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.



## රෝයල් නර්සින් හෝම් පුද්ගලික සමාගම

කාර්යාලය - අංක 44,දේවානන්ද පාර ,නාවින්න මහරගම.

දුරකථන : 0114960194 / 0713944944 /0703789102

සම්මුඛ පරීක්ෂණ සෑම සදුදා සිට සිකුරාදා දින 09.00 සිට දහවල් 01.00 දක්වා පැවැත්වෙන බැවින් ග්‍රාම සේවා සහතිකය හා ඔබ සතු සියලුම සහතිකපත් සමග කාර්යාලයට පැමිණෙන්න



සුද්දෙක් වගේ A to Z කථාකරමුද?

දැනට රැකියාවන් හී නියුතු හා උසස්වීම් අපේක්ෂිත

**ගම්පහ, කළමණාකරණ හා උසස් වෘත්තීය පුහුණු අභ්‍යාස ආයතනයේ හිටපු**

ජ්‍යේෂ්ඨ ඉංග්‍රීසි භාෂා උපදේශක

**ලසන්ත ප්‍රියංකර** සර්

**නව පංති ආරම්භය**

**පෙබරවාරි මස**

**12 ඉරිදා**

වේලාව උදේ 10.30 - 1.30



පැවැත්වෙන ස්ථානය : කඳබළුවාව සණස ශාලාව, බෙම්මුල්ල | 077 110 15 63 (ප්‍රියංකර මහතා) 074 227 17 39 (ප්‍රබුද්ධිකා)

# මගේ මහත්තයා ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයෙක් කියලා දැනගත්තේ ලාහෝර් ප්‍රහාරය දවසේ

## චාමර කපුගෙදරගේ බිරිඳ තමාරා කපුගෙදර





2010 වසරේ බටහිර ඉන්දීය කොදෙව් දූපත්හි පැවති විස්සයි විස්ස ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියේ සුපිරි අටදෙනාගේ වටය ඉතාම තීරණාත්මක එකක් විය. එම වටයේ ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර තරඟය කෙරෙහි කාගේත් අවධානය යොමුවූයේ එම තරඟය දෙපිලේම ඉදිරිය තීරණය කළ එකක් වූ බැවිනි. මුලින් පන්දුවට පහරදුන් ඉන්දීය කණ්ඩායම පන්දුවාර විස්ස තුළ ලකුණු 164ක් ලබාගත් අතර විස්තර විචාරකයින් පැවසුවේ එය එම පිටිය තුළ හඹායාමට අපහසු ඉලක්කයක් බවයි. එහෙත් ශ්‍රී ලංකා පිතිකරුවන් සාර්ථකව එකී ඉලක්කය හඹාගිය අතර කාගේත් හදවත් මොහොතකට ගල්ගැසුනේ ජයග්‍රහණය වෙනුවෙන් අවසන් පන්දුවට ලකුණු 03ක් අවශ්‍ය වූ නිසාවෙනි. පන්දුවට පහරදීමට සූදානම්ව සිටියේ ශ්‍රී ලංකාව බිහිකළ අංක එකේ ප්‍රහාරාත්මක පිතිකරුවෙකු වූ චාමර කපුගෙදර ය. පන්දුව බාරවී තිබුණේ ඒ වනවිට ඉන්දීය කණ්ඩායමේ සිටි තීරණාත්මක පන්දු යවන්නා වන අශිස් නෙහ්රාටය. නෙහ්රා අවසන් පන්දුව එවන්නට සැරසෙද්දී කපුගෙදර සරදමට මෙන් සිනාසෙන අයුරුද දැකගන්නට ලැබුණි. ඊළඟ තත්පරයේ නෙහ්රා යොමුකළ පන්දුවට දැවැන්ත හයේ පහරක් එල්ල කරමින් චාමර කපුගෙදර ශ්‍රී ලංකා ජයග්‍රහණය තහවුරු කළේ ලාංකීය ක්‍රීඩාලෝලීන්ගේ ඇසට සතුටු කඳුළක් එකතු කරමිනි. ඉතින් මේ කතාබහ ඒ ප්‍රහාරාත්මක දකුණත් පිතිකරු චාමර කපුගෙදරගේ බිරිඳ වන තමාරා කපුගෙදර සමඟිනි.

**තමාරා ක්‍රිකට් මැච් බලන්න පටන්ගත්තේ කවදා ඉඳන්ද?**

චාමර බැන්දට පස්සේ තමයි මං ක්‍රිකට් මැච් බලන්න පුරුදුවුණේ.

**ක්‍රිකට් මැච් බැලුවේ නැත්නම් චාමර කපුගෙදරව දන්නේ කොහොමද?**

මගේ යාළුවට ඒ කාලේ බෝයි ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියා. එයාගෙ යාළුවෙක් තමයි චාමර කියන්නේ. ඒ පිරිමි ළමයා යාළුවා බලන්න එනකොට චාමරත් ඒ එක්ක තනියට එනවා. එහෙම තමයි දැනගත්තේ.

**එතකොට දැනගෙන හිටියද එයා ජාතික කණ්ඩායම නියෝජනය කරපු ප්‍රසිද්ධ ක්‍රීඩකයෙක් බව?**

ඇත්තටම නෑ. එයාවත් කවුරුත් මට ඒ ගැන කිව්වෙත් නෑ. ඉතින් කොච්චර ප්‍රසිද්ධ ක්‍රීඩකයෙක් වුණත් මං ඒක දැනගෙන හිටියේ නෑ.

**එතකොට එයා ප්‍රසිද්ධ ක්‍රීඩකයෙක් කියලා දැනගත්තේ කවද්ද?**

අර 2009 අවුරුද්දේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ලාහෝර් ත්‍රස්ත ප්‍රහාරය එල්ලවුණු වෙලාවේ දැනගත්තේ. එදා මගේ යාළුවගේ පිරිමි ළමයා මගෙන් කෝල් කරලා ඇහුවා චාමරලට මෙහෙම දෙයක් වෙලා තියෙනවා ඔයා එයාට කතා කරලවත් බැලුවේ නැද්ද කියලා. ඒ වෙලාවේ මං එයාට කිව්වා "ක්‍රිකට් කණ්ඩායමට එහෙම දෙයක් වුණාම මං චාමරට කතා කරන්නේ ඇයි?" කියලා. ඒ වෙලාවේ තමයි එයා මට කිව්වේ "ඇයි දන්නේ නැද්ද චාමර කියන්නේ ජාතික කණ්ඩායමට ක්‍රීඩා කරන ප්‍රසිද්ධ ක්‍රීඩකයෙක්නේ" කියලා. එදා තමයි චාමරව මං හරියටම දැනගත්තේ.

**ඉතින් එදා චාමරට ඔයා කතා කරලා බැලුවද?**

ඒ දවස්වල මං ගුවන් සේවිකාවක්. ඉතින් ප්ලේන් එකේ යන ගමන්ම කතා කරලා බැලුවා. එයා එදා ටිකක් බයවෙලා වගේ හිටියේ. කොහොමහරි එදා කතා කළාට පස්සේ මාස කීපයක් යනකල් අපි ආයෙත් කතා කළේ නෑ.

**එතකොට චාමරගෙයි තමාරාගෙයි ආදර කතාව පටන්ගත්තේ කොතැනින්ද?**

චාමරගේ ගෙවල් මහනුවර. එයා මාස කීපයකට පස්සේ එයාගේ යාළුවගෙන් මගේ විස්තර අහගෙන මං බලන්න නුගේගොඩට ආවා. ඒ ආපු සැරේ තමයි අපි දැන අඳුරගෙන ආදරේ කරන්න පටන්ගත්තේ.

**එතකොට දෙන්නගේ විවාහය සිද්ධවුණේ කොයි විදියටද?**

අපි යාළුවෙලා අවුරුදු එකහමාරක් විතර ඉඳලා බැන්දා. දවස කිව්වොත් ඒ 2010 දෙසැම්බර් 16 වැනිදා.

**චාමරගේ පෙනුමත් එක්ක එයාට බැඳපු අලුත රඟපාන්න එහෙමත් ආරාධනා ලැබුණා කියන්නේ ඇත්තද?**

එයාට රඟපාන්න ආරාධනා ලැබුණා කියලා එයා මගෙත් එක්ක කිව්වා. ඒත් එයාට ඒකට ආසාවක් තිබුණේ නෑ. මොකද එයාගේ ඇඟේ තිබුණේ ක්‍රිකට් විතරමයි.

**2010 අවුරුද්දේ තිබුණු ලෝක කුසලානයේදී චාමර ගහපු හයේ පහරක් නිසා එයා ලෝකයේම අවධානය දිනාගත්ත ක්‍රීඩකයෙක් වුණා. ඒ තරඟය බැලුවද?**

ඒ තරඟය තිබුණේ අපි ආදරේ කරපු දවස්වල. එදා මං හොස්පිට්ල් එකේ හිටියේ. මොකද ඒ දවස්වල අපේ අක්කගේ දරුවට ඩෙංගු හැදිලා හොස්පිට්ල් එකේ නැවතිලා හිටියා. ඔය මැච් එක දවසේ මං තමයි එයා ගාව තනියට හිටියේ. එදා හොස්පිට්ල් එකේ ටීවී එකේ මැච් එක දාලා තිබුණා. එහෙම තමයි එදා මැච් එක බැලුවේ. එදා අන්තිම බෝලෙට ලකුණු තුනක් ගහන්න තිබුණේ. චාමර ඒකට හයක් ගහලා මැච් එක දිනවලා දුන්නා.



**චාමර ක්‍රිකට් ගැන ඔයා එක්ක කතා කරන්නේ නෑ කියන්නේ ඇත්තද?**

(සිනාසෙමින්) ඔව් එයා ක්‍රිකට් ගැන මගේ එක්ක කතා කරන්නේ නෑ. මොකද එයා දන්නවා මට ක්‍රිකට් ගැන ලොකු අවබෝධයක් නෑ කියලා. හැබැයි ඒ කාලේ හොඳට සෙල්ලම් කරපු දවසට එහෙම හරි සතුටින් තමයි එයා ගෙදර ඉන්නේ. ඒක එයාගේ මූණෙන් පෙනුණා.

**චාමර ක්‍රිකට්වලින් සමුගත්ත දවසේ එයා ඔයාට මුකුත් කිව්වේ නැද්ද?**

එහෙම විශේෂ දෙයක් කිව්වේ නෑ. ඒත් එයා හිතින් හුඟාක් දුක්වෙන්න ඇති ආයෙත් ජාතික කණ්ඩායමට සෙල්ලම් කරන්න වෙන්නේ නෑනේ කියලා.

**මේ වෙනකොට චාමර එක්ක ගෙවන ජීවිතේ කොයි වගේද?**

දැන් අපි බැඳලා අවුරුදු දහතුනක් වෙනවා. අද ඊයේ බැඳපු දෙන්නෙක් වගේ හරිම සතුටින් තමයි අපි ඉන්නේ. අපිට පිරිමි ළමයිම තුන්දෙනෙක් ඉන්නවා. ලොක්කට දැන් අවුරුදු දහයක් වෙනවා. ජාතික කණ්ඩායමෙන් සමුගත්තට පස්සේ චාමර නම් දැන් ක්‍රිකට් පුහුණුකරුවෙක් විදියට කටයුතු කරනවා.

**එහෙනම් පොඩි චාමර කපුගෙදර කෙනෙක් අපිට අනාගත ක්‍රිකට් පිටියේ දකින්න ලැබෙයි නේද?**

ඒක නම් කියන්න දන්නේ නෑ. චාමර කියන්නේ එයාලට ආස පැත්තෙන් ඉස්සරහට යන්න දෙනවා කියලා. ඒත් පොඩි චාමර කෙනෙක් එහෙම එනවා නම් චාමරත් ගොඩක් කැමති වෙයි.

**චාමරට අදටත් වෙනසක් නැතුව ක්‍රිකට් ප්‍රේක්ෂකයෝ ආදරෙයි කියන්නේ ඇත්තද?**

ඇත්ත ඇත්ත. අපි එළියට ගියත් ට්‍රිප් එකක් ගියත් චාමර එක්ක සෙල්ෆියක් ගහන්න කවුරුම හරි එනවා. එයා පුතාලගේ ඉස්කෝලෙට ගියත් ලොකු පිළිගැනීමක් තියෙනවා. එයාට එදා ලැබුණු ප්‍රසිද්ධිය තාමත් ඒ විදියමයි.

**ක්‍රිකට්වලට අමතරව එයා වෙන දක්ෂ මොනවටද?**

චාමරට හොඳට උයන්න පුළුවන්. පරිප්පු එහෙම හරි රසට හදනවා. මටත් ඉතින් ලේසියි. ඒ වගේම එයාට හොඳට සිංදු කියන්නත් පුළුවන්. හැබැයි ඔය හැමදේටම වඩා එයා හරි දක්ෂයි නිදාගන්න. දවසක් වුණත් එකදිගට නිදාගනියි.

**එයා ඔයාට සැර කරන්නේ එහෙම නැද්ද?**

(සිනාසෙමින්) අයියෝ නෑ. අපි ගෙදර ඉන්නේ හරියට හොඳම යාළුවෝ වගේ. හැබැයි එයා මැච් එකක් බලද්දි එහෙම ක්‍රීඩකයින්ට මුකුත් කියන්න දෙන්නේ නෑ. ඒ වෙලාවට කියනවා "එහෙනම් ඔයා ගිහින් ගහලා එන්න" කියලා.

**චාමර වයසට යන්නේ නැති එකටත් මොකක් හරි රහසක් ඇති නේද?**

(සිනාසෙමින්) මමත් ඒ රහස එයාගෙන් අහනවා. ඒත් හිනාවෙනවා මිසක් කියන්නේ නෑ. ඒ වෙලාවට මං එයාට විහිළුවට වගේ කියනවා "මං ඔයාව සතුටින් තියන නිසයි ඔයා වයසට යන්නේ නැත්තේ" කියලා.

**හිටපු ක්‍රීඩකයෝ ගොඩාක් මේ වෙනකොට රට අතෑරලා ගිහින් තියෙනවා. ඔයාලට එහෙම අදහසක් නැද්ද?**

මං හිතන්නේ ලංකාව තරම් හොඳ රටක් තව නෑ. චාමර ආසත් නෑ ලංකාව දාලා යන්න. මගේ ආසාවකුත් නෑ. ඒක නිසා දැනට නම් එහෙම අදහසක් නෑ.

**ක්‍රිකට් පිටිය හොල්ලපු ක්‍රීඩකයෙකුගේ බිරිඳක් වෙන්න ලැබුණු එක ගැන තමාරාට මේ මොහොතේ මොකද හිතෙන්නේ?**

ඒ ගැන මට ලොකු සතුටක් වගේම ආඩම්බරයක් තියෙනවා. මොකද චාමරට ලංකාවේ මිනිස්සු හරිම ආදරෙයි. ඒ ආදරේ මං එයාගේ බිරිඳ නිසා මටත් ලැබෙනවා. ඒ අතින් මං හරි වාසනාවන්තයි කියලා මට හිතෙනවා.

■ රුවන් එස්.සෙනවිරත්න


# මගේ අත් දෙකෙන් මුලින්ම පණ දුන්නේ ගණ දෙවියන්ට











තම දෙඇසත් හදවතත් කැටයම් කලාවට තදින් බැඳෙද්දී, ජීවනීට වයස අවුරුදු දොළහක් වාගේය. පාසල නිමවී ගෙදර දුවගෙන එද්දී තමා දෙස බලා සිනාසෙන වෙස්මුහුණු ඇයට පෙනුණේ ජීවයෙන් පිරුණු අපූරු නිර්මාණ ලෙසිනි. ඇය ගේ පුරා දණගාන වියේ සිටම දුටුවේද අම්මාත් තාත්තාත් කරන එවන් නිර්මාණය.

**"මට තේරෙන වයස වෙද්දී, ගේ පුරා තිබුණ ලී කැටයම් මගේ හිතට ලොකු සතුටක් ගෙනාවා. ඒ රූප දවසින් දවස හැඩවෙන හැටි දැක්කා. ඉතින් මම ඉස්කෝලේ ඇරිලා ගෙදර දුවන්නේ අම්මටයි, තාත්තටයි උදව් කරන්න බලාගෙන. එහෙම නියනයි අතකොලුවයි අතට ගත්තු මම දැන් වසර විසිපහක් මගේ ජීවන වෘත්තිය හැටියට කැටයම් කලාව සමඟින් ඔට්ටු වෙනවා."**

ඒ ජීවනී දසිකා රණසිංහගේ හඬය. ඇය පදිංචි මහනුවර කටුගස්තොට, රනවන ගම්මානයේයි. මහනුවර ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ආදි සිසුවියක වන ඇය, උසස් පෙළින් අනතුරුව කැටයම් කලාව වෙනුවෙන් වැඩිපුර කාලය යොදවන්නට සිතුවාය.

"මම මුලින්ම හැදුවේ ගණදෙවි පිළිමයක්. අම්මා ගණදෙවි කැටයමක් නිර්මාණය කරනවා බලා ඉඳලයි මගේ හිතට ඒ අදහස ආවේ. ඒ විදියට බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා රැසක් මගේ අතින් නිර්මාණය වෙලා තියෙනවා. ඒ කටයුතු කරද්දි ඒ වෙනුවෙන් පේ වෙලා කරන්න ඕන වතාවත් ටිකක් තියෙනවා. බාරහාර තියෙනවා. ඉතින් මට අද වගේ මතකයි අම්මා තාත්තා මට ඒ ඕන කරන උපදෙස් ටික දුන්නා. ඒ විදියට පේ වෙලා බාරහාර වෙලා තමයි පිළිමයක් නෙළද්දි කටයුතු කරන්නේ. බොහෝ අවස්ථාවල අපි දළදා මාලිගාවට තමයි බාර වෙන්නේ. ඔය විදියට මං අතින් බුදු පිළිම, දේවරූප, සත්වරූප, වෙස්මුහුණු, ආරච්චි මුහුණු වගේම බිත්ති සැරසිලි ආදී නිර්මාණ සිය ගණනක් නිමවෙලා තියෙනවා."

ජීවනීගේ කැටයම් වැඩපොළ ඇත්තේද ඇගේ ගෙදරමය. ලැබෙන ඇණවුම අනුව නිර්මාණකරණයේ යෙදෙන ඇය අතින් නිමවෙන්නේ ඉතා සියුම් කැටයම් බැවින්, ඊට ගතවන කාලය විටෙක වැඩිය. එහෙත් කැටයමේ සියුම් රේඛා මත හැඩතල මවන්නට ඈ සිය උපන් හපන්කම මුසු කරන්නේ බොහෝ කැපවීමෙනි.

**"අපි නිර්මාණයක් කරද්දී ලීයේ හැඩය ගැන හිතන්න ඕන. බිත්ති සැරසිල්ලක් කරනවානම් ඊට ගැළපෙන ලෑල්ලක් තෝරගන්න ඕන. පිළිමයක් කැටයම් කරද්දි ගන්න ලී වර්ගය ගැනත් හිතන්න වෙනවා. කොලොං, පලු, මාහෝගනී වගේ ශක්තිමත් වටිනා ලී වර්ගයක් තමයි භාවිතා කරන්න ඕන. ලී කැටයමක් කරද්දී නියන් වර්ග කිහිපයක් භාවිතා කරනවා. තවත් උපකරණ වගේම තීන්ත ගල්වන්න ඕන කරන උපකරණ තියෙනවා. මේ සියල්ල එක්ක දැකුම්කළු නිර්මාණයක් කරන්න තමයි මම සැමවිටම උත්සාහ කරන්නේ. ඒ වගේම මගේ අතින් නිමවෙන බුද්ධ ප්‍රතිමාවලට වගේම දේව ප්‍රතිමාවලට වැඩි ඉල්ලුමක් තියෙනවා."**

ජීවනීලාට ලී කැටයම් කලාව තුළ දිගු ඉතිහාසයක් නැතත්, ඇගේ මව කැටයම් කලාව හොඳින් ප්‍රගුණ කළ තැනැත්තියකි. තාත්තා කැටයම් කලාව ඉගෙනගෙන ඇත්තේ මව හා විවාහ වූ පසුය. ජීවනීගේ සැමියාත් කැටයම් කලාව ඉගෙනගත්තේ ඇය හා විවාහවීමෙන් පසුය. ඔහු රැකියාවක නියැලුණත්, ඉඩ ලැබෙන සෑම මොහොතකම ජීවනීට ශක්තියක් වන්නේ, පවුලේ ආර්ථිකයට මෙම මහඟු කලාවෙන් ලැබෙන පිටුවහල බෙහෙවින්ම වටිනා නිසාය.

ජීවනීගේ සහෝදර සහෝදරියන් ගනිද්දීද ඇයගේ පවුලේ ජනාධිපති සම්මානලාභී කැටයම් ශිල්පිනියක වීමද විශේෂයකි.

"මගේ තුන්වැනි අක්කා 1989 කැටයම් කලාවෙන් ජනාධිපති සම්මාන ලැබූ ශිල්පිනියක්. මගේ ලොකු අක්කත්, මල්ලිත් බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ කැටයම් අංශයේ ශිල්පීන්. ඒ වගේම මගේ මවත් කාලයක් උඩරට කලා සංගමයේ ප්‍රදර්ශන ශිල්පිනියක හැටියට කටයුතු කළා. එහිදී පැවරෙන රාජකාරිය වෙන්නේ සංචාරකයින් පැමිණිවිට ඔවුන්ට දැකගන්න අලියෙක්, වෙස්මූණක් වැනි නිර්මාණයක් කරන එකයි. එමගින් කැටයම් කලාවට සංචාරක ආකර්ෂණය දිනාගැනීම අරමුණ වෙනවා."

එසේ දේශීය කැටයම් කලාව නැංවීම උදෙසා කැපවූ ශිල්ප ශිල්පිනියන් කර්මාන්තය උදෙසා කරන්නේ වටිනා මෙහෙවරකි. මව ඉන් විශ්‍රාම ගිය පසු උඩරට කලා සංගමයේ ප්‍රදර්ශන ශිල්පිනිය ලෙස කටයුතු කරන්නේ ජීවනීය. සතියට දින තුනක් ඇය ඊට සහභාගී වන අතර, ඒ තමා ආදරය කරන කැටයම් කලාවේ උන්නතිය උදෙසා මිස ආර්ථික ලාභයක් වෙනුවෙන් නොවේ.

**"ඇත්තටම කොරෝනා එක්ක අපේ අලෙවියේ පහතවැටීමක් සිද්ධ වුණා. දැන් නැවත සංචාරකයින් රටට පැමිණෙමින් තියෙන කාලේ. ඒත් අපේ වෙළඳපොළ තවම සතුටුදායක මට්ටමකට ඇවිත් නැහැ. හොඳ වෙළඳපොළක් හදාගන්න, වගකිවයුතු අංශ වෙතින් සහයෝගයක් ලැබෙනවානම් දේශීය කැටයම් කලාවට එය විශාල අස්වැසිල්ලක් වෙනවා. මෙය ඇත්තටම දියුණු කරන්න පුළුවන් කර්මාන්තයක්. ඒ වගේම මූලික ප්‍රාග්ධනයක් තියෙන කෙනෙකුට හිත නිදහසේ කරගෙන යන්න පුළුවන් වටිනා කර්මාන්තයක්."**

එය කර්මාන්තයක් වාගේම අගනා කලාවකි. ඒ කලාව ඉදිරියට රැකගන්නට, ඇගෙන් පසුව ඉන්නේ ඇගේ පුතනුවන් දෙදෙනාත්, දියණියත්ය. ඉන්ද ඇගේ වැඩිමහල් පුතු ඊට වැඩි කැමැත්තක් දක්වන බවද කීවාය. දියණියත්, නවය වසරේ ඉගෙනුම ලබන පොඩි පුතුත් ඉඩ ලැබෙන අයුරින් ඊට උදව් දෙන බවද ඇය කීවාය.

"ඇත්තටම අපේම කියන තැනක නෙවෙයි දැනට මේ කටයුත්ත අපි කරගෙන යන්නේ. දැනට අපි ඉඩමක් අරගෙන තියෙනවා. මේ තැනට අපේ ජීවිත ගොඩනගාගන්න මේ කලාව ආලෝකයක් වුණා."

ජීවනී කියන්නේ බාධක එන තරමට, ජීවිතය සවිමත් වනු ඇති බවයි. අද වනවිට වෙළඳපොළේ අමුද්‍රව්‍ය මිල ගණන්ද වැඩි හෙයින් නිර්මාණයක මිල ගණන් කියන්නට වෙන්නේ ඒ පිරිවැයද එක්කොටය.

"හැබැයි අමාරුවෙන් වුණත් සාධාරණ මිලකට අපේ නිර්මාණ අලෙවි කරන්න කටයුතු කරන නිසාම අපේ නිෂ්පාදනවලට ඉල්ලුමක් තියෙනවා. පුංචි කාලේ නියනයි, අතකොලුවයි අතට ගත්තු මම මේ කලාව කැපවීමෙන් කරන කෙනෙකුට ඒ ගැන කියලා දෙන්නත් කැමතියි."

ජීවනී කියන්නේ බලාපොරොත්තුවෙනි. ඕනෑම දෙයක්, කැමැත්තෙන් කැපවීමෙන් කරනාවිට වරදින්නේ නැත. පරදින්නේද නැත. ජීවනී කැටයම් කලාවට ජීවය දෙන්නේ එවන් සුබවාදී හිතක් ඇතිවය.

■ දීපා වසන්ති එදිරිසිංහ





# මගේ කුළුබඩු දැන් ඇමරිකාවටත් යනවා

## සන්තුෂි විජේකෝන්

**නිර්මාතෘ වයිල්ඩ් කලෙක්ෂන් කුළුබඩු නිෂ්පාදන**

'කරදමුංගු, කරාබුනැටි, සාදික්කා, වසාවාසි, ඉඟුරු පියළි, කොත්තමල්ලි, චුණ්ණපුග නාගවල්ලි...'

1965 තිරගත වෙච්ච් 'සාරවිට' චිත්‍රපටයේ මිල්ටන් පෙරේරා මහත්තයා ගායනා කරන ඔය සිංදුව මතක් වුණේ කතානායිකාවගේ නිෂ්පාදන ගොන්න දැක්කයින් පස්සෙයි. අද 'ධරණී' කවරය දරාසිටින අපේ කතානායිකාව තමයි සන්තුෂි විජේකෝන්. ඇය ලංකාවේ ජනප්‍රිය කුළුබඩු සන්නාමයක නිර්මාතෘවරියක්. චුණ්ණපුග, නාගවල්ලි හැරුණුකොට සිංදුවේ කියාපු අනෙක් හැමදෙයක්ම සන්තුෂිගේ කුළුබඩු නිෂ්පාදන ගොන්නේ තිබුණා.

අද ඒසා විශාල නිෂ්පාදන පරාසයක් එක්ක සාර්ථක ව්‍යාපාරයක් තිබුණාට ඒ ගමන රෝසමල් අතුරාපු පාරක ආපු එකක් නෙමෙයි කියලයි ඇය කිව්වේ. ඒ නිසා ව්‍යාපාරයක් කරන, ව්‍යාපාරයක් කරන්න බලාපොරොත්තු වෙන කාන්තාවන්ට හයියක් වෙන්නයි අපි ඇගේ කතාව දිගහරින්නේ.

**"මම මාතලේ. මාතලේ ශ්‍රී සංඝමිත්තා පාසලේ ආදි ශිෂ්‍යාවක්. ඉස්කෝලේ යන කාලෙදි ඉගෙනගත්තේ සයන්ස්. පස්සෙ මාර්කටින් පැත්තත් ඉගෙනගත්තා. ඉගෙනගෙන ඉවර වුණාට පස්සේ ලංකාවේ ප්‍රසිද්ධ මූල්‍ය ආයතනයක වසර කීපයක් වැඩ කළා."**

ඔය අතරේ සන්තුෂි විවාහවෙලා. දරුමල්ලෝ ලැබුණාට පස්සේ ඒ වැඩත් එක්ක තවදුරටත් රැකියාව කරගන්න ඇයට අපහසු වුණාලු.

"මට දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. බබාලා ලැබුණාට පස්සේ ජොබ් එකෙන් අයින් වුණා. අවුරුදු අටක් විතර මුකුත් කළේ නැහැ. ගෙදරට වෙලා හිටපු කාලෙදි හිතට ලොකු හිස්බවක් දැනුණා. දරුවන්ගේ වැඩ, ගෙදර වැඩ කළත් මුකුත් නොකර නිකන් ඉන්නවා වගෙයි දැනුණේ. මාර්කටින් එහෙමත් කරලා තියෙන නිසා බිස්නස් එකක් පටන්ගන්න ඕනේ කියන අදහස මගේ හිතේ කැකෑරෙන්න ගත්තා."




**හිතාගන්නත් බැරි අඩු මුදලට කුළුබඩු අලෙවි කරන අය ඉන්නවා. කුළුබඩුවල මිල ගණන් එක්ක ඒ ගණන්වලට දෙන්න බැහැ කියන එක මම පෞද්ගලිකව දන්නවා. කුළුබඩුවලට මොනවා හරි මිශ්‍ර කරලයි අඩු ගණන්වලට දෙන්නේ**





රට කීපසැරයක්ම ලොක්ඩවුන් වුණු නිසා කොවිඩ් කාලෙදි රටේ ඇතැම් ව්‍යාපාර වැහුණා. හැබැයි තැනට සුදුසු නුවණ පාවිච්චි කරන මිනිස්සු සමාජ මාධ්‍ය වේදිකාවක් කරගෙන අලුත් අලුත් ව්‍යාපාර පටන්ගත්තා. සන්තුෂිත් ඔය දෙවැනියට කියාපු පිරිසෙන් කෙනෙක්.

**"දරුවෝ ඉස්කෝලේ ගියෙත් නැති නිසා කොවිඩ් මුල් කාලේදි මට වැඩිපුර වෙලාව තිබුණා. බිස්නස් එකට අත්පොත් තිබ්බේ ඒ කාලේ. ව්‍යාවසායකයෙක් කියන්නේ සමාජෙට අත්‍යවශ්‍ය දේවල් දෙන කෙනෙක්, මිනිස්සුන්ගේ ප්‍රශ්නෙකට විසඳුම් දෙන කෙනෙක්. මිනිස්සුන්ට අත්‍යවශ්‍යම දෙයක් නිෂ්පාදනය කරනවා නම් කවදාවත් ඒ ව්‍යාපාරය වැටෙන්නේ නැහැ. ඉතින් මිනිස්සුන්ට විකුණන්න ඕනේ මොනවද කියන එක මම සෑහෙන කල්පනා කළා. කුළුබඩු අදහස මගේ ඔළුවට ආවේ එතකොටයි."**

ඉස්තරම් කුළුබඩුවලට අතීතේ ඉඳලම අපි ලෝක ප්‍රසිද්ධයිනේ. ඉස්සර ආසියාකරේ වෙළඳ මාර්ග බොහෝමයක් ලංකාව හරහා වැටිලා තිබුණාලුනේ. ඔය පාරවල් හැදිලා තියෙන්නේ කුළුබඩු හොයාගෙන මෙහෙ ආපු විදේශිකයෝ නිසා කියලයි කියන්නේ. ඔය අතරිනුත් හොඳම කුළුබඩු තිබිලා තියෙන්නේ මාතලේ පැත්තෙ.

**"අදටත් මාතලේ කුළුබඩුවලට ප්‍රසිද්ධයි. එහෙ ඉපදුණු මටත් කුළුබඩු හොඳට හුරුයි. අනික මොන ප්‍රශ්න තිබුණත් මිනිස්සු ගෙදර උයාගෙන කන කුළුබඩු ටික නොගෙන ඉන්නේ නැහැනේ."**

සන්තුෂි මුලින්ම ව්‍යාපාරය පටන් අරන් තියෙන්නේ ලක්ෂ දෙකකින්.

"මුලින්ම මාතලේ වතුවලට ගිහින් සැපයුම්කරුවන් කිහිපදෙනෙක් තෝරගෙන ඒ අයගෙන් හොඳම කුළුබඩු ගත්තා.

කුළුබඩු අඹරන මැෂින් එකක් එහෙමත් අරන් ගෙදර තියාගෙන කුළුබඩු පැකට් හැදුවා. හැම එකෙන්ම පැකට් 50 ගානේ හදලා ගුඩ් මාර්කට් එකට දැම්මා. Organic (කාබනික), නැචුරල් කියන කාණ්ඩ දෙකේම කුළුබඩු තියෙනවා."

ගුඩ් මාර්කට් එකට නිෂ්පාදන දලා කීපදිනකින්ම රට ලොක්ඩවුන් වුණාලු. ෆේස්බුක් හරහා ව්‍යාපාරය කරන්න අරන් තියෙන්නේ ඊටපස්සේ.

**"ෆේස්බුක් පේජ් එකක් හදලා නිෂ්පාදන ටික අලෙවියට දැම්මා. හිතුවට වඩා හොඳ ඉල්ලුමක් එතැනින් හැදුණා. ඇත්තටම ෆේස්බුක් කියන්නේ ව්‍යාපාරයක් කරන්න හොඳ වේදිකාවක්."**

අරුමෝසම් තාලෙට ඇහැ ඇදිලා යන විදියට අසුරාපු කුළුබඩු බෝතල්, පැකට් දැක්කහම ගන්න නොහිතෙන්නේ කාටද කියලයි ඔය අතරෙ මට හිතුණේ.

"නිෂ්පාදනයක් කරද්දි 'බ්‍රෑන්ඩින්' කියන දේ ගැනත් හොඳට හිතන්න ඕනේ. ගැළපෙන නමක් දන එක, දැක්ක හැටියේ ගන්න හිතෙන විදියට නිෂ්පාදනය අසුරන එක ඉල්ලුම වැඩිවෙන්න හේතු වෙනවා."

අද වෙනකොට ඇය නමක් හදගත්තු සාර්ථක ව්‍යවසායිකාවක්. සාර්ථකත්වය දක්වා ආපු ඒ ගමනෙදි ඇයට ආපු අභියෝග මොනවද කියන එකයි ඊගාවට අපි ඇහෙන් ඇහුවේ.

**ව්‍යාපාරයක් කරන එක ලේසි නැහැ. මහන්සියි. හැබැයි තමන්ගේම ව්‍යාපාරයක් දියුණු වෙනකොට ලැබෙන සතුට ඒ මහන්සියට වඩා වැඩියි**

"ව්‍යාපාරයක් කළත් රැකියාවක් කළත් පිරිමි කෙනෙක්ට සාපේක්ෂව කාන්තාවකට එන අභියෝග වැඩියි. මොකද කාන්තාවක් මව, ගෘහිණිය යන භූමිකා ගැන හිතන්නත් ඕනනේ. කාලය කළමනාකරණය කරගන්න එක තමයි මට තියෙන ලොකුම අභියෝගය.

බිස්නස් එක පටන්ගත්තු මුල් කාලේ කුළුබඩු සෝදලා, වේලලා, අඹරලා, පැකට් කරනතාක් සේරම කළේ තනියම. දැන් ඒ වැඩවලට උදව්වට දෙන්නෙක් ඉන්නවා. පස්සේ හදගත්තු කුළුබඩු වාහනේ දාගෙන කඩවල්වලට අරගෙන යන්න ඕනේ. මගේ සැමියා ගුවන්යානා ඉංජිනේරුවෙක්. ඉතින් ඔහුත් ගොඩක් කාර්යබහුල කෙනෙක්. පුළුවන් හැමවෙලාවෙම ඔහු මාත් එක්ක එනවා. නැත්තම් මම තනියම තමයි යන්නේ. සමහර කඩවලින් ප්‍රඩක්ට්ස් ගන්න බැහැ කියපු වෙලාවලුත් තිබ්බා.

හැම සෙනසුරාදම කොළඹ ගුඩ්මාර්කට් එකේ කුළුබඩු සේල් කරනවා. ඒ වැඩත් තනියමයි කරන්නේ. ගුඩ්මාර්කට් එකෙන් මට සම්බන්ධතා ගොඩක් හැදුනා. ඒ හරහා මම දැන් කැනඩාව, එංගලන්තය, ඇමරිකාව වගේ රටවලට කුළුබඩු අපනයනය කරනවා. ව්‍යාපාරයක් කරන එක ලේසි නැහැ. මහන්සියි. හැබැයි තමන්ගේම ව්‍යාපාරයක් දියුණු වෙනකොට ලැබෙන සතුට ඒ මහන්සියට වඩා වැඩියි."

කුළුබඩු ව්‍යාපාර පටන්ගන්න බහුතරයක් දෙනා පටන්ගන්න පමාවට බිස්නස් එක නතර කරනවා. ඒ ගැන සන්තුෂි කිව්වේ මෙහෙම කතාවක්.

**"හිතාගන්නත් බැරි අඩු මුදලට කුළුබඩු අලෙවි කරන අය ඉන්නවා. කුළුබඩුවල මිල ගණන් එක්ක ඒ ගණන්වලට දෙන්න බැහැ කියන එක මම පෞද්ගලිකව දන්නවා. කුළුබඩුවලට මොනවා හරි මිශ්‍ර කරලයි අඩු ගණන්වලට දෙන්නේ. ව්‍යාපාරයක් කරද්දි වුණත් අනුන්ට නැතත් තමන්ගේ හෘදසාක්ෂියට අවංක වෙන්න ඕනේ. එතකොට කවදාවත් වරදින්නේ නැහැ."**

ඇගේ දරුවන්ට පවා බය නැතිව ඇය දෙන්නේ ඇගේම නිෂ්පාදන බවයි ඈ කිව්වේ.

"ව්‍යාපාරයක් පටන් අරන් සාර්ථක කරගන්න ලොකු මුදලක් ඕනේ නැහැ. හැබැයි උත්සාහ කරන්නයි අවදානම් ගන්නයි බයවෙන්න එපා. ඒ වගේම වැඩක් පටන්ගත්තු හැටියේ ලාබ බලාපොරොත්තු වෙන්නත් එපා. ලාබෙට වඩා ව්‍යාපාරය ස්ථාවර කරගන්න එක ගැනයි හිතන්න ඕනේ."

දරුවෝ නිසා මුදල් හම්බකරන්න වෙලාව නැහැ කියලා මැසිවිලි නගන කාන්තාවන්ට සන්තුෂි හොඳ උදාහරණයක්.

**"හිතුවොත් කරන්න බැරි දෙයක් නැහැ. ගෙදර වැඩයි, දරුවන්ගේ වැඩයි කරන ගමන් බිස්නස් එකටත් මම වෙලාව හොයාගන්නවා. මට විතරක් නෙමෙයි ඕනම කාන්තාවකට එහෙම කරන්න පුළුවන්. අවුරුදු ගාණක් ගෙදර නිකන් ඉඳලා මේ බිස්නස් එක පටන්ගත්තහම දැනුණු තෘප්තිය වචනෙන් විස්තර කරන්න බැහැ. ඉතින් මම අනිත් අයටත් කියන්නේ ගෙදර නිකන් ඉන්න ගමන් පුංචිවට හරි දෙයක් පටන්ගන්න කියන එකයි."**

සන්තුෂි ඇගේ කතාව අවසාන කළේ එහෙම. මාතලේ කෙල්ලෝ ලස්සනයි කියලා කතාවට කියනවනේ. මාතලේ කෙල්ලෝ ලස්සනයි වගේම ධෛර්යවන්තයි කියන එකයි සන්තුෂි එක්ක කතා කළාට පස්සේ මට හිතුණේ.


■ සෙව්වන්දි හෙට්ටිආරච්චි
ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්
හැඩගැන්වීම - අරුණී සිල්වා
(අරුණී බ්‍රයිඩ්ල් සැලෝන් ඇන්ඩ් ඇකඩමි, මාලඹේ)

යන හිසකෙස් නවතා, වර්ධනය කර ගන්න...
REVITIZ

විද්‍යාත්මකව සකසන ලද රිවයිටිස්
• හිසකෙස් ගැලවී යාම වලකයි • හිසකෙස් වර්ධනය කරයි
• හිසකෙස් අග පැළීම වලකයි • හිසකෙස් ශක්තිමත් කරයි
• හිසකෙස් වලට මනා දිදුලන පෙනුමක් ලබාදෙයි
REVITIZ
හිසකෙස්, නිය හා සම සඳහා අත්‍යවශ්‍ය විටමින් හා ඛනිජ ලවණ වන සින්ක්, බයෝටින්, හෝස්ටේල් සාරය (සිලිකන්), කොපර්, විටමින් B3, B5, B6, විටමින් C හා යකඩ අඩංගු සුවිශේෂී HNS සංයුතියෙන් නිපදවා ඇති REVITIZ දිනපතා භාවිතයෙන් නීරෝගී, සවිමත්, දිගු කෙස් කළඹක, පැහැපත් සමක හා ශක්තිමත් නිය පෙළක සුන්දරත්වය ඔබටත් ලබාගත හැකිය.


කරලක් රු. 189.50/-
සියලුම සුපිරි වෙළෙඳසැල්, ෆාමසි හා ෆැන්සි වෙළෙඳසැල්වලින් ලබාගත හැකිය
MEGA We care
For Your Wellness
www.megawecare.lk
ගෙන්වා බෙදාහැරීම: ඒ. බෝර් සහ පුද්ගලික සමාගම
Revitiz Srilanka
077 34 100 71 | 011 43 66 609

# මම දෙවියන්ගෙන් මේතාක් කාලෙකට මුකුත් ඉල්ලලා නැහැ



## ඒ වසරයි

බියංකා නානායක්කාර ලියයි

**107 කොටස**

අංජනා ප්‍රවෘත්තිවලට ඇසුණ දේ කීවා මිස ඊට ඔහුගෙන් උත්තරයක් බලාපොරොත්තු වූයේ නැත. ඒ නිසා ඇයම ඒ කතාව වෙනතකට මාරු කළාය. ඒ නිසා තේනුක තෙන්නකෝන්ගේ පපුවට අලුත් හුස්මක් වැටුණේය. ඔහුට එක හිතකින් සැනසිල්ලේ ගෙදරට එන්නට පුළුවන් වුණත් විටින් විට ටොෂිකෝ මතකයට එන එකනම් සිදුවුණේය. ඒ නිසා නිවසට ආ සැනින් අංජනා හා වචනයක් දෙකක් කතා කළ ඔහු දේවාන්ට ඇමතුමක් ගත්තේය.

"කියන්න තරම් ලොකු වෙනසක් නෑ කියලා දැන් පොඩ්ඩකට කලිනුත් ටොෂීගෙ අක්කා කිව්වා. ඒත් ඩොක්ටර්ස්ලා කිව්වලු එයාට වෙලා තියෙන ඩැමේජ් එක ලොකු නැති නිසා බලාපොරොත්තු තියාගන්න පුළුවන් කියලා..."

"අපිට මොනවද දේවා කරන්න පුළුවන්..?"

තේනුක ඇසුවේ හදවතින්මය. සැබෑවටම ඇය සිටියේ ළඟක වූවා නම් මේ වෙද්දී තේනුක සිටින්නේ එතැනය.

"දෙස්තරලා බේත් කරනවා. දන්නවනේ ඉතින් මෙහෙ ආයෙ ඒවා සුපිරිනෙ. අපිට තියෙන්නේ එයා වෙනුවෙන් ප්‍රේ කරන්න තමයි..."

ඒ මොහොතේ තේනුක සිටියේ අංජනා සිටි සඳැල්ලේමය. අංජනා ඇල්ලේපොල සිටියේ ඔහුට වඩාත් ළංවය. දුරකතන ඇමතුම ඕනෑකමින් අසා නොසිටියත් අනෙක් පසින් කියන දේ ද ඇයට ඇසුණේය.

"මං දෙවියන්ගෙන් මේතාක් කාලෙකට මොකුත් ඉල්ලලා නෑ "

තේනුක කීවේ සන්සුන් හඬිනි.

"ඒක හොඳයි. එහෙනම් පළවැනි වතාවට ටොෂීට ජීවිතේ ඉල්ලමු..."

දේවාන් කියනු ඇසුණි.

"අදහන දෙවියෙක් ඉන්නව නම් පඬුරක් අයින් කරන්න. අපේ අම්මා ඉස්සර එහෙම කරනවා මං දැකලා තියෙනවා. මොනවා වුණත් ටොෂී හොඳ කෙල්ල. ඊයෙ පෙරේදා අන්තිමට හම්බවුණ වෙලෙත් උඹව මතක් කළා මචං උඹ වෙඩින් එක කිව්වොත් එනවා කියලත් කිව්වා ලංකාවට. හරි ආසයි කිව්වා උඹ මනමාලයෙක් වෙලා ඉන්නව දකින්න..."

"උඹ දැන්ද දේවා මට ඕවා කියන්නේ? ඇයි මීට කලින් නොකිව්වේ? අඩුතරමේ ඒ කෙල්ල හොඳින් ඉන්න දවස්වල කතා කරන්න හරි තිබ්බා "

තේනුක තෙන්නකෝන්ගේ හඬේ වූයේ පසුතැවිල්ලකි. එය දේවාන්ට පමණක් නොව අංජනාටද දැනුණේය. ටොෂිකෝ ලංකාවට ආ මොහොතේ හමුවන්නට නොගියත් ඇය ගැන වරදක් හිතේ තිබුණේ නැත. මේ කියන විදියට ඇය සිටින්නේ කරදරයක කියා අංජනාට තේරුණි. තේනුක තෙන්නකෝන්ගේ කතාව කියන්නේ ඔහු කවදාවත් කිසිම දෙයක් ගැන දෙවියන්ගේ පිහිට නොඉල්ලූ බවකි. ඔහු වෙනුවෙන් මේ මොහොතේ කළ හැකි හොඳම දේ මොකද්දැයි අංජනා සිතමින් සිටියදී තේනුක තෙන්නකෝන් ඇමතුම අවසන් කර දුරකතනය සාක්කුවේ දමාගත්තේය.

මද ලෙස තිබූ අඳුර එක්වරම තද කළුවරක් වී තිබුණි. අංජනා බලාසිටියේ ඈත අහස දෙසය. අඩහඳට දුරින් දීප්තියෙන් අඩු තාරකාවක් පායා තිබෙනු ඈ ඇස ගැටුණේය. ඔහුගේ දෑත් දෙවුරට බරවෙනු දැනෙද්දී අංජනා ආපිට හැරී තේනුක තෙන්නකෝන්ගේ මුහුණ දෙස බැලුවාය. අනතුරුව ඔහුගේ බඳ වටා අතක් දමා තවත් ඔහුට ළංවුණාය.

"ඔයාගේ යාළුවට මොකද?"

ඇය එය ඇසුවේ සැබෑම ආදරණීයවය.

"ටොෂිකෝගේ වාහනේ ප්‍රපාතයකට පෙරළිලා. එයා අයිසීයූ කියලයි දේවාන් කිව්වේ "

"මට යාන්තම් ඇහුණා.. ඇහුණත් නෑහුණා වගේ ඉන්න මට මේ වෙලේ හිතුණෙ නෑ. ඔයා ගිහින් නාගෙන එන්න, මං නාලනෙ ඉන්නෙ. අපි දෙවියන්ගෙ බුදුන්ගෙ පිහිට ඉල්ලනවනම් හිතෙන් වගේම ගතිනුත් පිරිසිදු වෙලා ඉන්න ඕන. අපි කැලණි පන්සලට ගිහින් සමන් දෙවියන්ට භාරයක් ගැට ගහලා එමු. අපේ ගෙදර ඔය පුරුද්ද තියෙනවා. එහෙ ඉස්සර ගුරුනිවාසෙ පැත්තක අප්පච්චි පහන් කණුවක් හදලා තිබ්බා. අපි එයාටයි ඔයාගෙ අප්පච්චිටයි දෙන්නටම පඬුරු දෙකක් ගැට ගහලා එමු..."

තේනුක තෙන්නකෝන්ගේ හිතට යාන්තම් සැනසිල්ලක් සේ දැනුණි. ඔහු අංජනා කී දෙය අසා කෙළින්ම ගියේ නානකාමරයටය.

ඔවුන් යනවිටත් කැලණි පන්සලේ සෙනඟය. එය තේනුකට අමුත්තක් සේ හැඟුණත් ඒ බව අංජනා නම් දන්නේය. ස්නේහා සහ පියුමිකා සමඟ ඉස්සර සන්ධ්‍යාවේ දෙතුන් වරක් පන්සල් වත් සමහරදාට හය හත වනතුරු හිඳ ගිය දවස් තිබුණි.

නොකීවාට තේනුකගේ හිතට පන්සල් බිමේදී දැනුණේ පහදා දිය නොහැකි සැනසීමකි. මොහොතකට ජීවිතේ සියලු දේ අමතක වී බෝ කොළ සිලි සිලිය විතරක් හිතේ රැඳුණේය.

"ඔයා කවදාවත් කෙනෙකුට වැරැද්දක් කරන්නෙ නැති කෙනෙක්නේ... යාළුවයි, අප්පච්චියි දෙන්නම ඔයාගෙ හින්දා මේ පඬුරු දෙකම ඒ ගොල්ලන්ට ආරක්ෂාව, නිරෝගී සුව ප්‍රාර්ථනා කරලා පඬුරු ගහේ බඳින්න "

මල් පහන් පුදා පන්සලේ වූ සමන් දේවාලය වෙත තේනුක කැටුව ගිය අංජනා සුදු රෙදි කෑලි දෙකත් කහ දියරෙන් හේදූ කාසි දෙකත් ඔහුට දී කීවාය. අප්පච්චිට දෙවියන්ගෙන් පිහිට ඉල්ලන්න තරම් රෝගී තත්ත්වයක් නොවූයෙන් ඔහු ඉල්ලා සිටියේ ටොෂිකෝට ජීවිතයයි.

"මිනිස්සු අසරණ වෙද්දි අන්තිමේ නොපෙනෙන දෙවියන්ගේ පිහිට ඉල්ලන්නෙ ඇයි කියලා අද මට තේරුණා."

ආපසු එන ගමනේදී තේනුක අංජනා හා කීවේ ඇත්තටමය.

"ඒක මනුෂ්‍ය ස්වභාවය. හැබැයි මමත් එහෙම වුණාට මං දන්නවා ඒ ඉල්ලා සිටීමේ යට තියෙන්නේ හිතේ විශ්වාසය කියලා."

තේනුක කිසිවක් නොකියා ඇගේ දකුණත නිදහස් වම් අතින් අල්ලා ගත්තේය.

"මේ මොහොතේ මාව තේරුම්ගත්තට ඔයාට පින් නෝනා. හැමදාම ඔයා එහෙම වෙන්න. ඒක තමයි හයිය කියන්නේ."

අංජනා ඊට කිසිවක්ම නොකියා ඔහුගේ බාහුවට කම්මුලක් තද කළාය.

"අපිට එළියෙන් කාලා යන්න තිබ්බා. කමල් කෑම හදලා ඇති දැන් නම් "

අංජනා හදන්නට සූදානම් කර තිබූ නූඩ්ල්ස් එක කමල් හදන්නට බාරගත්තේ කලින්මය.

"වෙන දවසක එමු."

"මට ඔයත් එක්ක කතා කරන්නවත් වෙලාවක් නෑ නෝනා.. අපි මේ දිවිල්ලක් දුවන්නේ "

"අපි ලබන සතියෙ ගෙදර යනවානේ. එතකොට කතා කරමු..."

"ඔයාට කියන්න ගොඩක් දේවල් තියෙනවා."

"එච්චර මොනවද?"

"කවදාවත් නාහන, මමත් නොකිව්ව අපේ පවුලේ විස්තර කොහොමත් මං කිව්වෙ අපේ අම්මට මං දනෙ ගෙදර එන්න කිව්වා. ඒ ආවම ඔක්කොම දැනගන්න පුළුවන් "

"එච්චර මොනවද දැනගන්න තියෙන්නෙ..?"

අංජනා ඇසුවේ ඇත්තටමය.

"ඔයා මං කවුද කියලවත් දන්නෙ නෑනේ "

"ඒ කිව්වේ..? දැන් නම් මට බයත් හිතෙනවා ඔයත් අර කතන්දරවල ඉන්න රාජ කුමාරයෙක් වගේද කියලා."

අංජනා එසේ කියා සිනාසුණත් තේනුක නම් හිත ඇතුළෙන් දැවුණේය. ඒ ඇත්ත දැනගත් දට ඇගේ ප්‍රතිචාරය කුමක් වේ දැයි සිතාය.

ලබන සතියට

**හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදීම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.**

# ඇඹරැල්ලා ව්‍යංජනය කප්පාදු කළාම දියවන්නාවෙ උත්තමයන්ගෙ හිත් රිදිලලු



**සීතා පොන්නම්පෙරුම**
**ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා**

ගම්පහ පැත්තේ 'ඇඹරළුව' කියලා ගමක් ගැන අහලා ඇති. ඔය ගම්පළාතේ හැමතැනම බොහොම සරුවට ගෙඩි පලදෙන මහා රූක්ෂ ගස් වර්ගයක් වැවිලා තිබුණාලු. ගම්පළාතේ නම ඇඹරළුව නිසා ඒ ගමේ අය මේ ගෙඩිවලට කිව්වේ 'ඇඹරැලු' කියලලු. කාලයත් එක්ක ව්‍යවහාරයේදී මේ ගෙඩිවලට ඇඹරැල්ලා කියන නම වැටිලා.

ඔව්... හිතුවා හරි. අද කියලා දෙන්න හදන්නේ ඇඹරැල්ලාවලින් කරන වැඩක් ගැන තමයි. ඇඹරැල්ලා කිව් හැටියේ සමහරුන්ගේ කටවල් ඇඹුල් වෙලා කෙළ උනනවා. හැබැයි ඇඹරැල්ලාවල තරම නොදන්න අයත් නැතුව නෙමෙයි.

"දරුවන්ට පිටරටින් ගෙන්නන ඇපල්, දෙඩම්, මිදි කවන්න අපේ අම්මලා සෑහෙන උනන්දුයි. හැබැයි ගහක් යට වැටිච්ච් ඉදුණු ඇඹරැල්ලා ගෙඩියක් කන්න කියලා අම්මලා කවදාවත් දරුවන්ට කියන්නේ නෑ."

මෑතකදී බලපු රූපවාහිනී සාකච්ඡාවකදී වෙද මහත්තයෙක් ඔය කතාව කිව්වේ මූණ නාළු කරගෙන. ඖෂධීය ගුණ තියෙන දේශීය පලතුරු ගස් යට වැටි වැටී යන එක මහා නස්පැත්තියක් කියලයි ඒ මහත්තයා කිව්වේ.

ලෝකේ පරණම ආයුර්වේද පොත විදියට හඳුන්වන චරක සංහිතාවේ පවා ඇඹරැල්ලා ගැන ගුණ සඳහන්. වාත, පිත, සෙම තුන්දෙස් කප කොරන්ට මේ ගසේ ගෙඩි, මුල්, කොළ වගේම පොතුත් යොදාගන්නවලු.

වෛද්‍ය ග්‍රන්ථවල ඇඹරැල්ලා හඳුන්වන්නේ 'අද්වභෝගය' නමින්. 'පයින් ගමන් කරන්නාගේ ආහාරය' කියන එකයි ඒකේ තේරුම. කකුල් ඉදිමීම, කකුල් රුදාව වගේ දේවල් සමනය කරන්න පුළුවන් ගුණයක් ඇඹරැල්ලාවල තියෙනවලු. ඒ නිසා ඉස්සර මිනිස්සු පයින් දුර ගමන් යද්දි ඇඹරැල්ලා ගෙඩියක් හප හපා යනවලු.

ඒ විතරක්යෑ ශරීරයේ විස නසන්නත් ඇඹරැල්ලාවලට පුළුවන්ලු. ඉතින් රජ සෙබළුන්ට ඊතල ඇනුනහම විස අද්දන්න තුවාලවලට ඇඹරැල්ලා ගෙඩි බඳිනවලු. කැල්සියම්, පොස්පරස්, විටමින් බහුල නිසා අස්ථිවලට වගේම දත්වලටත් ඇඹරැල්ලා ගුණයි.

පලතුරක් විදියට කන්න අකමැති වුණාට අමු ඇඹරැල්ලා අච්චාරුවටයි, ව්‍යාංජනේටයි, චට්නිවලටයි අකමැති අය නැහැ. ඉස්සර ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ගේ රජ කෑමපතටත් ඇඹරැල්ලා වරදින්නේ නැතිලු. ඒ විතරක් නෙමෙයි පාර්ලිමේන්තුවේ ඉන්න අපේ මහත්තුරුන්ටත් ඉස්සර දිනපතාම ඇඹරැල්ලා ව්‍යාංජනයක් දුන්නලු. මීට මාස හතරකට විතර උඩදි පාර්ලිමේන්තු ආහාර කප්පාදුවේදි ඇඹරැල්ලා ව්‍යාංජනය කප්පාදු කළා කියලා ගොඩක් අයගේ හිත් රිදිලා තිබුණාලු. ඒ හිත් කොහොම රිදුනත් තමන්ට කරන්න පුළුවන් දෙයක් පුංචිවට හරි පටන්ගත්තොත් හිත් නොරිදෙන විදියට මේ ආර්ථිකේට මූණදෙන්න පුළුවන් කියන එකයි අපි නිතරම කියන්නේ.

## හිත් නොරිදෙන්න ඇඹරැල්ලා චට්නි හදමු

අද අපි හදන්නේ ඇඹරැල්ලා චට්නි. දේශීය වෙළඳපොළේ වගේම විදේශීය වෙළඳපොළේත් හොඳ ඉල්ලුමක් තියෙන ආහාරයක්.

මුලින්ම අපි ඇඹරැල්ලා 500gකින් වැඩේ පටන්ගමු. ඇඹරැල්ලා ගන්නකොට බට් ඇඹරැල්ලා නැතිව සාමාන්‍ය ඇඹරැල්ලා ගන්න. ඇඹරැල්ලා ගස් පිටින් බදු දෙන උදවිය ඉන්නවා. එහෙම තැනකින් ගන්නවා නම් නැවුම් ඇඹරැල්ලා අඩු සාධාරණ මුදලකට ගන්න පුළුවන්. ඇඹරැල්ලාවලට අමතරව සීනි 300g, තලාගත්තු ඉඟුරු කැල්ලක්, සුදුලූනු බික් 4ක්, කොටාගත්තු කුරුඳු, කරාබුනැටි, කරදමුංගු තේ හැන්දක් වෙන්න, විනාකිරි 150ml, බැදගත්තු මිරිස් කුඩු තේ හැඳි 4ක්, මිරිස් කුඩු තේ හැඳි 3ක්, රස පදමට ලුණුයි සපයාගන්න.







### පියවර 1

මුලින්ම ඇඹරැල්ලාවල පොතුයි, ඇටයි අයින් කරලා සෝදන්න. තරමක කෑලිවලට කපන්න.



### පියවර 2

මැටි ඇතිලියක් ලිපේ තියලා ඒකට සීනි දාන්න. සීනි වැහෙන මට්ටමට වතුර දාලා සීනි ටික උණු කරන්න. සීනි උණු වෙනකොට ඉඟුරු, සුදුලූනු, කුරුඳු පොතු, කරදමුංගු, කරාබුනැටි දාගන්න. විනාඩියකින් විනාකිරිත් දාගන්න.

### පියවර 3

දැන් කපාගත්තු ඇඹරැල්ලා ටික එකතු කරලා ඇඹරැල්ලා තැම්බෙනකල් වහලා තියන්න. ඇඹරැල්ලා තැම්බෙනකොට පාට වෙනස් වෙනවා.

මේකට බැදගත්තු මිරිස් කුඩුයි, අමු මිරිස් කුඩුයි දාලා මද ගින්දරේ තැම්බෙන්න තියන්න. මිශ්‍රණය ඝන වෙනකල් සැරෙන් සැරේ හැඳිගාන්න. පදමට ආවට පස්සේ උණුවෙන්ම ජීවානුහරණය කළ බෝතල්වලට දාගන්න.

චට්නි 100gක් රුපියල් 200-300 වගේ මිලකට අලෙවි කරන්න පුළුවන්. වැඩි විස්තර දැනගන්න 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

ධරණී

**ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්**

අංක 91, විජේරාම මාවත,
කොළඹ 07.
දුරකථන 0115 200 900
බෙදාහැරීමේ අංශය 0112 127204
දැන්වීම් අංශය 0112672801 0112672603
ෆැක්ස් 0112 673 451



ධරණී
**පුවත් පත**
**නිවසටම ගෙන්වාගන්න අමතන්න**
**076 1367 623**





**අපේ පුංචි නංගිලා මල්ලිලාට දැන්**
**පෙර පාසලේ පටන් ශිෂ්‍යත්වය දක්වාම**
**හරිම පිළිවෙළට ඉගෙන ගන්න**
**මාසික අධ්‍යාපනික පුවත්පත්**

**6ක්**

අත්පොත් තබන පෙරපාසල් නංගිලා මල්ලිලාට

සිංහල ගණිතය පරිසරය ඉංග්‍රීසි දෙමළ පාඩම් සමඟින්

**පාඩම් සඳහා මාර්ගෝපදේශ**
**නිර්දේශිත පිංතූර පොත්**
**දරුවන්ගේ නිපුණතා වර්ධනය පෙන්වයි**

අකුරු කරන්නට අලුතින්ම පාසලට පිය නැගූ පුංචි නංගිලා මල්ලිලාට

**පෙබරවාරි කලාපයන් දැන් වෙළෙඳපොළේ**

වැඩිම අනුමාන ගැටලු ලබාදුන් ප්‍රශ්න පත්‍ර පෙළ මෙවරත්

විශේෂ ඇණවුම් සඳහා විමසන්න 076 2568348



**දිවයින පුරා පුවත්පත් නියෝජිතයින්ගෙන් , සරසවි පොත්හල් සහ අනෙකුත් පොත්හල්වලින් මිලදී ගතහැක**



# ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2023/2024 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

**ක්ෂණික ඇමතුම් -0777 444908**

**බිංගිරියේ ගුරු හාමුදුරුවෝ**
**සමග සේන මහතා 037 22 48 828**
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

**හමුවීම**
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස
- 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වැවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැඟ හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් විසඳුම්
0094 37 22 48828



දැන්වීම් සඳහා අමතන්න
**0112 672 601**
**0112 672 603**



**අඩු මිලට බෙඩ්ෂීට්**

රටින් ගෙන්වන ලද ඩිසයින් 50කින් යුත් අලුත් සින්ගල් ඩබල් බෙඩ්ෂීට් මිල 490/- සිට ට්‍රිපල් බෙඩ්ෂීට් 790/- සිට තවත් බෙඩ්ෂීට් වර්ග 70ක් කොට්ට 690/- සිට ඉන්දියන් නයිටි 630/- සිට තුවා 290/- සිට 1800/- දක්වා තොගමිලට අපෙන් ලබාගත හැක

**සැම්ර්චිටා ක්ලොතින්** | 0117902278
ගුරුගේ නේචර් පාර්ක් අසල, ජා-ඇල | 0771964341



**උත්සව සාරි නිර්මාණ පාඨමාලාව**

කාලය මාස 02

ආරම්භය: 2023/02/06 දින සිට බදාදා ගැනේ.

ස්ථානය:
කොන්ගස්දෙනිය - නිට්ටඹුව

විමසීම්: 071 523 57 49



**පාවහන් සැපයුම්කරුවන් අවශ්‍යයි**

අප ලබාදෙන සාම්පලයට අනුව කුඩා ළමුන් සඳහා පාවහන් සපයන සැපයුම්කරුවන් අවශ්‍යයි.

විමසන්න: 077 7769034, 077 7066459



**සුපිරි මී පැණි**
වද පිටින්ම
ඇඟ කෙට්ටු වීමට
බෙහෙත්, සපා,
ෆේෂල්,
රූපලාවණ්‍යාගාර
කටයුතු සඳහා
තොග.
අමතන්න
**072 810 0100**



**ගම්පහ**
පිහිටි
රූපලාවණ්‍යාගාරයක්
සඳහා දක්ෂ
පළපුරුදු
සේවක/සේවිකාවන්
අවශ්‍යයි.
**076 1045 412**



සින්න වෙන්න දෙන්න **එපා**
ඔබේ උගස් තැබූ සින්න වීමට යන **රන් භාණ්ඩ**
බේරාදී වැඩි මිලකට මිලදී ගනු ලැබේ.
076 72 82 082 | 072 92 82 085
SL PROMO



**උගස් තැබූ රත්තරං**
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ
බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
**076 101 88 53**
SL PROMO



**සුදු කබර / පොතු කබර**
**විශේෂ ප්‍රතිකාර**

**චර්ම රෝග විශේෂ වෛද්‍යවරයෙක් විසින්**

**සහන වැනල් සෙන්ටර්**
68, පේරාදෙණිය පාර, මහනුවර, (වෙබ්ලි සිනමා අසල)
හමුවීම ඉරිදා 8.00 සිට 10.00 දක්වා
විමසීම්: 0777 488932, 0718202297, 0727900990
ශාඛාවන් :- හෝමාගම / මීගමුව
පළමු දින පැමිණ සුව වූ රෝගීන්ගෙන් විමසා බලා ප්‍රතිකාර ලබා ගන්න



**දිවයින පුරා නිවෙස් වල නැවතී වැඩ කිරීමට කැමති ගෘහසේවිකාවන් අවශ්‍යයි.**

ඉවුම් පිහුම්, පිරිසිදු කිරීම්,
දරුවන් බලාගැනීමට හා මහළු
හෝ රෝගී වූ අය බලාගැනීමට
කැමති අය අමතන්න.



වැටුප රුපියල්
35,000 - 40,000

ආහාර ඇතුළු සියලු පහසුකම් නොමිලේ

**072 945 9247**



A/L සහ O/L විභාගය අවසන් කල ඔබට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අනුමැතිය ඇති අප ආයතනය මගින් පිලිගත් සහතිකපත්‍ර පාඨමාලා රැසක්

පාඨමාලා ගාස්තු Rs.25,000/- කාලසීමාව - මාස 03
NVQ LEVEL 03- Certificate in Computer Applications Assistant

පාඨමාලා ගාස්තු Rs.35,000/- කාලසීමාව - මාස 06
NVQ LEVEL 04- Information Communication Technology Technician

Care Giver (සාත්තු සේවක/සේවිකා) NVQ 03
පාඨමාලා ගාස්තු Rs.50,000/-
කාලසීමාව දින 45

දැන්ම ලියාපදිංචි වන්න.

වැඩි විස්තර සඳහා **0714 200 200**

No.117/2/1 High Level Road Maharagama
ඔබගේ අයදුම්පත අදම අප වෙත යොමු කරන්න.
asianlanka070@gmail.com
Whatsapp: 0712 200 200

# වැලන්ටයින් එකට එයාව සප්‍රයිස් කරන්න අපෙන් FREE TICKETS




මෙදා සැරේ වැලන්ටයින් එකට තියෙන්නෙ තවත් දවස් කීපයයි. ඒ වෙනුවෙන් 'US ENTERTAINMENT' විසින් ආදරවන්තයින්ටම වෙන්වුණු 'ONE LOVE' නමින් දැවැන්ත ප්‍රාසාංගික අත්දැකීමක් සූදානම් කරලයි තියෙන්නේ. ඒ 2023 පෙබරවාරි 14 වැනිදා වැලන්ටයින් දවසේ කොළඹ විහාරමහාදේවි උද්‍යානයේදී. එදට හවස 4.00 ඉඳන් 'DOCTOR' සහ 'WAREHOUSE PROJECT' සංගීතයට භාතිය-සන්තුෂ්, සඳුන් පෙරේරා, නිලාන් හෙට්ටිආරච්චි, ෆැලන් ඇන්ඩ්‍රියා, ටෂ්නි පෙරේරා, දිමංක වෙල්ලාලගේ, දිනේෂ් තරංග ඇතුළු තාරුණ්‍යයේ ආදරණීය ගායන තරු රැසක්ම ඔබ වෙනුවෙන් ගී ගයන්න ලෑස්තියි.

'ධරණී' කියවන පාඨක ඔබ අතරින් ආදරණීය යුවළ විසිපහකටත් මේ ප්‍රසංගයට නොමිලේම සහභාගී වෙන්න අවස්ථාවක් තියෙනවා. ඒ වෙනුවෙන් කරන්න තියෙන්නේ මේ එක්ක පළවෙන කූපනය නිවැරදිව පුරවලා හැකි ඉක්මණින් පොටෝ එකක් ගහලා 0762568348 යන අංකයට වට්ස් ඇප් හරහා අපට එවන එක. ඒ අතරින් තෝරාගන්න යුවළ විසිපහටම 'ONE LOVE' ප්‍රසංගයට එන්න ටිකට් දෙන්න 'ධරණී' අපි ලෑස්තියි. ඉතින් ඉක්මන් කරලා වැඩි වැඩියෙන් කූපන් පුරවලා එවලා මේ ආදරණීය අවස්ථාව ඔබේ කරගන්න.

වැඩි විස්තර සඳහා කතා කරන්න 0762568348

නම........................................................................

........................................................................

ලිපිනය....................................................................

........................................................................

........................................................................

දුරකථන අංකය.........................................................

හැඳුනුම්පත් අංකය...................................................

# කවි යාය

## ඉපනැලි සුවඳ

කිචි බිචි නාද පතුරයි සියොතුන් රැන
සිසිලැති සුළං රැලි ඇත අප වෙත ගේන
ඇතින් කඳු වළලු වෙයි මදහස පාන
සුපුරුදු පරිදි ගන්නෙමි සුරතට පෑන

දිස්වෙයි ගොයම් නිල් පාටින් දිලෙන හැටී
තිස්සෙම දැනෙයි එහි ලස්සන සිතෙහි ගැටී
ලස්සන වී කරල් නාඹර වයසෙ පැටී
දිස්වෙන විටදි මට මුළු ලෝකයම වටී

සරුවට වැඩුන වී අස්වනු නෙළා ගෙන
ගොවියා සතුටු වෙයි හදවත පිනා යන
එම අස්වැන්න අපෙ බඩගිනි නිවා මින
ඉපනැලි සුවඳ එයි නැහැපුඩු වෙළා ගෙන

**සීතා රත්නායක**
**ඉහළ බෙලිගල්ල බෙලිඅත්ත**

## කිරි සිහිනය

නින්දත් නොනින්දත් අතරේ සිටින විට
යන්තම් මැවි මැවී පෙනුණා සිනා කට
සුරතල් වදන් පාමින් අමතනා විට
ලෝකෙම මතක නැති වී යාවිදෝ මට

හඬනා විටදි කිරි පොඩියක් පොවන්නට
නාවා, කවා, නැලවිලි ගී ගයන්නට
නිදිගත් පැයේ හුරතල් මුව සිඹින්නට
ආසයි උණුහුමේ ගුලිකර තියන්නට

ලස්සන කමිස පොඩියයි කලිසමයි හැඳ
දුවපැන ගෙමිදුලේ සෙල්ලම් කරනවද
බෝලය පිත්ත ගෙන දස්කම් පානවද
හිනැහී හිනැහී අපෙ දහය නිවනවද

අම්මා කියා සතපා පපුතුරේ හිස
නුඹ හිනැහෙද්දි පිරි ඉතිරී ගියා තොස
ලස්සන සිහිනයකි ගැස්සී ඇරුණි ඇස
මල් මදහසින් මම අතගා ගතිමි කුස

**දීපිකා ප්‍රියදර්ශනී ප්‍රනාන්දු**
**මොරටුව විල්ලෝරාවත්ත**

## නොලැබීම


විහඟ පැටියෙක් දවස තිස්සෙම
ගීත ගයනවා මගේ වත්තේ
නිහඬ වීලා නිවස අසලින්
ඉගිලිලා යන එකයි ඇත්තේ

මිහිරි වුවත්, ඒ සත්සර
හොඳටම ඇති, මං ඇසුවා
බිහිරි කරන් මගෙ දෙසවන්
හයියෙන් අත්පොඩි ගැසුවා

සර පුවරුව කුරුළු තුඩක
දෙසක් ලෙසට නොදකිමි මම
වරද මගේ අතද තිබේ
පැහැදිලි නැහැ මටම තවම

සැබෑවටම කොතැනක හෝ
වැරැද්දක් ලොව සිදුවෙලා ඇත
සොබාදහමේ සොඳුරු රස තැන්
විඳගන්න මිනිසට වෙලාවක් නැත

**ශ්‍රීමතී රෝහිණී පෙරේරා**
**කඩවත**



## මලක් වෙමි

මම සදහරිත
උයනේ
තුරු සිරසේ
අරුණෝදයේ
පිපුණු
නෙක නෙක
මල් අතර රුවට
හැඩට
සුවඳට පිපුණු
දකින
දසුනින් ප්‍රිය වූ
සොඳුරු
මලක් වෙමි
මම මියැසි කැලට
සුවඳ දිදී
ලොවට සුවඳ
බෙදන
නැවුම් පිවිතුරු

**එස්.එල්.ලියනගේ**
**ගාල්ල**

## ගම්බද සිරිය

වනරොද මැදින් සුදුවැලි පාරක් මත්තේ
මේ ගම්මානයට ඇවිදන් යා යුත්තේ
නළදිය විදුලියද මේ පැත්තට නැත්තේ
එනමුදු සුන්දරත්වය උපරිම ඇත්තේ

බැද්දෙන් එපිට මානෙන් හිරු නැගෙන විට
කුරුලන් අවදි වී කවි ගී ගයන කොට
සුළගේ නටන්නේ අතුකොළ තනුවකට
නතු වී ඇතිය ගම සොබදම් සෙනෙහසට

වෙල් යායක් තිබේ එය කරලින් බරය
කොළ පාගන්නෙ තාමත් අම්බරු රැලය
මහ රෑ යාමයේ ඇසෙතිය පැල් කවිය
මේ ගම්මානයට මේ කෝකත් හුරුය

නැතුවට වයින් ඉස්ටෝරුව උජාරුවේ
බානා තෙලිප්ජේන් රසමුසු වෙතිය දිවේ
දැකගන්නට පැෂන් නැතුවට දියුණු ලොවේ
මෙහි ඇති මිහිර කිසිවකටත් දෙවෙනි නොවේ

ඉඩ දී ගොම්මනට හිරු බැස සවස් කෙරේ
හඳ පායන්න ඉඩ දෙනවා හෙමින් සැරේ
ඇසෙනව බටනළාවක හඬ වරින් වරේ
නිසසල රැයක් සුන්දර අනුහසින් පිරේ

මඩ ගොවිතැන ලෙසින් ගොඩ ගොවි සරුය
ගම මැද ගලායන ඇළදිය පැහැදිලිය
හැම ගොවි ගෙදරකම වසනා සිරි කතය
ගම්මානය කුවේරගෙ උයනට සරිය

**කලාභූෂණ ගාමිණී ලිවේරා**
**මුන්දලම**

## තිරය පිටුපස

වේදිකාවේ රඟන හට තනා දෙන්නට අවැසි ඉඩකඩ
තිරය පිටුපස කරන රැගුමන් කිසිවෙකුට නෑ ඉඟිකළේ
අත්පොලසන් මැද ඔල්වරසන් මැද
තුටු කළ මහ සභා මැද රඟන උන් දුටු නමුත්
දුටුවාද වේදිකා තනපු උන්

උන් නැහැ දකින්නට උන් නැහැ හොයන්නට
නාටකය අවසන් වුණු තැන
පිරිස සතුටින් විසිර ගිය තැනයළිත් උන් සභා මැද
බිඳී ගිය කැඩී ගිය කිළිටි වූ තැන්පෙර ලෙසම සකසන්න

**ජානු**

කවි යාය

**ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.**

''කවි යාය''
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,විජේරාම
මාවත,කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.